සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2557ක් වූ බක් මස (ව්‍යවහාරික වර්ෂ 2014 අප්‍රේල්)


30 වෙනි කලාපය




## නූතන විද්‍යාවට වැරදුණු ජීවයේ සම්භවය සහ පරිණාමය දහම් ඇසින්...

රු. 20/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය



# සප්ත බල මහ සාගරේ







සප්ත බල මහ සාගරේ
මහා ජල කඳ පරදවා
ඔබේ ගුණ කඳ සිහිවුණේ
නිවන් දෙන දම් ඇසුණු මොහොතේ.....

මහා නිරයට යන්න සිටි ඒ
මිනීමරුවත් ගොඩ දමා
පාලු සොහොනේ මළ කඳක බැඳි
දුගී මිනිසත් සැනසුවා.....

යොදුන් ගණනක් උසින් සිටි ඒ
මහා බඹු සිරසත් නමා
ඔබේ සිරිපා වැඳ සිටින ලෙස
වැඳ සිටින්නද කෙලෙස මා.....

අනේ හිමි සම්බුදුනේ බෑ මට
එසේ බඹ අත්බැව් ලබා
ඔබේ දම් පද දෙක තුනත් මට
බඹ ලොවේ නැති සැප ගෙනේ.....

ගී පද රචනය : නීතිඥ චන්දන සිරිවර්ධන
තනු නිමැවුම සහ සංගීතය : නවරත්න ගමගේ
ගායනය : ටී. එම්. ජයරත්න

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

10 වන කොටස



මෙයින් කල්ප ලක්ෂයකට පෙර ලොව්තුරා පදුමුත්තර බුදුපියාණන් වහන්සේ ලොව පහල වෙලා හිටපු කාලයේ වෙච්ච සිදුවීමක් ගැන තමයි මේ විස්තර කරන්නෙ. ඒ කාලය වෙනකොට, මෙකල බුද්ධ සාසනයේ හෙවත් ගෞතම බුද්ධ සාසනයේ මහා නුවණැති භික්ෂුණීන් වහන්සේලාගෙන් අගතැන් පත් ඛේමා මහ රහත් තෙරණිය සිටු කුලයක කුමාරිකාවක් ලෙස ඉපදිලා හිටියා. ඒ වෙනකොට ඇය පදුමුත්තර බුදුපියාණන් වහන්සේගෙන් බණ අහල සාසනය කෙරෙහි පැහැදිලා හිටියෙ. ඉතින් මේ පැහැදීම කොච්චරද කියනව නම්, තමන්ගෙ මවුපියන් ළඟට ගිහින් ආයාචනා කරල, හත් දවසක් බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට මහ දන් දුන්නා. මේ හත් දවස අවසානයේ මේ සිටු කුමරිය විශේෂ සිද්ධියක් දැක්කා. ඒ තමයි පදුමුත්තර බුදුපියාණන් වහන්සේ එකල හිටපු රහත් තෙරණියකට, භික්ෂුණීන් වහන්සේලා අතරේ මහා නුවණැති කියන තනතුර පිරිනමන අවස්ථාව. හත් දවසක් දන් දීල, අවසානයේ මහත් සතුටින් හිටපු මොහොතක් තමයි ඒ. ඒ වගේම පෙර කරපු පින් ඇති මොහොතක්. ඉතින්, අනේ මටත් මේ වගේ තනතුරක් මතු බුද්ධ සාසනයක ලබන්න ඇත්නම් කියල ඇයටත් හිතුනා. ඊළඟට ඒ පැතුම පැතුවා. ඉතින් බුද්ධ දේශනාවට අනුව ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා හතරෙන් යුක්තව පින් කළ සතුටු සිත් ඇතිව පතන යහපත් පැතුමක් ඒකාන්තයෙන්ම ඉෂ්ඨ සිද්ධ වෙනවා. ඒ පැතුම පදුමුත්තර බුදුපියාණන් වහන්සේ අනුමත කරල, මෙයින් කල්ප ලක්ෂයකට පසු පහළ වෙන ගෞතම නම් බුදුන් වහන්සේ අභියස මැය මහ නුවණැති භික්ෂුණීන් වහන්සේලා අතර ඛේමා නමින් අග තැන්පත් වෙන බවට නියත විවරණ දුන්නා.

ඉතින් මේ අතර කාලයේ ඒ කරගත්තු මහා කුසල කර්මවල බලයෙන් ඇය නොයෙක් අත් බැව්වල අප්‍රමාණ සැප සම්පත් විඳල අවසානයේ ගෞතම බුදුන් වහන්සේගෙ කාලයේ රාජ කුමාරියක් වෙලා ඉපදුනා. ඇය උපන් මොහොතෙම ඒ රාජධානියේ හිටපු මිනිස්සුන්ගෙ බිය සැක සංකා දුරුවෙලා ඒ ප්‍රදේශය ක්ෂේම භූමියක් වුනා. ඒ කියන්නෙ ඇයට තිබ්බච්ච පුණ්‍ය සෘද්ධිය නිසා හැම දේකින්ම සශ්‍රීක වුණා, කිසිම දේකින් අඩුවක් නැතිව පූර්ණ වුණා. ඒ විදියට ඇය ක්ෂේමයක් හෙවත් ඛේමයක් වූ නිසා ඛේමා යන නම් ලැබුවා. ඒ වගේම රූපයෙන් ඉතාම ඉහල කාන්තාවක් වුණා. ඒ තමයි පෙර කරපු පින්වල බලය. සාසනය වෙනුවෙන් කරපු පින්කම් ඒ තරම්ම බලවත්. ඒ අනුව ආයු, වර්ණ, සැප, බල, නුවණ සියල්ලම ලැබුණා.

දැන් මේ ලිපිය කියවන පින්වතුන්ට හිතෙන්න පුළුවන්, බුද්ධ සාසනයේ කරන පින්කම් හෝ කුසල් ඇයි මෙච්චර බලසම්පන්න, ඇයි මෙච්චර සැප විපාක දෙන්නෙ කියල. ඇත්තටම ඒක මෙහෙමයි තේරුම් ගන්න ඕන. බුද්ධ සාසනය කිච්චම සාමාන්‍යයෙන් කෙනෙකුගෙ හිතට එක පාරටම එන්නෙ පුද්ගලත්වයක්. මුලින් බුදුපියාණන් වහන්සේ, ඊට පස්සෙ උන්වහන්සේගෙ පැවිදි ශ්‍රාවකයන් වහන්සේලා, එහෙම නැත්නම් මේ ගෞතම බුද්ධ සාසනයේ නම් සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාගෙන් පටන් ගෙන මේ තාක් එන සියලුම ස්වාමීන් වහන්සේලා. ඒ විදියට පුද්ගලත්වයෙන් තමයි ඉස්සෙල්ලම මතක් වෙන්නෙ. නමුත් බුද්ධ **කිච්චම පුද්ගලයෙකුට වඩා එහා ගිය ගුණස්කන්ධයක් මතක් වෙන්න ඕන.** මොනවද මේ ගුණ? අරහං කියන්නෙ එක ගුණයක්, සම්මා සම්බුද්ධ කියන්නෙ තවත් ගුණයක්... අන්න ඒ විදිහට නව අරහාදි ගුණයෙන් උන්වහන්සේ දකින්න පුරුදු වෙන්න ඕන. බුද්ධ දේශනාවෙම **තියෙනවා, උන් වහන්සේ වෙන කිසිම දහමක් දේශනා නොකර එක බුදු ගුණයක් විතරක් අරගෙන දේශනා කළත්, උන් වහන්සෙගෙ මුළු ජීවිත කාලයම මදි වෙනව මිසක් ඒ ගුණය කියල ඉවර කරන්න බෑ කියල.** ඒ විදියට ගුණයක් දකින්න පුරුදු වුනාම ඒ ගුණය මෙච්චරයි කියල නිම කරන්න බෑ.

ඉතින් ඒ වගේම තමයි ඒ මහා ගුණස්කන්ධයෙන්, මහා කරුණාවෙන් ලෝකයට දීපු දහම අප්‍රමාණ ගුණයකින් දේශනා කරපු ප්‍රමාණ කරන්න බැරි දහමක්. කියල නිම කරන්න බැරි ගුණයක් ඒ දහමෙත් තියෙනවා. ඉතින් ඒ දහම් මග අනුගමනය කරන සංඝයා වහන්සේලා සතු ගුණයත් ඒ වගේම අප්‍රමාණයි. මේ තුනේම එකතුවට හෙවත් බුද්ධ, ධම්ම, සංඝ කියන එකතුවට තමයි සාසනය කියන්නෙ. ඒ සාසනය වෙනුවෙන් පැහැදිලා කරන පූජෝපහාරයන්ගෙන් ලැබෙන ප්‍රතිඵල ගැන කවර කතාද? ඒ මහා ගුණස්කන්ධයට පූජා කරමි ! පූජා කරමි! පූජා කරමි! පූජාම වේවා! පූජාම වේවා! පූජාම වේවා! කියල පූජා කළොත් ඒක සුළු පටු දෙයක් නෙවෙයි. කියල නිම කරන්න බැරි ගුණයකට කරපු පූජා උපහාරයන්ගේ ප්‍රතිඵල එනකොටත් කියල නිම කරන්න බෑ. ඒ ප්‍රතිඵල තමයි ඛේමාවට සසර පුරා නිවන් දකින තුරා ලැබුණෙ. ඉපදෙන ඉපදෙන තැන අග මෙහෙසියක් වුණා. කිසිම අඩුපාඩුවක් නෑ. රූපයෙන් අඩුපාඩුවකුත් නෑ. ඒ උපන් තැන විවාහ වෙච්ච ස්වාමි පුරුෂයන් කවදාවත් නින්දා අපහාස කරලත් නෑ. ඒ පුණ්‍ය මහිමය කොච්චර බලවත්ද කියනව නම් එහෙම නින්දා කරන්න, බනින්න, ගහන්න ☞

අත උස්සන්න ශක්තියක් එන්නෙ නෑ. ඒ තරම්ම සාසනය කෙරෙහි පැහැදිලා කරන පූජෝපහාර බලවත්. හැබැයි ඒකෙ අනෙක් පැත්ත, ඒ කියන්නෙ පාපයත් ඒ වගේමයි.

ඉතින් ඛේමා රජ කුමරියගෙ අවසන් අත් බැවේ ඇගේ දෙමව්පියන් විසින් එවක රජ වෙලා හිටපු බිම්බිසාර රජතුමාට ඇයව සරණපාවා දුන්නා. ඇගේ රූපය නිසා බිම්බිසාර රජතුමා වැඩියෙන්ම ඇලුම් කළා. මේ සැලකීමට, පෙර පිනත් ඛේමා රජ කුමරියට ඉවහල් වුනා. ඛේමා කුමරියත් තමන්ගෙ රූපය ගැන හිත හිතා ඒකටම ඇලිල තමයි හිටියෙ. ඒ වෙන කොටත් බුද්ධ සාසනය කෙරෙහි පැහැදිලා හිටපු බිම්බිසාර රජතුමා කොච්චර උත්සාහ කළත් ඛේමා බිසව බණක් අහන්න එක්කන් යන්න බැරි වුනා. ඇගේ පාරමිතා ශක්තිය අනුව හෝ මොන යම් හෝ ධර්මතාවයක් නිසා හෝ ඇය දැනගෙන හිටියා, බුදුන් වහන්සේ රූපයට නිග්‍රහ කරන බව. ඒ හේතුවෙන් රූපයට ඇලී හිටපු ඛේමා බිසව බණ අහන්න යන්න මැලි වුණා. මෙතනදී බුදුන් වහන්සේ රූපයට නිග්‍රහ කරනවයි කිව්වම මේ ගැන වැරදි අවබෝධයක් නොගත යුතුයි. මොකද සමහර විට කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඔය කියන්නෙ අද සමාජයේ නිග්‍රහ කරන මට්ටමේ එකක්ද කියල. ඒ කියන්නෙ, කෙනෙක් තව කෙනෙකුගෙ රූපයක් දකල, අනේ මට එහෙම රූප සම්පත්තියක් නෑනෙ කියල රූප සම්පත්තිය තියෙන කෙනාට අවමන් කරන්න පුළුවන්. අන්න ඒ ආකාරයට හිතුවොත් ඒක වැරදියි.

එහෙම නැත්නම් හිතෙන්න පුළුවන්, බුදුන් වහන්සේ කෙලින්ම මූණට දමල ගැහුව වගේ, අපෝ ඔය රූපයෙන් වැඩක් තියෙනවද කියල ඇහුව කියල. මොකද හුඟක් අය හිතන්නෙ, බුදුන් වහන්සේ ලස්සන රූපයට විතරයි නිග්‍රහ කළේ, කැත රූපයට නෙවෙයි කියල. නමුත් උන් වහන්සේ ලස්සන / කැත කියන දෙකට නිග්‍රහ කරන්න නෙවෙයි තේමාව යොදා ගත්තෙ, මේ රූපස්කන්ධයේ තියෙන්නා වූ ආදීනවය පෙන්වා දෙන්න. යම්කිසි රූපස්කන්ධයක් යම් ආදීනව සහිතද, මෙන්න මෙහෙම ආදීනව නිසා කැත වුනත්, ලස්සන වුනත් ඒකෙන් අවසානයේ දුක්ඛස්කන්ධයක් ලැබෙනවා. හැබැයි ලෞකිකත්වය තුළ වැරදි ආකල්ප ගන්න උදවිය මේ කාරණය හිතාගෙන ඉන්නෙ, රූපයෙන් ලස්සන අයට ඒ ලස්සන නිසා නිග්‍රහ කළා කියල. නමුත් ලස්සන / කැත කියන එහෙම විශේෂත්වයක් නිසා නෙවෙයි උන් වහන්සේ රූපයට නිග්‍රහ කළේ. රූපස්කන්ධය යැයි යමක් ඇත්ද, මෙබඳු ආදීනව සහිතයි කියල කරපු නිග්‍රහයක්. උදාහරණ විදියට **දෙතිස් කුණප කොට්ඨාසයට නිග්‍රහ කළා කිව්වම, ලස්සන කෙනාටත් කැත කෙනාටත් තියෙන්නෙ දෙතිස් කුණප කොට්ඨාසයමයි.** එතකොට කුණු කොටස් 32 කින් කය හැදුනයි කිව්ව මිසක් ලස්සන කියල එකක් වෙන් කරල ඒකට විතරක් නිග්‍රහ කරල, කැත කයට තැනක් දුන්නෙ නෑ. ඒ විදියට ලස්සන / කැත නිසා නිග්‍රහ කරන්නෙ / ප්‍රසංසා කරන්නෙ ලෞකිකත්වය තුළ ඉන්න මිනිස්සු.

බුදුන් වහන්සේ පෙන්නුවෙ, පොදුවේ රූපය කියන්නෙ කෙබඳු දෙයක්ද, රූපය හට ගත්තෙ කෙබඳු ආකාරයටද..... ආදී වශයෙන් රූපය නිසා හට ගන්න ආදීනව, රූපය මුල් කරගෙන විඳින්නා වූ මේ සියලු ආකාර සසර දුක හැදෙන හැටි. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන ඒවා හට ගන්න මුල් වෙන්නෙත් රූපය. මේ සියලු තැනට මුල රූපය. ඒක මුල් කරගෙන තමයි ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ මේ ඔක්කොම හට ගන්නෙ. **රූපයට ඇලුම් කරන නිසා තමයි සත්වයා සසර සැරිසරාගෙන අනන්ත දුක් විඳින තත්වයට පත් වෙලා ඉන්නෙ.** එහෙනම් රූපය ඒ තරම් භයානකයි කියන එක තමයි පෙන්නුවෙ. එතනදි ලස්සනට මත්වෙලා ඉන්න අයගෙ ඒ දෘෂ්ටිය බිඳින්න තමයි රූපය කියන්නෙ මෙහෙම එකක්, ලස්සනට මත් වෙන්න සුදුසු දෙයක් නෙවෙයි කියල පෙන්නුවෙ. බුදු රජාණන් වහන්සේ මාගන්දියට මේ රූපය මුත්‍රා කලයක් වගෙයි කියල කිව්වෙ, ලස්සන නිසා ඒකට නිග්‍රහ කරන්න නෙවෙයි. මොකද මුත්‍රා කලයක් වගේ ශරීරම තමයි ලස්සන, කැත හැම කෙනාටමත් තියෙන්නෙ. පොදුවේ ශරීරයේ ස්වභාවයයි එතන පෙන්නුවෙ. නමුත් ලෝකයා හිතාගෙන ඉන්නෙ ලස්සනට විතරක් නිග්‍රහ කළා කියල. මේ නිසා උන්වහන්සේ රූපයට නිග්‍රහ කරනවයි කිව්වම ඒක තේරුම් ගන්න ඕන ක්‍රමයත්, උන්වහන්සේ ඛේමාවට පෙන්නල දුන්නු විදිහටම තේරුම් ගන්න ඕන. ඇය බුදුන් වහන්සේ වෙත යොමුවුන ආකාරයත් දැනගෙනම ඒ ක්‍රමය දැනගන්න එක වටිනවා. කොහොමද ඇය බුදුන් වහන්සේ කෙරෙහි යොමු වුනේ?

මේකට බිම්බිසාර රජතුමා අපූරු උපක්‍රමයක් යෙදුවා. එතුමත් සාසනය කෙරෙහි පැහැදිලා හිටපු කෙනෙක්, සෝවාන් ඵලයට පත්වෙලා හිටපු කෙනෙක්. එහෙම කෙනෙක් උපක්‍රමයක් යොදනව නම්, ලෝකයට ඇලෙන බැඳෙන පැත්තට වඩා ගැලවෙන පැත්ත පෙන්නල තමයි ඒක කරන්නෙ. බොරු පොරොන්දු දීල පෙන්වල යොමු කරන සිරිතක් නෑ. ඉතින් මොකක්ද එතුමා යොදපු උපක්‍රමය? ඒක වැදගත් උපක්‍රමයක්. **කෙනෙකුට යමක් හිතට වදින ක්‍රමයක් තමයි කවිය. ඒ වගේම තවත් ක්‍රමයක් තමයි ගීතය, සංගීතය.** මේ උපක්‍රම එකතු කරල ඛේමාවට ඇහෙන විදියට, බුදුපියාණන් වහන්සේ වැඩ හිටපු වේලුවනාරාමය ගැන, එහි ඇති සිත්කළු තැන් ගැන, සුවදායක පරිසරය ගැන විවිධ ගීත ඇහෙන්න සැලැස්සුවා. මේක ඛේමා බිසවගේ හිතට තදින් කාවැදුනා. ඒක කාමය ඇවිස්සෙන ක්‍රමයක් නොවෙන්න බොහෝ දුරට ඉඩ තියෙනවා. ඇයි ඒ? ඒකට හේතුවක් තියෙනවා. බිම්බිසාර රජතුමා කියන්නෙ නියත තිසරණයේ පිහිටි උපාසකතුමෙක්. ඒ වගේ කෙනෙක්ගෙන් ලෝකයට ඇලෙන පැත්තට සංගීතයක් හෝ ගීතයක් හෝ කවියක්, වෙන කෙනෙකුට අහන්න සැලැස්වෙනව අඩුයි. හැබැයි එහෙම දෙයක් වෙන්න බෑ කියන්නෙ නෑ, වෙන්න තියෙන ඉඩ කඩ අඩුයි. එහෙම කවි, ගීත, සංගීතය අදටත් ලෝකයේ තියෙනවා. එක පැත්තක් කාමය ඇවිස්සෙන, ලෝකෙටම ඇලෙන බැඳෙන ජාතියේ කවි, ගීත, සංගීතය. ගීත ගැන කතා කරද්දි ඊට එහා ගිය, එහෙම නැත්නම් ඊටත් උඩින් තියෙන ගීත ක්‍රමයකුත් තියෙනවා. ඒකට කියනවා අභි ගීත කියල.

ගිහි කියන්නෙ ගර්හිත හෙවත් ගරහන්න සුදුසුයි කියන අර්ථය. ඒ කියන්නෙ දස අකුසල්වලට කැමති පුද්ගලයා ගැරහිය යුත්තෙක්. එතකොට දස අකුසල්වලට අකමැති කෙනා ගිහි නෙවෙයි, ගැරහිය යුත්තෙක් නෙවෙයි. යමෙක් දස අකුසල් කරනව නම්, ඒවාට ඇලුම් කරනව නම් ඒ පුද්ගලයා ගිහියෙක්, ගැරහිය යුත්තෙක්. එතකොට ඒ වගේ දස අකුසල්වලට ඇලුම් කරන අය හෙවත් ගිහි අයගෙ හිත බැඳෙන යම් යම් ආකාර ගීත, සංගීත කොටස් තියෙනවා. ඒ වගේ පුද්ගලයො ඒ වගේ ගීතවලට කැමති වුනාට පිරිත්, අභි ගීත වගේ ලෝකයට නොඇලෙන, නොබැඳෙන දේකට සවන් දෙන්න කැමැත්තක් නෑ. හැබැයි මේ කියන්නෙ ලෝක සම්මතයේ ගිහි ඇඳුම් ඇඳගෙන ගෙදර දොර එදිනෙදා කටයුතුවල නිරත වෙලා ඉන්න අය ගැන නෙවෙයි. එහෙම ඇඳුම් ඇඳගෙන ඒ කටයුතු කරන ගමන් දස අකුසලයට නැඹුරු වෙච්ච අය ගැන තමයි මේ කියන්නෙ. නමුත් දස අකුසලයෙන් වෙන් වෙලා ඉන්න අය ඒ වගේ ලෝකෙට නොබැඳෙන, ලෝකෙන් නිදහස් වෙන, ගීත ස්වභාවය අභිබවා ගිය අභි ගීත අහන්න හරි කැමතියි. එතකොට ඒ අය ගිහියො නෙවෙයි. නමුත් ලෝකයේ සමාජ සම්මතයෙන් නම් ඒ අය ගිහියො. ඇඳුම් ඇඳගෙන, ගිහි කටයුතු කරගෙන ඉන්න නිසා අපි අද සම්මතයෙන්, ව්‍යවහාරයෙන් ගිහි කියල කිව්වට, නියම විදියට පරමාර්ථ අර්ථයෙන් ගිහි කියන්නෙ දස අකුසලයට ප්‍රිය කරන උදවියට.

එතකොට යමෙක් බණ අහල ආර්ය වෙච්ච තැන් පටන් දස අකුසලයට ප්‍රිය කරන්නෙ නෑ. ඒ නිසා ඒ අයට ☞

අරිය ශ්‍රාවකයො කියල කියනව මිසක් ගිහියො කියල කතා කරන්නෙ නෑ. ඒ නිසා තමයි බුදුන් වහන්සේ, සෘතවා අරිය ශ්‍රාවකෝ අසෘතවා පෘතජ්ජනෝ කියල ඒ කාරණය වෙන් කරල කිව්වෙ. එහෙම නැතිව ගිහියො කියල කිව්වෙ නෑ. ධර්මය දැනගත්තු කෙනා සෘතවත් අරිය ශ්‍රාවකයෙක්. ධර්මය දැනගත්තට පස්සෙ දස අකුසලයට අකමැතියි. වතක් විදියට වෙනම සමාදන් නොවුනත් දස අකුසලයට අකමැතියි. ඒ නිසා ඒ වගේ අයට නියම විදියට ගිහි කියන්න බෑ. එතකොට නියම විදියට පෘතජ්ජනයො තමයි ගිහියො වෙන්නෙ. **පොතු ජනනය කියන එක තමයි පෘතජ්ජන කියන්නෙ. පොතු කියන්නෙ ගන්න දෙයක් නෑ, හරයක් නෑ කියන එක.** ගහක කඳක්, ගෙඩියක් වුනත් ගන්න කොට පොත්ත ඉවත් කරල තමයි ප්‍රයෝජනයට ගන්නෙ. කොවුල, එලය ටිකක් හරි හොඳයි. එතකොට පොත්ත කියන එක නිකං දිරල යනව මිසක් වටිනා දෙයක් නෙවෙයි. මේක උපමාවක්.

මෙන්න මේ වගේ වැඩකට **නැති, හරයක් නැති දේවල් ජනිත කරන අර්ථයෙන් තමයි පෘතජ්ජන කියන්නෙ.** ඒ තමයි පෘතජ්ජන, ගිහි කියන අයගෙ ස්වභාවය. ඒ අයගෙ වැඩපිළිවෙල ගැරහිය යුතු දෙයක්. එතකොට **ඒ වගේ ගිහි අයගෙ හිත පිනවන්න ගයන්නෙ ගිහි හිත - ගීත. ඒ ගිහි හිත අභිබවා ගියාමයි අභි ගීත වෙන්නෙ. ඒ නිසා අභි ගීතවලින් ගිහි අයගෙ හිත පිනවෙන්නෙ නෑ. නමුත් දහමට නැඹුරු අයගෙ හිත පිනවෙනවා.** ඒ කියන්නෙ ලෝකෙට ඇලෙන බැඳෙන අර්ථයක් නෙවෙයි. **ලෝකයේ යථා ස්වභාවය දැනගෙන ඒවායින් මිදෙන අර්ථ, බුදු, දම්, සඟ ගුණ තමයි අභි ගීතවලින් කියවෙන්නෙ.** ඒ වගේ අභි ගීතවලින් වෙන්නෙ යම් කිසි දහම් පණිවුඩයක්, සාසන ගුණයක් පෙන්වල දීම. එතනදි වෙන් වෙන් වශයෙන් බුදු ගුණ, දහම් ගුණ හෝ සඟ ගුණ ඔප් නැංවෙන කාරණා සංගීතය මුසු කරල තාලයට ගායනා කරන්න පුළුවන්. මෙතනදි ගීතයකට යම් යම් සංගීත භාණ්ඩවලින් එන ශබ්ද කොටස් එකතු වුනාම ඒක සංගීතයක් වෙනවා. (සං + ගීත) එතකොට ඒ ගීය රාගික එකක් නම් ඒකට එකතු කරන සංගීත කොටස් පවා ඊට අනුකූලව සකස් කිරීමෙන් ඒක රාගික සංගීතයක් වෙනවා. ඒ වගේම විශේෂයෙන් අපේ බෙර, දවුල්, හේවිසි, වීණා ආදී සංගීත භාණ්ඩවලින් එන හඬ ඊට අනුකූලව අභි ගීත සමග එකතු වුනොත් ඒකත් සංගීතයක් තමයි. හැබැයි අර වගේ රාගික වෙන්නෙ නෑ. ඒකෙන් අභි ගීයක් වශයෙන් මිනිස් මනසට යම් කිසි දහම් පණිවුඩයක්, එහෙම නැත්නම් කාමයෙන් තොර වූ පණිවුඩයක් දෙන්න පුළුවන්. ඒ වගේ ගීතවලින් සිත පහන් වෙනවා, සිසිල් වෙනවා, මොකක්ද ඒ කිව්ව ගුණය කියල හොයන්න හිතෙනවා. කෙනෙක් දහමට නැඹුරු කරන්න ඒ වගේ දෙයක විශේෂත්වයක් තියෙනවා.

මේ වගේ දෙයක් තමයි ඛේමා බිසවටත් වුනේ. ඇයටත් වේළුවනාරාමයට යන්න හිතුනා. රජතුමාගෙන් අවසර අරගෙන ගිහින් බැලුවා. ඔය යන අතර මග, අර ගීතවලින් කිව්ව වගේම වේළුවනාරාමයේ සිත්කළු බව, ශාන්ත බව, හතර වටේට බුදු ගුණ නිසා සිසිල් වූ බව දැනුනා. ඒ අතර ගසක් මුල තරුණ භික්ෂුවක් භාවනායෝගීව වැඩ ඉන්නව දැක්කා. ඒත් එක්කම කල්ප ලක්ෂයක් පුරා කරපු පාරමිතා ශක්තිය ටික ටික මතක් වෙන්න, මෝරන්න පටන් ගත්තා. පෙර අවුරුදු විසි දහසක් බඹසරව වාසය කරපු පුරුද්ද ඇදිල ආවා. අර තරම් රූපයක් තියෙන, තරුණ ජවයක් තියෙන හිස මුඩු කරගත් තරුණ භික්ෂුන් වහන්සේ නමක් හරිම සුවයෙන් ගසක් මුල වැඩ ඉන්න කාරණය කල්පනා කළා. මම හිතුවෙ ගිහියො සුව සේ ඉඳල වයසට ගියාමයි මෙහෙම වෙන්න ඕන, නමුත් ඒක වැරදියිනෙ කියල ඇයට හිතුනා. අර තරුණ භික්ෂුන් වහන්සේ දැකල තමයි එහෙම හිතුනෙ.

මෙතන වැදගත් කාරණාවක් තියෙනවා. ඒ තමයි **මේ බුද්ධ සාසනයේ හොඳ ප්‍රතිඵල ගන්න පුළුවන් වෙන්නෙ, තරුණ අවදියේ ඉඳලම ඒකට යොමුවුන තරමට කියන කාරණය.** ඇයි එහෙම කියන්නෙ? අර ඛේමාවට වගේම බොහෝ දෙනෙකුට හිතෙන්නෙත්, තරුණ කාලෙ පුළුවන් තරම් සතුටින් ඉඳල වයසට ගියාම ඕවා කරගන්න බැරිද කියල. මේක ධර්මයේම තියෙන කතාවක්. බුදුන් වහන්සේ එක්තරා මහළු දුගී තත්වයට පත්වුන යුවලක් දකිනවා. එහෙම දැකල ආනන්ද හාමුදුරුවන්ට මෙහෙම දේශනා කරනවා. අර යුවල කුඩා කාලෙ මහණ වුනා නම් පිරිමි කෙනා රහත් වෙනවා, ගැහැනු කෙනා අනාගාමී වෙනවා, තරුණ වියේ මහණ වුනා නම් පිරිමි කෙනා අනාගාමී වෙනවා, ගැහැනු කෙනා සකෘදාගාමී වෙනවා, මැදි වියේ මහණ වුනා නම් පිරිමි කෙනා සකෘදාගාමී වෙනවා, ගැහැනු කෙනා සෝවාන් වෙනවා, දැන් ඒකට පරක්කු වැඩියි කිසි දෙයක් කරගන්න බැරුව, තිබ්බ්ච සම්පත් සේරම නැති කරගෙන හිඟා කනවා. එතකොට මේකෙන් පැහැදිලි වෙන කාරණයක් තමයි, කෙනෙකුට හේතු වාසනා තියෙනව නම්, ජවය ශක්තිය තියෙන කාලෙම සාසනය කෙරෙහි යොමු වුනොත් උපරිම ඵල නෙලා ගන්න පුළුවන් කියන එක. කොටින්ම කියනව නම්, ඇස් කන් පෙනෙන ඇහෙන කාලෙම කරගන්න වැඩක් කර ගන්න ඕන.

ඉතින් ඛේමාව ඔහොම හිත හිතා යන කොට බුදුන් වහන්සේව දැක්කා. ඊට අමතරව විශේෂ යමක් දැක්කා. ඉතාමත් රූබර තරුණ කාන්තාවක් බුදුන් වහන්සේට පවන් සලමින් ඉන්නවා. මීට පෙර ඒ තරම් ලස්සන කාන්තාවක් දැකල තිබුනෙ නෑ. බුදුන් වහන්සේ රූපයට දොස් කියනවයි කියල කලින් තිබ්බ්ච මතයත් ඒත් එක්කම මනසෙන් පහව ගියා. ඇයි එහෙම කිව්වෙ? රූපයට දොස් කියනව නම්, අර තරම් ලස්සන කාන්තාවකට කොහොම දොස් අහන්න වෙයිද? ළඟ ඉඳන් පවන් සලන්න ලැබෙයිද? ඔහොම බල බලා ඉන්න අතර පුදුම සිද්ධියක් දැක්කා. අර රූපයෙන්, ශක්තියෙන්, ජවයෙන් හිටපු තරුණ කාන්තාව ටික ටික වයසට යන හැටි පේන්න පටන් ගත්තා. කෙස් සුදු වෙනව පේනවා, මුතු කැට වගේ තිබුණ දත් එකින් එක හැලෙනව පේනවා, ඇඟ රැලි වැටෙනව පේනවා, මැණික් කැට වගේ දීප්තිමත්ව තිබ්බ්ච ඇස් දුර්වර්ණ වෙගෙන එනව පේනවා. දැන් අර තරුණ ජවයෙන් ශක්තියෙන් තිබුණ ශරීරය වැහැරිලා, ඉතාම මහන්සියෙන් පවන් සලන්නෙ. අන්තිමට ඒ ශරීරය බිමට කඩා වැටිල, බොහොම අමාරුවෙන් ඉන්න මැහැල්ලක් පේන්න පටන් ගත්තා. අවසානයේ ඒ මැහැල්ලත් මියගිහින්, මස් දියවෙලා කටුත් දිය වෙනව පේන්න පටන් ගත්තා.

ඉතින් මේ ටික දැක්ක ඛේමාවට, තමන් මෙතෙක් හිටපු මුලාව වැටහුණා. මහා නුවණැති භික්ෂුණින් වහන්සේලා-ගෙන් අග තනතුර පතාගෙන ආපු පාරමිතාව මතු වුණා. බුදුන් වහන්සේ රූපයට නිග්‍රහ කරන්නෙ ඇයි කියල වැටහුණා. අර කලින් තරුණ භික්ෂුව දැකපු තැන් පටන් වැඩීගෙන ආපු හිත නියම තැනට පත් වුණා. තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් අභියස වැඳ වැටුණා. මේ මොහොත දැක්ක බුදුපියාණන් වහන්සේ ඇයට අසුභානුස්සතිය වඩන ආකාරයත්, කායගතාසතිය වඩන ආකාරයත්, තමා තුලින් සහ බාහිරව දකින ආකාරයත් මහා නිධාන සූත්‍රය ඇසුරෙන් දේශනා කළා. ඉතාමත් නුවණැත්තියක වූ ඛේමාව මේ සූත්‍රය අවසානයේ සෝවාන් ඵලයට පත් වුණා. බිම්බිසාර රජතුමාගෙ අවසරයෙන් පැවිදි වෙලා, පහනක දැල්වීමත් නිවීමත් නිමිති කොට ගෙන පංච අභිඥා සමග සිවුපිළිසිඹියාපත් මහ රහත් තෙරණියක් බවට පත් වුණා. මහා ප්‍රඥා ඇති භික්ෂුණින් අතර අග තනතුරට පත් වුණා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග අපදාන පාලිය 2-2 ඛේමාපදානය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# මළගිය ඥාතීන්ට ගෙදරදී පින් දීම සුදුසුද?...

ප්‍රේත තටුවක් එක්ක සාංඝික දානයක් දීල, මළගිය සතර වරිගයේ ඥාති හිතමිත්‍රාදීන්ට පින් දීල, ඒ අයත් නිදහස් කරල, තමන්ටත් ඇති වන කරදර බාධක ආදියෙන් නිදහස් වන ක්‍රමයක් පසුගිය කලාප කිහිපයකින්ම විස්තර කළා. දැන් මේ විස්තර කරන්නෙ අද වෙන කොට ඒ සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුට ඇති වෙලා තියෙන තවත් ගැටළුවක් ගැන. ඒ තමයි මළගිය ඥාතීන්ට ගෙදරදි පින් දෙන්න හොඳද කියන කාරණය. එහෙම පින් දෙන්න එපා කියන මතයක් තමයි අද වෙන කොට බොහෝ උදවිය අතර ඇති වෙලා තියෙන්නෙ. හැබැයි එක පැත්තකින් ඒ කතාවෙ ඇත්තකුත් තියෙනවා. මොකද මළගිය ඥාතීන්ගෙන් කරදර හිරිහැර ඇති වෙච්ච අවස්ථා සම්බන්ධයෙන් අත්දැකීම් තියෙන නිසාමයි සමහර පින්වතුන්ට ඒ වගේ බයක් සැකක් ඇති වෙන්නෙ. එහෙම වෙන්නෙ ඇයි? භූත, ප්‍රේත ආදී අමනුස්ස කොටස් කැමති ලෞකික දේවල්ම නම් තමනුත් පින් කරල බලාපොරොත්තු වෙන්නෙ, ඒ අය ගෙවල්වලට ඇවිත් රැඳිල කරදර කරන එක පුදුමයක් නෙවෙයි.

උදාහරණ විදියට බොහෝ දෙනෙක් ලෞකික සැප සම්පත් බලාපොරොත්තුවෙන් පින් දහම් කරන කොට, තමන්ගෙ ස්ථානවල අමනුස්ස ප්‍රේත කොටස් ආදිය ඉන්නව නම්, අපිට කරදර නොකර සැනසිල්ලෙ ඉන්න දීල උඹල පලයල්ල කියන අදහසින් තමයි ඒ කටයුතු කරන්නෙ. ඉතින් ඒක ඒ අයටත් අනුමෝදන් වෙන්න කියනව නම්, ඒ අමනුස්ස ආදී කොටස් අනුමෝදන් වෙන්නෙත්, අපිට කරදර නොකර උඹල පලයල්ල කියන අදහසින්. මනුස්සයො තමන්ට සැප සම්පත්තිය ලබා ගන්න අමනුස්සයින්ට යන්න කියන කොට, ඒ අමනුස්සයොත් ඒකම අනිත් පැත්තට බලාපොරොත්තු වෙනවා. මොකද ඒ අයට සතුටු වෙන්න කියල අනුමෝදන් කළේ එහෙම අදහසින්. ඉතින් අනුමෝදන් වෙන්න කියපු අදහස ඒ අයත් ඒ විදියටම අනුමෝදන් වෙනවා. ඒ නිසා දුන්නු දේට අනුව තමයි ප්‍රතිඵලය ලැබෙන්නෙත්. එහෙම නැතිව විමුක්තියක්, සම්පත්තියක් බලාපොරොත්තුවෙන් ඉන්න අමනුස්ස ප්‍රේතාදීන්ට ඒ විමුක්තිය සම්පත ලැබිල යහපතක් වේවා කියල අවංකව පින් දහම් කරල අනුමෝදන් කරන්නෙ කීයෙන් කී දෙනාද? එහෙනම් ලෞකික සැප සම්පත් බලාපොරොත්තුවෙන් කරන පින් දහම් මොනවද කියල හිතල බලන්න ඕන.

බොහෝ වෙළඳ සැල් විවෘත කරන්නත් පෙර බුදු පහන, සීවලී පහන, දේව පින්තූර ආදිය තියල සුවඳ දුම් අල්ලල බලාපොරොත්තු වෙන්නෙ මොනවද ? අවංකවම හිතල බැලුවොත් බොහෝ විට තමන්ගෙ ආත්මාරක්ෂාව සහ ආත්ම ලාභය. සමහර ලෝක සම්මත බෞද්ධයො පවා බුදු දහමට නොගැලපෙන වෙළඳාම් කරන ගමන්ම, ඒවායිනුත් ලාභ බලාපොරොත්තු-වෙන් මේ වගේ කටයුතු සිද්ධ කරනවා. එහෙම බලාපොරොත්තු නැතිව හුදෙක් යහපත් දෙයක් නිසා කරනවයි කියන හැඟීමෙන් කටයුතු කරන උදවිය ඉන්නව නම් ඒ බොහොම අතලොස්සයි. එතකොට මේ විදියට තමන්ගෙ ජීවිතාරක්ෂාව සහ ලෞකික ලාභය පරමාර්ථ කරගත්තම සිද්ධ



වෙන්නෙ මොකක්ද? මළගිය ඥාති ප්‍රේත ආදීන් ප්‍රේත යෝනිවල, අමනුස්ස යෝනිවල උප්පත්ති ලබමින් බලාපොරොත්තු වෙන්නෙත් ඔය ටිකමයි. බොහෝ කොට ඔවුන්ට නිවන් ලබන්න අවශ්‍ය නෑ.

දැන් මේ වගේ අවස්ථාවකදි වෙළඳ සැලේ පහන තියපු දවසෙ, එහෙම නැත්නම් අලුත් සුවඳ දුම් ඇසුරුමක් අරගෙන ඒකෙ තියෙන වෙළඳ දැන්වීම් විස්තරය කියවල එබඳු දේවල් ලබාගන්න සූදානමින් ඒක පත්තු කරල දෙවියන් සිහි කරපු දවසෙ කඩේට හොරු පැන්න නම්, වටිනා භාණ්ඩ අරගෙන ගියා නම් අර දෙවියන්ගෙ දුම් ඇසුරුමටයි, පහනටයි මොකක් වෙයිද? එතකොට තමයි වැටහෙන්නෙ තමන්ගෙ තිබුණු භක්තියේ තරම. තමන්ගෙ ලාභයට, ආරක්ෂාවට නැති දෙයියො එදාට කහල ගොඩේ. නමුත් පරම්පරාවෙන් ආපු බෞද්ධකම නිසා බුද්ධ රූපය, සීවලී පින්තූරය විසි කරන්න යන්නෙ නෑ.

ඊළඟට ලොකුවට සාංඝික දානයක් දීල මියගිය ආච්චිට, සීයට, අම්මට, තාත්තට පින් දෙනවා. ඒ අය දුගතියක ඉන්නව නම් නිවනට උස්සල තියන්න තරම් ආසාවෙන් ගෞරවයෙන් තමයි පින් දෙන්නෙ. හැබැයි එදා රාත්‍රියේ ගෙදර පොඩි එකා හරි භාර්යාව හරි කවුරු හරි ගෙදර කෙනෙක් මියගිය ආච්චි, සීය, අම්ම හෝ තාත්ත හීනෙන් දැකල භය වෙලා යටිගිරියෙන් කෑ ගැහුව නම් ඒ වෙලාවෙ මොනවද කියවෙන්නෙ? ''නොදකින් මුන් මැරිලත් කරදර ඉවරයක් නෑ, ඉන්න කොටත් කරදර, මැරිලත් කරදර. මේ කෙහෙල්මල් දාන දීල ඉවරයක් නෑ, කට්ටඩියෙකුට කියල අල්ලල මුහුදට දානවා.'' දැන් මේ විදියට කී දෙනෙක් නම් කියනවද, කරනවද? දැන් අර සංඝ රත්නයට තිබිච්ච ගෞරවය, මියගිය තමන්ගෙ ඒ ඥාතීන් නිවන් දක්කන්නටමද තිබුණෙ කියල හිතල බලන්න.

දැන් ඉතින් මියගිය ඥාතීන් තමන්ගෙ නිවෙස්වලින් පන්නල දමන්න සමහර උදවිය ලක්ෂ ගණන් මුදල් වියදම් කරමින් විවිධාකාරයේ කට්ටඩියන් පස්සෙ දුවනවා. එහෙම කරල උත්සාහ කරන්නෙ, මියගිය ඥාතීන් පළවා හරින්න මිසක් ඔවුන්ට පින් අනුමෝදන් කරල සුගතිය, නිවන ලබාදෙන්න නෙවෙයි. මියගිය තමන්ගෙ ඥාති හිතමිත්‍රාදීන්ට තියෙන ගනුදෙනු ගැන නොදැන මේ වගේ අසාධාරණ විදියට ඒ අය තමන්ගෙ නිවෙස්වලින් පන්නල දාන්න කටයුතු කිරීම මොන තරම් යුක්ති සහගතද? මේවට තමයි තමන්ම රවටන ආත්ම ලාභ, ආත්ම වංචා කියල කියන්නෙ. ඉතින් ඕවම තමයි ඔය ප්‍රේත, අමනුස්ස ලෝකවල ඉන්න පිරිස් ළඟත් බොහෝ කොටම තියෙන්නෙ. මනුස්ස ලෝකෙ ඉන්න උදවිය මෙහේ ඉඳන් පොර කනවා. තමන්ට දෙනව නම්, ලැබෙනව නම් බොහොම භක්තිය, ගෞරවය. නැත්නම් හිංගි හිංසා, බැනුම්. පින් කියල කරන හොඳ වැඩ, ක්‍රියාකාරීත්වය තුළින් මතුපිටින් පෙනුනට අන්තිමට ලැබිල තියෙන්නෙ තමන්ගෙ යටි හිතේ බලාපොරොත්තුව අනුව පහළ වෙච්ච දේමයි. අනුමෝදන් කරන්නෙත් තමන් බලාපොරොත්තු වෙන දේ ☞

අනුව පහළ කරගත්ත දේමයි.

නමුත් අනුමෝදන් කරනව කියල **නියමාකාරයෙන් කියන්නෙ, අනුව ඔද වැඩෙන්න කියන එක.** ඔද වැඩෙනවා, ඕදනය කරනවා, හෝදනවා කියන වචනවලින් අදහස් වෙන්නෙ එකම අර්ථය. යමක් හෝදන්නෙ පිරිසිදු කරන්න. **ධර්මයට අනුව යමෙක් පිරිසිදු වුනාම ඒ පුද්ගලය ඒ අනුසාරයෙන් ඕදනය වෙනවා. අනුව ඕදනය කරනවයි කියන්නෙ ඒ පුද්ගලයටත් ධර්මයට අනුව පිරිසිදු වෙන්න කියල දෙනවා. ඒක තමයි අනුමෝදනාවකින් කෙරෙන්නෙ.** එතකොට හෝදන්නෙ මොකෙන්ද ධර්මය නමැති ජලාශයෙන්. නැත්නම් පුණ්‍ය ජලාශයෙන්. ඒ කියන්නෙ යහපතක් කරල ගත්තු කිළුටක් නැති සුද්ධ දේකින් තමයි හෝදන්න ඕන. කිළුටු මඩ වතුරෙන් හේදුවොත් මඩ කහට ගැවෙනවා. විසකින්, ජරාවකින් හේදුවොත් ඒ විස ජරාව ගැවෙනවා. පිරිසිදු වතුරින් හේදුවොත් සුද්ධ වෙනවා. මේ වගේ පිරිසිදු හිතකින් යම්කිසි පිනක් කරල ඒකෙන් හේදුවොත් ඒ පුද්ගලය ඒ අනුව ඕදනය වෙනවා, සුද්ධ වෙනවා. අනුමෝදනාව කියන්නෙ එහෙම දෙයක්.

එහෙනම් අනුව ඔද වැඩෙන්න කියල දුන්නෙ තමන් විසින් පින් කරනවා කියල උපයා ගත්තු දේ. ආත්මාරක්‍ෂාව, ආත්ම වංචාව අනුව තමන් හිතපු ලාභය නොලැබුනොත් ඒක කහල ගොඩට යනවා. ලැබුනොත් පූජා සත්කාරයට, ගෞරවයට පාත්‍ර වෙනවා. මේ වගේ දේවල් තමයි බොහෝ උදවිය පින් දහම් කියල උපයාගෙන තියෙන්නෙ.

එතකොට මළගිය කෙනෙක් තමන් කරගත්තු අකුසල් නිසා දුගති අත්භවයක දුක් විඳිනව නම්, එතනින් මිදෙන්න පින් බලාපොරොත්තු වෙනව නම්, ඒ මළගිය අයට දුගතියෙන් මිදිල සුගතිගාමී වෙන්න අවශ්‍ය පුණ්‍ය කුසල ශක්තිය ලබා දීමේ කටයුත්ත ජීවත් වෙලා ඉන්න අයට කරන්න පුළුවන් නම්, ඒක කොහේ ඉඳගෙන කළත් ඇති වැරැද්දක් නෑ. **යමක් අවැඩ නම්, නරක නම් ඒක ගෙදර නෙවෙයි, කොහේදිවත් කරන්න හොඳ නෑ. හැංගිලාවත් කරන්න හොඳ නෑ. ඒ වගේම යමක් වැඩදායක නම්, හොඳ නම් ඒක ගෙදර නෙවෙයි කොහේ ඉඳන් කළත් ගැටළුවක් නෑ.**

දානයක් දුන්නම පින් ලැබෙනව කියල ලෝක සම්මතයේ කතාවට කිව්වට, බුද්ධ දේශනාව අනුව හේතුවට අනුකූලව තමයි ඵලය ලැබෙන්නෙ. වපුරපු තරමටයි අස්වැන්න ලැබෙන්නෙ. **ලෝකයා වැනසෙන්න හේතු වෙන දුෂ්චරිතයක් දන් දුන්න නම් ඒ අනුව තමයි තමන්ටත් ඵලය ලැබෙන්නෙ. ඒ නිසා දානයක් දෙනව නම් ඒක යහපතට හේතුවෙන දෙයක් වෙන්න ඕන. මිනිස්සු ආසා කරන හැම දෙයක්ම දානයක් විදියට දුන්නොත් ඒක පිනක් වෙන්නෙ නෑ.** මොකද ලෝක සත්වයා වැඩිපුරම ආසා කරන්නෙ පංචකාමයට. ඒ නිසා ලෝභ, දෝස, මෝහ සමග එකතු වෙච්ච දෙයක් දානයක් හැටියට දුන්නොත් ලෝභ, දෝස, මෝහවලින් පෝෂණය වෙච්ච තත්ත්වයට පත් වෙලා සතර අපායට යන්න පාර කපාගන්න පුළුවන්. එතන ගිහිල්ලත් ඒ දීපු ජාතියේ ඒවම තමයි තමන්ට නැවත ලැබෙන්නෙත්. උදාහරණ විදියට සමහරු දානෙ දෙන කොට මත් පැන් දෙනවා. ඒ වගේම යම්කිසි ආකාරයකට වෙසඟනන් දෙනව කියල මිථ්‍යාචාර දාන දෙනවා. ඊළඟට කෙනෙක් වහල්ලු වශයෙන් දන් දෙනවා. එතකොට මේ විදියට කෙනෙකුට කරදරයක් වෙන, දුකක් වෙන, විනාසයක් වෙන දෙයක් දන් දුන්නොත් ඒකෙන් කවදාවත් පිනක්, යහපතක් සිද්ධ වෙන්න විදියක් නෑ. ඒක පැහැදිලිවම තර්කයෙන් තොරව තේරුම් ගන්න පුළුවන් දෙයක්. එතකොට ඒ වගේ දේකින් අවැඩක්, විනාශයක්මයි සිද්ධ වෙන්නෙ. එහෙනම් ලෝකයාට දුන්නෙ අසත් පුරුෂ දේවල් නම්, හේතුවේ ඵලයත් ඒ ජාතියේ එකක්ම බව දකින්න ඕන. දැහැමින් උපයා ගත් දැහැමි දෙයින් දන් දෙන්න කියන්නෙ ඒකයි. ඒකෙ තියෙන විශේෂත්වය දකින්න ඕන.

එතකොට මේ පින් බලාපොරොත්තු වෙන මළගිය ඥාති හිතමිත්‍රාදීන් හුඟ දෙනෙක් මනුස්ස වෙලා ඉඳෙද්දි කරගෙන තියෙන්නෙ පොඩි පහේ දේවල් නෙවෙයි. සමහරු ලේසි පහසු පිනකින් ගොඩ එන්න බැරි විදියටයි ඒ අමනුස්ස ලෝකෙ ඉන්නෙ. කන්න බොන්න නෑ, අඳින්න වස්ත්‍රයක් නෑ. නිතරම බයෙන් ගැහෙනවා. ආත්ම ආරක්‍ෂාව හොයනවා. ආත්ම ලාභ හොයනවා. මේ විදියට නොයෙක් අසහනයන්ගෙන් පෙළෙනවා. ඒ නිසා දානයක් දීල ඒ අවශ්‍ය දේවල් ලබාදෙනවයි කියල කිව්වොත් ඒ අමනුස්සයො එතනින් හෙල්ලෙන්නෙ නෑ. ඒක දෙනකල් බලාගෙනම බලාපොරොත්තුවෙන් ඉන්නවා. හැබැයි සමහර වෙලාවට මනුස්ස වෙලා හිටපු කාලෙ අනුන් රැවැට්ටුව නම්, දුෂ්චරිත දේවල් දන් දුන්න නම් දන් අනුමෝදන් වෙන්න වුනත් ඒ ජාතියෙ ඒවමයි ලැබෙන්නෙ. ඒ තමයි හේතුඵල ධර්ම ස්වභාවය. ඒ නිසා මෙන්න මේ ජාතියෙ ලෝභ, දෝස, මෝහ සහගත පින් නම්, ගෙදරදි තියා කොහේදි දුන්නත් භූත අමනුස්ස කරදර ඉවර වෙන්නෙ නෑ.

එහෙනම් දානයක් දෙන කොට ඒ දානය අලෝභය මුල් කරගෙන දුන්න නම්, තමන්ටත් අලෝභයට හේතු වෙන දෙයක් ලැබෙන්න මුල පිරෙනවා. යමක් අදෝසයෙන් දන් දුන්න නම් ඒක සමගියට හේතු වෙනවා. අමෝහයෙන් දන් දුන්න නම් ප්‍රඥාවට හේතු වෙනවා. මේ විදියට ලෝභ, දෝස, මෝහ මුල් කරගෙන යමක් නොකරන්නත් අලෝභ, අදෝස, අමෝහ මුල් කරගෙන යමක් කරන්නත් ස්ථානයේ බලපෑමක් නෑ. අලෝභයෙන් යුක්තව දානයක් දීල මේ ලෝකෙ අසාරත්වය දකල ලෝකෙන් මිදෙන්න කියල, සුගතියට පත් වෙලා යථාවබෝධය ලබාගෙන මේ ලෝක මූලාවෙන් මිදෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙල කරගන්න, මේ කරන පින්කම්න් ලැබෙන ශක්තිය උපනිශ්‍රය වෙලා ආයු, වර්ණ, සැප, බල, නුවණට හේතු වේවා කියල අධිෂ්ඨාන කරල, තමන් දැහැමින් උපයා ගත්තු දේ දන් දුන්න නම්, ඒ පින සතර වරිගයේ ඥාති හිතමිත්‍රාදීන්ටත් අනුමෝදන් කළා නම්, එතනින් අවැඩක් අසාධාරණයක් වෙන දෙයක් කාටවත් ලැබෙන්නෙ නෑ. මේ දානයේ බලයෙන් ආයු, වර්ණ, සැප, බල, නුවණ ලැබිල මියගිය සතර වරිගයේ ඥාති හිතමිත්‍රාදීන් යම්කිසි දුගතියක ඉන්නව නම් ඒ දුගතිගාමී බවින් මිදිල සුගතිගාමී වෙලා, මේ දහම් අවබෝධයට මග පෑදිලා ආර්ය මාර්ගය පූර්ණ කරගෙන සසර දුකින් මිදෙන්න හේතු වාසනා වේවා කියල පතල ඕනෑම තැනක දානයක් දෙන්න පුළුවන්. ඒ විදියට දෙන දානයකින් ලැබෙන ආනිසංසවලිනුත් ලෝභ, දෝස, මෝහවලින් තොර වූ ශක්තියක් ලැබිල, හේතු වාසනා තියෙන ඒ අමනුස්ස කොටස්වලටත් පින් අනුමෝදන් වෙන්න අවස්ථාව ලැබෙනවා. ඒ කියන්නෙ ඒ අමනුස්සයින්ට පවා ලෝභ සහගත සිතක් පහළ වෙන්නෙ නැතිව යනවා. මෛත්‍රී සහගත සිතක්, අයුතුකම් නොකළ යුතුයි කියන සිතක්, කාටවත් නොරිදවිය යුතුයි කියන සිතක් ඒ අමනුස්සයින්ටත් පහළ වෙනවා.

එතකොට මේ ලෝකෙ තියෙන අනිච්ච, දුක්ඛ, අනත්ත ස්වභාවය දකල අත්හැරීමේ, නොඇලීමේ, මිදීමේ වටිනාකම දකල නිවන් මග වඩන අයගෙන් නැගෙන පින් කුසල් නම් ඉහත කියපු ජාතියේ ඒව නෙවෙයි. ප්‍රේත, අමනුස්ස ආදී අත්බැව්වල ඉන්න අයට මෙහෙම පින් අනුමෝදනාවක් කරගන්න ලැබෙනව නම් ඒක ඒ අයගෙ අප්‍රමාණ වාසනාවක්. එදාට ඒ අයගෙ මානසික පරිවර්තනයක් වෙන්න ඒ පුණ්‍ය කුසල ශක්තිය බලපානවා. ඒ පුණ්‍ය කුසල ශක්තිය පිහිටන්නෙ නිවනින් සැනසෙන පැත්තට, සුගතියට. මේ විදියට පහළ කරන පින් කුසල් උදේ, දවල්, රාත්‍රී කොතැනක ඉඳන් අනුමෝදන් කළත් කරදරයක් හිරිහැරයක් වෙන්නෙ නෑ. තමන්ටත් අනුන්ටත් යහපතක්. ඒ වගේම ඒක බෞද්ධ ගුණ ධර්මයක්.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ද්‍රව්‍ය පදාර්ථ ඥානයට හසුවන විවිධ ශාකවල සැඟව ගිය ඖෂධ ශක්තීන්

5 වන කොටස

ඉස්සර හිටපු මිනිස්සු යම්කිසි චිත්තප්‍රසාදයකට හේතු වන දෙයක් දකල, ''ඕ... අලු'' කියන ගති ලක්ෂණයක් තිබුණා. අලු කියන්නෙ ආලෝකය. එතකොට ප්‍රසාද විය යුතු තැන ඒ විදියට ප්‍රසාද වෙන ගති ලක්ෂණය පසු කාලෙක දුරස් වෙලා ගිහින් ඒකට අදාල ශක්තිය ඕලුවල පිහිටියා. ඒක මිහිරියාව දියත් කරපු ගති ලක්ෂණයක් නිසා මිරිදියේ හට ගත්තා. මෙතනදි ඇති වෙච්ච චිත්තප්‍රසාදය හරියට දලක් වගේ ඇලෙන බැඳෙන ස්වභාවය නිසා ඕලු ශාකයත් දලක ස්වභාවයෙන් පිහිටනවා. අදත් ඕලුවල ඒ ශක්තිය තියෙනවා. කෙනෙකුට ඇති වන අඳුරු මානසිකත්වය, ඇස්වල අමාරුකම් වගේ රෝගී තත්ත්වයන්ට ඕලු ඖෂධයක් වෙනවා.

උම කියන්නෙ අම්මට කියන තවත් නමක්. ඒක මාතෘ ගුණ ධර්මවලට උපමා කරනවා. පෙර හිටපු මිනිස්සු ළඟ මාතෘ ධර්ම හෙවත් උම ධර්ම නෙළා ගන්න ගති ලක්ෂණයක් තිබුණා. ඒ කියන්නෙ බුදුරජාණන් වහන්සේ හෝ උන් වහන්සේගෙ සාසනය නැති කාලෙක නම් ඍෂිවරු පෙන්වපු යහපත් ගුණ ධර්ම තමයි මාතෘ භාවයෙන් අරගෙන ඒ තුළ පෝෂණය වුණේ. මවුගෙන් පෝෂණය ගන්නව වගේ යහපත් ගුණ ධර්මවලින් පෝෂණය වෙන කොට ඒක උම ධර්මයක් වෙනවා. නමුත් පසු කාලෙක ඒ උම ධර්ම ගණන් නොගන්න තත්ත්වයට පත් වෙලා, උම නෙළාගන්න ගති ලක්ෂණය දුරස් වුණා. ඒ ශක්තිය ගිහින් නෙළු + උම - නෙළුම්වල පිහිටියා. යහපත් ගුණ ධර්මවලින් මිහිරියාව දියත් කරපු නිසා ඒකත් මිරිදියේ හට ගත්තා. ඒ වගේම දලක් වගේ ඇදල බැඳල තියාගන්න, කොටු කරගන්න ස්වභාවය තිබ්බච නිසා නෙළුම් ශාකයෙත් දලක ස්වභාවය පිහිටනවා. ගුණ ධර්ම පිරිහීම නිසා හට ගන්නා රෝගාබාධවලට නෙළුම් හොඳ ඖෂධයක් වෙනවා.

ඊළඟට මහ කියල කියන්නෙත් සාර ධර්ම, ගුණ ධර්ම. ඒව තමයි සමාජයේ මහ දේවල් විදියට සැලකුවෙ. ඉස්සර හිටපු මිනිස්සු ළඟ ඒ සාර ධර්ම හෙවත් මහ නෙළාගන්න ගති ලක්ෂණයක් තිබුණා. ඒකත් කලින් සඳහන් කරපු ඕළු නෙළුම් වගේ දෙයක්ම තමයි. එක් එක්කෙනා පුද්ගලිකව ඒ වගේ මහ ධර්ම නෙළා ගත්තා. නමුත් පසු කාලෙක ඒ ගති ලක්ෂණයත් දුරස් වුණාම ඒකට අදාල ශක්තිය ගිහින් මානෙල්වල පිහිටියා. මිහිරි දෙයක් නිසා ඒකත් මිරිදියේ පිහිටියා. ඒ වගේම ඇදල කොටු කරගෙන තියාගන්න ගති ලක්ෂණය නිසා ඒකෙත් දලක ස්වභාවය තියෙනවා. ඕළු, නෙළුම්, මානෙල් කියන තුනම ළඟ ළඟ තිබ්බච ගති ලක්ෂණ ඉවත් වෙලා හැදිච්ච ශාක වර්ග 3 ක් නිසා මේ තුනේම සමාන ගති ලක්ෂණ තියෙනවා.



ඒ වගේම ඉස්සර හිටපු මිනිස්සු ළඟ යම් කිසි ආකාරයකට කාම ධර්ම කැටි කර ගත්තු ගති ලක්ෂණයකුත් තිබුණා. ඒක වංක ධර්මයක් නිසා වක ගැහිච්ච ලක්ෂණයක්. නමුත් අන්තිමට ඒ ස්වභාවයත් ඉක්මවා ගිහින් කාමයෙන් ද්වේශයට බැහැල, ද්වේශය නගන්න පටන් ගත්තම එතන අර කලින් තිබ්බච කාමය කැටි කරගත්තු ගති ලක්ෂණය නැති වෙලා ගියා. හැබැයි ද්වේශය කියන්නෙ කාමයටත් වඩා දරුණු පහත් ගති ලක්ෂණයක්. කාමයයි, ද්වේශයයි එකිනෙකට පරස්පරයි. කාමයට විරුද්ධව ද්වේශය නගන්න ගත්තම ඒ තිබ්බච කාම ගති ලක්ෂණයත් දුරස් වෙලා ගිහින් කේ + කැටි + අය - කෙකටිය කියල තැන්පත් වුණා. කේ කියන්නෙ කාමය. කැටි කියන්නෙ කැටි කරනවා. අය කියන්නෙ එකතු කරනවා. වංක ගති ලක්ෂණය නිසා කෙකටිය ශාකයත් වකයි. කෙකටිය මලේ වක යාදෝ නොයාදෝ... ආදී වශයෙන් කවියකුත් තියෙනවා. කාමය නිසා හටගත්තා වූ යම්කිසි විදියක පිරිහීමක් තියේ නම් ඒ වගේ රෝගවලට කෙකටිය බේතක් වෙනවා.

ඊළඟට ඉස්සර හිටපු මිනිස්සු සමගිය සමාදානය වෙනුවෙන් හයියෙන් කෑ ගහන්න, ශබ්ද කරන්න, ඝෝෂා කරන්න ඇලී හිටින කැමැත්තක් තිබුණා. නමුත් පසු කාලෙක ඒ වගේ ශබ්ද කරන ගති ලක්ෂණය නැති වෙලා ගියා. මොකද ලැජ්ජා වෙන දේවල් කරන්න පටන් ගත්තම ශබ්ද කරල කතා කරන්න අවංකව නැගී හිටින්න ශක්තියක් නැතිව ගියා. අනේ කෑ ගහන්නෙ නැතිව හිටපන් .... උඹද අපිට අවවාද කරන්නෙ ? උඹේ හැටි අපි දන්නෙ නැතිවැයි ... මේ ආදී වශයෙන් කියන කොට ඒකෙන් ඇති වෙච්ච ලැජ්ජාව නිසාම අර කලින් තිබ්බච ශබ්ද කරන ගති ලක්ෂණය දුරස් වෙලා ඇකිලිලා ගියා. දැන් ඉතින් කාටවත් අවවාදයක් දෙන්න බෑ. කරගන්න දෙයක් නැතිකමට නිහඬව ඉන්නවා. එතකොට බේර කරනවයි කියන්නෙ ශබ්ද කරනවා කියන එක. ඒකට ඇලී හිටින ගති ලක්ෂණයට බේරේ ඇලි - බෙරලි කියල කියනවා. ඒ වගේ ශබ්දයට හෙවත් බේරෙට ඇලී හිටීමේ ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය බෙරලියවල පිහිටියා. දියේ හැදෙන නිසා ඒකට දිය බෙරලිය කියල කියනවා.

ඒ වගේම මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ යම්කිසි වැඩක් කරන්න ගියාම, එක්තරා ආකාරයක කොලු ගතියක් තිබුණා. ඒ කියන්නෙ ශක්තිමත් කඩිසර ගතියක්. නමුත් පසු කාලෙක ඒ ගති ලක්ෂණය අහක් වුණාම ඒකට හිමි ශක්තිය පිටවෙලා ගිහින් කොල්ලුවල තැන්පත් වුණා. අදත් තුනටිය අමාරුවට කොල්ලු හොඳ ඖෂධයක්.

ඒ වගේම එක්තරා කාලයකදි යමක් අමුවෙන්ම උකහා ගන්න ගති ලක්ෂණයක් තිබුණා. ඒ කියන්නෙ යමක් හැදෙන්න පෙර උඩින් මත්තෙන් ළපටි කාලෙදිම ප්‍රයෝජනයට ගන්නවා.

ඉදෙනකල් පැහෙනකල් ඉන්නෙ නැතිව ළපටි කාලෙම කනව බොනව වගේ වැඩක්. උදාහරණ විදියට කුඩා කාලෙම ළමයෙක් විවාහ කරල දුන්නම ඒ ළමයගෙ ශරීරය දුර්වල වෙලා වැහැරෙන්න පටන් ගන්නවා. ඒ කියන්නෙ අමුවෙන් ප්‍රයෝජනයට ගත්ත වගේ වැඩක්. ඒ කාලෙ මිනිස්සුන්ට තිබ්ච්ච ශක්තිය නිසාම කාමයට වැඩියෙන් ලැදි වෙන්න පටන් ගත්තා. හරියට කොස් තැම්බෙනකල් ඉන්න බෑ කියනව වගේ දෙයක්. මුලින් තිබුණෙ එහෙම දෙයක්. හැබැයි ඒක හොඳ දෙයක් නෙවෙයි. නමුත් පසු කාලෙකදි ඒ ගති ලක්ෂණය නිසාම මනුස්සයො වැහැරිලා මළානික වෙන්න පටන් ගත්තා. කායික ශක්තිය පිරිහිලා ගියා. ඊට පස්සෙ ඒ විදියට අමුවෙන් උකහා ගෙන ප්‍රයෝජනයට ගන්න ගති ලක්ෂණය නැති වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය අමුක්කරාවල පිහිටියා. මේ නිසා අදත් අමුක්කරාවල වාජීකරණ ශක්තියක් තියෙනවා.

ඊළඟට යම්කිසි දෙයක් උණුසුම් කරල රත් කරල දෙන ගති ලක්ෂණයක් ඉස්සර හිටපු මිනිස්සු ළඟ තිබුණා. ඒ කියන්නෙ කාර්ය ගුරුත්වයට ක්‍රියා කරල උද්යෝගිමත් කරන ගති ලක්ෂණයක්. උදාහරණයක් විදියට ක්‍රීඩා තරගයකදි ප්‍රේක්ෂකයො අත්පුඩි ගහල යම්කිසි උණුසුම් තත්ත්වයක් ඇති කරල උත්තේජනයක් ඇති කරනවා. එතකොට ලැබෙන ශක්තිය වැඩි වෙනවා. ඒ වගේ ඉස්සර මිනිස්සු යම්කිසි වැඩක් පළක් කරද්දි වටේ හිටපු අය යම්කිසි විදියකින් ඒකට උණුසුමක් හෙවත් රත් කිරීමක් ලබා දුන්නා. නමුත් පසු කාලෙකදි ඒ ගති ලක්ෂණය නැති වෙලා ගියාම මිනිස්සු අධෛර්යමත් වෙන්න පටන් ගත්තා. ඒ වගේ වැඩවලට සම්බන්ධ නොවී හිටියා. අනේ අපිට ඕව කරන්න බෑ කියල අත් හැරල දැම්මා. එතකොට අර කලින් තිබ්ච්ච රත් කරන ගති ලක්ෂණය පිට වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය අරක්තවල පිහිටියා.

ඒ වගේම යම්කිසි විදියක හොඳ හඬක, මිහිරි කට හඬක එරිල ඉන්න ගති ලක්ෂණයක් පෙර කාලෙ තිබුණා. ඒ කියන්නෙ නිතරම මිහිරි කවියක්, සීපදයක් වගේ දෙයක් කිය කියා ඉන්නවා. එහෙම නැත්නම් ඒ වගේ හඬකට සවන් දෙනවා. ඒක එක්තරා චිත්තප්‍රසාදයකින් කරන දෙයක්. ඒ ගති ලක්ෂණය හොඳටම හොඳ වැඩදායක දෙයක් නොවුනත් සාපේක්ෂව එදා හැටියට හොඳයි. ඒ විදියට කරන මිහිරි කට හඬට මිණි කියල කියනවා. මිණි කිංකිනි නාදය කියල අදත් කියන්නෙ හොඳ හඬක් එන කොට. නමුත් පසු කාලෙක ඒ විදියට මිණි හඬේ එරිල ඉන්න ගති ලක්ෂණය, ද්වේශයට බහින කොට නැති වෙලා ගියාම ඒකට හිමි ශක්තිය එරමිණියවල පිහිටියා.



ඒ වගේම යහපත් පැත්තට එරෙන ගතියෙ බද්ධ වෙන ගති ලක්ෂණයක් තිබුණා. එහෙම යහපත් දෙයක එරිල බද්ධ වෙලා ඉන්නවා, බැඳිල ඉන්නවා. නමුත් පසු කාලෙක ද්වේශය නැගෙන්න ගත්තම ඒ ගති ලක්ෂණයත් දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය එරබදුවල පිහිටියා. ඒකත් නිකම්ම නෙවෙයි සිද්ධ වුණේ. මිත්‍ර වෙලා යහපත් වැඩ කරපු අය එක්ක තරහ වුනේ නිකම්ම නෙවෙයි. එක්කො කෑ ගහගෙන, එක්කො රණ්ඩු වෙලා ගහ ගෙන තමයි ඒ තත්ත්වයට පත් වුණේ. ඒ කියන්නෙ කටුක විදියටයි දුරස් වුණේ. ඒ නිසා තමයි මේ එරබදු, එරමිණිය වගේ ශාකවල කටු තියෙන්නෙ. ඒ වගේම යම්කිසි විදියකට යහපත් දෙයක එරෙන ගතිය මුහු කරගන්න ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් ඒක එරමුසුවල තැන්පත් වුණා.

කු + අම්බ - කුම්බ කියන්නෙ පහත් දේවල් උරා ගෙන තියාගෙන ඉන්න ගති ලක්ෂණයක්. හැබැයි ඒ ගති ලක්ෂණය එළියට පිට වෙන්න නොදී නිදි ගන්වන ගති ලක්ෂණයක් මුල් කාලෙ තිබුණා. කුම්බාණ්ඩය වගේ නිදාගන්නව කියල අදත් කම්මැලිකමට බුදිය ගන්න අයට කියනවා. මේ නිසා ඒකෙන් බාහිර සමාජයට කරදරයක් වුණේ නෑ. උදාහරණ විදියට කාම නින්ද ඒ වගේ දෙයක්. කාමයන්ට ගැති වෙලා හිටපු ගති ලක්ෂණයක් තිබුණත් ඒවට එළිපිට ගහ මරාගන්න ගියේ නෑ. නමුත් පසු කාලීනව ද්වේශය නැගෙන්න ගත්තම කාමයට විරසක වුණා. ගැටීම වැඩි වෙන කොට දස අකුසල්වලින් අනෙක් ඒවත් මතු වෙලා කාම පැත්තට පහර වදින්න ගත්තා. එතකොට වික්ෂිප්ත වෙලා ගිහින් කුම්බ නිදි කරන ගති ලක්ෂණයට අදාල ශක්තිය දුරස් වෙලා ගියා. ඒකෙන් නිදි කුම්බ කියන ශාකය හට ගත්තා. අදත් කාමය නිසා හට ගන්න රෝගීතාවයන්ට නිදිකුම්බ ගහේ කොටස් ඖෂධයක් වෙනවා.

ඊළඟට ද්වේශය ඇතිවුණාමත් කලින් වගේ පිටවෙන්න නොදී නිදි කරගෙන හංගගෙන ඉන්න ගති ලක්ෂණයක් තිබුණා. ද්වේශය කියන්නෙ විසක්. ඒක ඇතුලෙ පැසවනවා. හැබැයි ඒක පිටවෙන්න නොදී එහෙම තියාගෙන හිටපු එකත් එක්තරා ගුණයක්. කුම්බ විදියටම ඒකත් එහෙම තිබිල පසු කාලෙක නවත්ත ගන්න බැරිව ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. එහෙම ක්‍රියාත්මක වෙනකොට ඒ ඇසුරෙ තිබ්ච්ච මට්ටම පිට වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය විසකුම්බ ශාකයේ පිහිටියා. ඒකත් අර වගේම ඖෂධයක්. ද්වේශය පිටවෙන්න නොදී පැසව පැසව හිටපු ගති ලක්ෂණය නිසා, පැසවපු තුවාල ආදිය සුද්ධ කරන්න අවශ්‍ය ඖෂධ ශක්තිය අදත් ඒකෙ තියෙනවා. ඒ නිසා විශේෂයෙන් තුවාල තෙල් වගේ දේවල්වලට යොදා ගන්නවා.

ඇඹිලිය කියන්නෙ අඹුව කියන අර්ථය. ඉස්සර හිටපු ඇඹිලියන්ට කාමය සම්බන්ධයෙන් කහන ගති ලක්ෂණයක් තිබුණා. අදත් කවුරු හරි දඟ විදියට හැසිරෙන කොට කහනවද කියල කතාවටත් අහනවා. හැබැයි ඒක ගුණයක් නෙවෙයි. යම්කිසි විදියක කාම කැහිල්ලක්. නමුත් පසු කාලෙක ලතැවෙන්න පටන් ගත්තම ඒ කාම ගතියත් ඇකිලිලා ගියා. මොකද ඒ කාම ගතිය තියෙන්නෙත් යම්කිසි ප්‍රබෝධයක් උඩ. සමාජය පිළිගන්නව නම්, ඒකට ක්‍රියා කරනව නම් තමයි ඒ විදියට කැහිල්ල එන්නෙ. සමාජයෙන් බැනුම්, ගැරහුම් එනව නම්, වහල්කමට තියා ගන්නව නම් ඒ ගති ලක්ෂණය ඇකිලිලා ගිහින් පැත්තකට වෙලා ඉන්නවා. පිළිගැනීමක් නැතිව යනවා. ඒ වගේ ස්වභාවයක් ආවම ඒ ගති ලක්ෂණය දුරස් වෙන්න පටන් ගත්තා. ඒ ශක්තිය ගිහින් කහඹිලියාවල තැන්පත් වුණා. හැබැයි ඒක හොඳ එකක් නෙවෙයි. ගෑව්ච්ච තැන කහනවා. ඒ වගේ ගති ලක්ෂණයක් ආවම කහඹිලිය ගෑවිලාද ☞

කියල අදත් කතාවට අහනවා. නමුත් කහඹිලියා මුල් බේතටත් ගන්නවා.

එතකොට ඔය නිදිකුම්බ, කහඹිලිය වගේ සමහර ශාකවලට පණ තියෙනවයි කියනවා. නමුත් ඒක ජීවයක් / සතෙක් නෙවෙයි. මොකද ජීවයක් කියල කියන්නෙ උපතක් තියෙන සිත් පහළ වන ස්වභාවය. නමුත් පණ කියන්නෙ යමකට තියෙන ප්‍රාණවත් ගතිය. කම්හලකට ගිහින් ආයුධයකට පණ තියනවයි කියන්නෙත් ඒකට ප්‍රාණය පිහිටුවල ශක්තිමත් කරන අදහසින්. ඒ නිසා ශාකවලට වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නෑ. නමුත් ඒවටත් රූප තියෙනවා. හැබැයි ජීවිත රූපේන්ද්‍රිය නෙවෙයි. ජීවිතයක් පවත්වන්නෙ ජීවිත රූපයෙන්. ඒක තමයි සත්වයින්ට තියෙන්නෙ. සත්වයෙකුට නාම ජීවිතේන්ද්‍රියයි, රූප ජීවිතේන්ද්‍රියයි දෙකම තියෙනවා. නමුත් ශාකවලට රූප ජීවිතේන්ද්‍රියේ අනුරුවක් විතරයි තියෙන්නෙ. ඒක එන්නෙ සත්වයින්ගෙ කර්ම ශක්තියෙන්ම බාහිර ආයතන විදියට. ඒ නිසා කර්ම ශක්තියට මේ විශ්වය සම්බන්ධයි.

පුද්ගලයෙක් ගත්තම ''මම'' කියන එකයි ''මගෙ'' කියන එකයි දෙකක් තියෙනවා. ''මගේ'' කියන එකේ සම්බන්ධයෙන් තමයි බාහිර ලෝකෙ දේවල් ඇඳල ගන්නෙ. ''මම'' කියන ඒවා පුද්ගලිකයි. සත්ව / පුද්ගල, ද්‍රව්‍ය / වස්තු කියන්නෙ ඒවට සම්බන්ධ දේවල්. මෙතනින් සත්ව හා වස්තු කියන දෙක තමයි විශේෂයෙන් පෘතජ්ජන ලෝකයාට තියෙන්නෙ. පුද්ගල, ද්‍රව්‍ය කියන දෙක තියෙන්නෙ රහතන් වහන්සේට. **රහතන් වහන්සේ නමක් ලෝකය සත් තත්ත්වයෙන් ගන්නෙ නෑ. මොකද උන් වහන්සේ සත් තත්ත්වය ඉක්මවා ගිහින් තියෙන නිසා. ඒ නිසා පුද්ගලත්වයෙන් තමයි ගන්නෙ. ඒ වගේම ලෝකයේ තියෙන දේවල් උන් වහන්සේට ද්‍රව්‍ය මිසක් වස්තු නෙවෙයි. ලෝකයේ මිනිස්සු තමයි ඒවාට වටිනාකමක් දීල වස්තු බවට පත් කරගන්නෙ.** එතකොට ඉතිරි මාර්ග ඵල ලාභීන් ඒ ඒ අයගෙ මට්ටම්වලින් සත්ත්ව / වස්තු පරිහරණය කරන ගමන් ඒවාට තියෙන ඡන්දරාගය අත්හැරගෙන යනවා. ඒ කියන්නෙ සෝවාන්, සකෘදාගාමී අයට සතර අපාගත වෙන ඒවා ද්‍රව්‍ය / පුද්ගල වෙලා, ලෝකයේ පරිහරණය කරන මනුස්ස දිව්‍ය සම්පත් කියන ඉතිරි ඒවා වස්තු / සත්ත්ව වෙනවා. අනාගාමී අයට කාම ලෝකයේ තියෙන දේවල් ද්‍රව්‍ය / පුද්ගල වෙලා, රූප - අරූප ලෝකවල ඒවා වස්තු / සත්ත්ව වෙනවා. රහතන් වහන්සේට මේ සියල්ලම ඉවර වෙලා තියෙන නිසා කොහේ තිබුණත් ද්‍රව්‍ය / පුද්ගල වෙනවා.

ඊළඟට තමන්ගෙ වැඩ කටයුතුවලට සහයට ඉන්න කෙනාටත් අඹුව/ඇඹේනිය කියල කියනවා. මුල් කාලෙ සහයට කෙනෙක් ඉල්ල ගන්න ගති ලක්ෂණයක් තිබුණා. ඒ කියන්නෙ ඇඹේනියක් ඉල්ල ගන්නවා. හැබැයි බලෙන් ගත්තෙ නෑ. නමුත් පසු කාලෙක අයිතිකරුවන්ගෙන්, හිමිකරුවන්ගෙන් ඉල්ලන්නෙ නැතිව තමන්ගෙ හිතුවක්කාර කමට බලෙන් සම්බන්ධ කරගන්න තත්ත්වයට ගිහින් හිත් දූෂ්‍ය වුණා. එතකොට කලින් තිබිච්ච ගති ලක්ෂණයට අදාල ශක්තිය පිටවෙලා ගිහින් ඇඹි + ඉල්ල - ඇඹිල්ල කියන ශාකයක තැන්පත් වුණා. ඒකත් මුල් කාලෙ සුහදව වැළඳගෙන වෙළෙන ගතියෙන් ඉල්ල ගත්තු නිසා ඒ



ශක්තිය පිටවෙලා ගිහින් වැල් ඇඹිල්ල කියල වැලක තැන්පත් වුණා. නමුත් පසු කාලෙක ඊට වඩා ටිකක් තද විදියට ඉල්ලන්න පටන් ගත්තා. ඊළඟට ඒ තද විදියට ඉල්ලන ගති ලක්ෂණයත් ගිලිහිලා ගිහින් ඒකෙන් ගස් ඇඹිල්ල කියල තවත් වර්ගයක් හට ගත්තා. තද ගතිය නිසා ඒක වැලක් නොවී ගහක් වුණා. ඒ වගේම මේ විදියට සහයට කෙනෙක් ඉල්ල ගන්නකොට කාමය මුල් කරගෙනම ඇඹේනියන් ඉල්ලගන්න ගති ලක්ෂණයකුත් කාලෙකදි තිබුණා. කු කියන්නෙ කාම ධර්ම. ඊළඟට ඒ ගති ලක්ෂණයත් පිටවෙලා ගියාම ඒකට හිමි ශක්තියෙන් කුඹි ඇඹිල්ල කියල ශාකයක් හට ගත්තා. ඒ තවත් වර්ගයක්.

යම්කිසි දෙයක් බිහි වීම නතර කරන ගති ලක්ෂණයට අබ්බ කියල කියනවා. අබ්බගාත කියන්නෙත් යමක් කර කියා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා අසරණ වෙලා ඉන්න අයට. යම්කිසි විදියකින් සමාජයට / පුද්ගලයෙකුට හොඳ දෙයක් බිහි කරන්න ඉන්න කොට ඒකට බාධා කරනව නම්, මුලින්ම හොඳින් කියල බලනවා. හොඳින් කියල බැරිවෙනකොට ඊළඟට නරකින් කියනවා. එහෙම කියන්නෙත් ඒ සමාජය / පුද්ගලයා යහපත් විදියට හදා ගන්න, යහපතක් බිහි කරල දෙන අරමුණින්. නමුත් හොඳින්, නරකින් දෙකින්ම කියලත් හදාගන්න බැරිවෙනකොට, මුන් එක්ක වැඩක් කරන්න බෑ, කියන දෙයක් අහන්නෙ නෑ, ඕන දෙයක් කර ගත්ත දෙන් කියල උපේක්ෂාවට පත් වෙලා වැඩේ අතහැරල දානවා. ඊට පස්සෙ කතා නොකර ඉන්නවා.

බුද්ධ සාසනය ගත්තමත් බුදුන් වහන්සේ පෙන්වපු ඉහළම දඬුවම තමයි බ්‍රහ්ම දණ්ඩනය. ඒ කියන්නෙ කෙනෙක් යහපතට හදා ගන්න ඒ පුද්ගලයත් එක්ක කතා නොකර ඉන්නවා. එතකොට පුද්ගලයා හැදෙනවා. ඊට ආසන්න දෙයක් තමයි මෙතනදි වෙන්නෙත්. මේ මිනිස්සු එක්ක වැඩක් කරන්න බෑ කියල ඒක අතහැරල දාන තත්ත්වයට පත් වෙනවා. නමුත් ඒ තිබිච්ච ගති ලක්ෂණයත් පසු කාලෙක පිට වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය අබ විදියට තැන්පත් වුණා. ඒ වගේම අබත් හරි සැරයි. මොකද යම් හොඳ දෙයක් බිහි කරන්න උත්සාහයෙන් වීර්යෙන් යමක් කරගෙන යන කොට ඒකට අවවාද අනුශාසනා කරන්න සමහර විට සැඩ පරුෂ වෙන්න සිද්ධ වෙනවා. ඉතින් ටිකක් සැරෙන් කියල බලනවා. ඒ නිසා මුලින් පුපුර පුපුර තමයි ඉන්නෙ. එහෙම කියලත් බැරි වෙන කොට, කියල හදන්න බෑ කියල නිකං අත්හැරල දාල ඉන්නවා. ඒකත් එක්තරා විදියකට අප්‍රසාදය හඟවන ක්‍රමයක්. ඒ කියන්නෙ මුකුත් නොකිය තරහින් ඉන්නවා. ඒ තරහ ව්‍යංගයෙන් හඟවනවා. එතකොට මූණෙ අබ පුපුරනව වගේ කියල කතාවටත් කියනවා. පසු කාලෙක ඒ ගතිය තමයි දුරස් වෙලා අබවල පිහිටියේ. අදත් අබවල පුපුරන ගතියක් තියෙන්නෙ ඒකයි. අබ සැර වෙන්නත් හේතුව ඒකයි.

සහලේ ගතිය කියන්නෙ එකාවන්ව බැඳිල හිටපු ගති ලක්ෂණයක්. මුල් කාලෙ ඒ ගති ලක්ෂණය ක්ෂණයකින්, සැනෙකින් මතු වෙලා ආවා. නමුත් පසු කාලෙක ඒ ගති ලක්ෂණය වැහිල ගිහින් දුරස් වුණා. ඒ කියන්නෙ එදා තිබිච්ච සමගිය, සමාදානය දුරස් වෙලා ගියා. ඒක තමයි ක්ෂණ සහල් - සැන සහල් -එනසාල් විදියට තැන්පත් වුණේ. ඒ වගේම මුල් කාලෙ සහලේ ගතිය සොයා ගෙන එන ගති ලක්ෂණයක් තමයි තිබුණෙ. ඒ නිසා තමයි ක්ෂණයකින් සහලේ ගතිය

මතු වෙනවයි කිව්වෙ. උදාහරණ විදියට නෑදෑ හිතවතුන්ගෙ ගෙවල්වලට නිතරම එනවා, සැප දුක් බලනවා. නමුත් පසු කාලෙක එහෙම එන්නෙ නැතිව ගියා. ඒ අර්ථයෙනුත් එන සහල් - එනසාල් කියල කියනවා.

ඒ වගේම යමක් සාධනය කරනවයි කියන්නෙ යමකට මුල පුරනවා, කටයුතු සලස්වනවා කියන අර්ථය. සුභ සාධනය කියන්නෙත් ඒ වගේ දෙයක්. ඉක්ක කියන්නෙ ඒ වගේ සාධනය කරන එක නවත්වනවා කියන එක. ඉක්ක යන කොට වෙන්නෙත් බාධාවක්, අවහිරයක්, නතර වීමක්. හැබැයි ඒ විදියට සාධනය කරන එක නතර කරන්නෙත් අවස්ථානුකූලව හොයල බලල. ඒ කියන්නෙ අර කලින් වගේම යහපතක් කරල දෙන්න හදන කොට ඒකට බාධා කරනව නම්, ඒක හොඳින් - නරකින් කියල අහන්නෙ නැත්නම්, සුදුසු වෙලාව එනකල් ඒ සාධනය නවත්වනවා. මුන්ට සාධනය කරල වැඩක් නෑ, මුන් මහ කාලකන්නි, නිකන් වැනසෙනවා... ආදී වශයෙන් කියල ඒක නවත්වනවා. එක්තරා ආකාරයක වර්ජනයක් තමයි ඒකෙන් පෙන්වන්නෙත්. මොකද අර නුගුණය නිසා. ඒකත් සමාජය යහපතට හදාගන්න කරන උපක්‍රමයක්. නමුත් පසු කාලෙකදි අවස්ථානුකූලව තිබ්බ ඒ ගති ලක්‍ෂණයත් දුරස් වෙලා ගිහින්, උන්ට ඕන දෙයක් කරගන්න ඉඩ දෙනව කියල මොනව හරි දීල නිකන් හිටියා. එතකොට අර මුලින් තිබ්බ සාධනය ඉක්ක කරන ගති ලක්‍ෂණය දුරස් වෙලා ගිහින් සාධ + ඉක්කා - සාදික්කා විදියට තැන්පත් වුණා.

ඒ වගේම මුල් කාලෙ සුභ සාධනයක් කරන්න ඉස්සෙල්ල ඒකෙන් වාසියක් ද අවාසියක් ද වෙන්නෙ කියල සිහි කල්පනාවෙන් හොයල බලන ගති ලක්‍ෂණයක් තිබුණා. එතකොට මේක හොඳයි, මේක නරකයි, මේකෙන් අවාසියක් වෙන්නෙ ... ආදී වශයෙන් වාසි අවාසි තෝර ගන්න පුළුවන්කම ලැබුණා. මොකද අසත්පුරුෂයන්ට උදව් කරන්න ගියාමත් ඒකෙන් වස අවාසියක් තමයි වෙන්නෙ. ඒ නිසා එහෙම කල්පනා කරල බලල තීරණ ගැනීමත් හොඳ ගති ලක්‍ෂණයක්. නමුත් පසු කාලෙකදි ඒ විදියට වාසි අවාසි තෝරන ගති ලක්‍ෂණයත් දුරස් වෙලා ගියා. උන්ට ඕන දෙයක් කරගත්තාවෙ කියල නිකන් කරන්නන් වාලෙ කරන්න පටන් ගත්තා. අපි අපේ යුතුකම් ඉෂ්ට කළා, උඹලට ඕන දෙයක් කරගනින් කියල අත් හැරල දැම්මා. වස අවාසියක් වෙනවද කියල හොයල බැලුවෙ නෑ. එතකොට ඒ මුලින් තිබ්බ ගති ලක්‍ෂණය තමයි දුරස් වෙලා ගිහින් වසාවාසි විදියට පිහිටියේ. ඒ නිසා සාදික්කා, වසාවාසි දෙකම එකට පිහිටනවා. මොකද මේ දෙකම ළඟ ළඟ තිබ්බ ගති ලක්‍ෂණ 2 ක් නිසා.

කර කියන්නෙ ක්‍රියාකාරීත්වය, කාර්ය ශූරත්වය. අඹු කියන්නෙ නතර කරනවයි කියන එක. එතකොට මුලින් පුද්ගලයගෙ යහපතට ක්‍රියාකාරී වෙලා ඉඳල, ඊට පස්සෙ අර කලින් වගේම පුද්ගලය අසත් පුරුෂ විදියට හැසිරෙනව නම් අවවාද කරල ඒ ක්‍රියාකාරීත්වය නතර කරල දැම්මා. ඒක අත් හැරල දැම්මෙත් පුද්ගලයගෙ / සමාජයේ හොඳට. මොකද තරවටුවක් දීල හදාගන්න ඕන නිසා. නමුත් පසු කාලෙක ඒ විදියට හොයල බලල අවවාද කරල ඒ ක්‍රියාකාරීත්වය නතර කරන ගති ලක්‍ෂණයත් දුරස් වෙලා ගියා. එතකොට ඒ ශක්තිය පිටවෙලා ගිහින් කරාබුවල පිහිටියා. ඒකත් සාදික්කා වසාවාසි වගේමයි. මේ තුනම ළඟ ළඟ තියෙන ගති ලක්‍ෂණ ගිලිහිලා ගිහින් හටගත්තු නිසා මේ හැම එකකමත් ඒ සමාන ගුණ තියෙනවා. අදත් කෙනෙක්ගෙ ක්‍රියා ශක්තිය අක්‍රිය වෙලා තියෙන කොට කරාබුවල තියෙන ස්ප්‍රීත්තු ගතියෙන් ඒක ප්‍රාණවත් කරනවා. මරණාසන්න වෙලාවට පවා කරාබු නැටිවල තියෙන ඒ ස්ප්‍රීත්තු ශක්තියෙන්, මොහොතකින් ඇඟ රත්කරල සීතල නැති කරල ප්‍රාණවත් කරනවා.



ඒ වගේම ඉස්සර හිටපු මිනිස්සු ළඟ යම්කිසි යහපත් දෙයක් ප්‍රියමනාපයෙන් උකහා ගන්න ගති ලක්‍ෂණයක් තිබුණා. නමුත් පසු කාලෙක ඒ ගති ලක්‍ෂණයත් දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය උක් විදියට තැන්පත් වුණා.

ඉස්සර හිටපු මිනිස්සු තෙයි... තෙයි ... තෙතෙයි ... තෙයි ... ආදී වශයෙන් කියන වචනයක් තිබුණා. ඒකෙන් යම් කිසි ප්‍රබෝධයකට උත්තේජනයක් ලැබුවා. වැඩක් පළක් කරද්දි ඇති වෙන නිදිමත කාන්සිය ආදිය දුරු කරගන්න ඒ ප්‍රබෝධය බොහොම වැදගත් වුණා. ඒක හදවතින්ම එන සතුටකින් නැගෙන ප්‍රබෝධයක්. නමුත් පසු කාලෙකදි ඒ ගුණය දුරස් වෙලා ගියා. ඒකට හිමි ශක්තිය තමයි තේවල පිහිටියේ. අදත් තේවල තියෙන ප්‍රබෝධ ජනක උත්තේජනය නිසා ලෝකයේ ප්‍රධානතම ස්වභාවික පානයක් බවට පත් වෙලා තියෙනවා. තදබල වෙහෙස මහන්සියකදි තේ එකකින් ලැබෙන ප්‍රබෝධය ඉතා ඉහළයි.

ඒ වගේම ඒ කාලෙ මිනිස්සුන්ගෙ ඉපිල යන ගති ලක්‍ෂණයක් තිබුණා. ඒ කියන්නෙ ගුණධර්ම තිබ්බ නිසා, හදවත පිරිසිදු නිසා හිතේ සතුට නිතරම වගේ ඉපිල යමින් තිබුණා. නමුත් පසු කාලෙකදි ඒ ඉපිල යන ගති ලක්‍ෂණය දුරස් වෙලා ගියා. ඊළඟට දන් කෝ ඉපිල කියල අහන්න පටන් ගත්තා. ඒක තමයි කෝ + ඉපිල - කෝපි කියල පිහිටියේ. ඒකත් තේ වගේම සැහෙන ජනප්‍රිය ප්‍රබෝධ ජනක පානයක්.

ඒ වගේම මේ විදියට ප්‍රබෝධයෙන් ඉපිලෙන්න, සන්තෝස වෙන්න කෝ කෝ වරෙන් කියල අනික් අයටත් අඬ ගහන සිරිතක් තිබුණා. ඒ කියන්නෙ නොයෙක් වස් දොස් යන්න නටන කොට, රඟන කොට ඒක පෙන්වල ඒකෙන් ප්‍රබෝධමත් වෙන්න වටේ පිටේ අයටත් කෝ කෝ වරෙන් කියල අඬ ගහනවා. නමුත් පසු කාලෙක ඒ ගති ලක්‍ෂණයත් දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය කෝ + කෝ + වා - කොකෝවා විදියට පිහිටියා. වචනෙ කොහොම හැදුනත් ඒකෙ අදහස එන්නෙ ඒ විදියට. ඒකත් අර වගේම යම්කිසි උත්තේජනයක් ලබා දෙන ප්‍රබෝධ ජනක දෙයක්.

රණ කියන්නෙ සටන. මුල් කාලෙ හිටපු මිනිස්සු සටන් වරල හිටියෙ. ඒ කියන්නෙ මිනිස්සු එක්ක දේපළට, වැට මායිම්වලට ගහ මරාගන්න ගියේ නෑ. සමගියෙන් සමාදානයෙන්, ඉන්න ටිකට හොඳින් ජීවත් වුණා. නමුත් පසු ☞

කාලෙක තණ්හාවෙන් බරිත වෙන කොට එකිනෙකා ගහ මරාගන්න සටනට බහින්න පටන් ගත්තා. ඒකෙන් සමගිය සමාදානය දුරු වෙලා ගියා. එතකොට රණ වරපු ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය රණවරාවල පිහිටියා.

ඒ වගේම ඉස්සර මිනිස්සුන්ට කිළිටි ගතිය හැරපු ළයක් තිබුණා. නමුත් පසු කාලෙක කිළිටි ගති ඇති වෙන්න පටන් ගත්තම ඒ ගති ලක්ෂණය ඉවත් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය කි + හර + ළය - කිරළ විදියට පිහිටියා. අදත් යම්කිසි විදියකින් ශරීරයේ ලේ දූෂ්‍ය වෙච්ච කිළිටි ගති ලක්ෂණයක් තියෙනව  නම් කිරළ පානය ඒකට හොඳ ඖෂධයක් වෙනවා.

ඒ වගේම යහපත් දේවල් නිතර නැරම මුහු කරගෙන අල්ල ගෙන ඉන්න ගති ලක්ෂණයක් මුල් කාලෙ මිනිස්සු ළඟ තිබුණා. නමුත් පසු කාලෙක ඒ ගති ලක්ෂණයත් දුරස් වෙලා ගිහින් නැර + මුහු + අල්ලි - නීරමුල්ලි විදියට තැන්පත් වුණා.

මුල් කාලෙ හිටපු මිනිස්සුන්ගෙ හදවතේ / ළයේ යම්කිසි ලයාන්විත ගතියක් තිබුණා. කාලයක් යද්දි ඒ ලයාන්විත බව බැහැල ගියා. ඊළඟට උපේක්ෂා සහගත බවට පත් වුණා. ඒ කියන්නෙ ලයාන්විත බවක් නෑ, හැබැයි තරහකුත් නෑ. නමුත් දෙවෙනි අවස්ථාවෙදි ද්වේශය නැගෙන කොට ඒ තිබිච්ච උපේක්ෂා සහගත බවත් දුරස් වුණා. එතකොට ලයාන්විත බව බැහැල ගිහින් උපේක්ෂා සහගතව තිබිච්ච ගති ලක්ෂණයත් දුරස් වෙලා ඒක බෑ වුණු ළය හෙවත් බැවිල කියන ශාකයේ පිහිටියා. අදත් කායික ශක්තිය දුර්වල වුණාම බැවිල තම්බල බේතක් වශයෙන් බොන්න දෙනවා.

ඊළඟට යමෙක්ගෙ හැඩ රුවට කියනව සැව කියල. අන් දරා කියන්නෙ ඒ හැඩරුව ආහාර වශයෙන් දරා හිටිනවා කියන එක. ඒ කියන්නෙ යම්කිසි යහපත් දේවල්වල, යහපත් පුද්ගලයන්ගෙ හැඩරුව,



ගුණ ධර්ම ප්‍රිය මනාපයෙන් ආහාරයක් විදියට දරාගෙන ඉන්නවා. නමුත් පසු කාලෙක ඒ ගුණ ධර්ම, හැඩරුව ආහාරයක් වශයෙන් දරා ඉන්න ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් සැවැන්දරා විදියට පිහිටියා. අදත් සුවඳ වර්ගවලට, හම පෝෂණය කරන්න, හැඩරුව වර්ධනය කරන්න සැවැන්දරා යොදා ගන්නවා.

ඊළඟට තුටින් අල්ල ගන්න ගති ලක්ෂණයක් මුල් කාලෙ තිබුණා. ඒ කියන්නෙ සතුටින් යහපත් දෙයක් අල්ල ගන්නවා. එහෙම තුටින් අල්ල ගත්තම හරි සනීපයි. ඊළඟට කලක් යද්දි තුටින් අල්ල ගන්න ගති ලක්ෂණයත් නැති වෙලා ගිහින් දුරස් වුණා. එතකොට ඒ ශක්තිය ගිහින් තොටිල්ල කියන ශාකයේ පිහිටියා. ඇඟ පතේ වේදනා ඉදිමුම් ආදියට තොටිල්ල හොඳ ඖෂධයක් වෙනවා.

ස්තම්භ හුරු කරනවා කියන්නෙ යම්කිසි තැනක නොසෙල්වී ඉන්න පුළුවන් ගති ලක්ෂණයක් හුරු කරනවා කියන එක. බිම ඉඳ ගන්න බය නෑ කියන්නෙ අන්න ඒ ගති ලක්ෂණය. ඇත්ත කියන්නයි බිම ඉඳ ගන්නයි බය වෙන්න ඕන නෑ කියල අදත් කතාවට කියනවා. එතකොට පොළව තමයි සීලයට උපමා කරල තියෙන්නෙ. ඒ කියන්නෙ කිසි ප්‍රශ්නයක් නැතිව ඉන්න පුළුවන් නොසෙල්වෙන ගති ලක්ෂණය. එතකොට බය නැතිව යම්කිසි ශික්ෂණයක පිහිටල ඉන්න පුළුවන්. නමුත් පසු කාලෙක කෙලෙස්වලින් දූෂ්‍ය වෙනකොට, වික්ෂිප්ත වෙනකොට එහෙම බය නැතිව ඉන්න බැරිව ගියා. බිමෙහි ස්තම්භ හුරු කරගෙන ඉන්න පුළුවන් ගති ලක්ෂණය දුරස් වෙලා ගියා. ඒකට හිමි ශක්තිය බිම් තඹුරුවල පිහිටියා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මුනි රජ පහළව....

සාරා සැකි කප් කල් බොහො ලෙසිනා
පුරා පෙරුම් දම් වෙසෙසින් සොඳිනා
ලැබ අවසන් භව මැද දෙස එඳිනා
බෝසත් පිය රජ ලොව වෙත වඩිනා

දෙතිසක් මහ සිරි ලකුණින් සැදෙනා
අසු අනු ලකුණින් බඳ වට කෙරෙනා
දෙසිය සොළොස් පා ලකුණුද සැදෙනා
මහ බෝසත් පිය කය සෙත දෙමිනා

ලෝ සත දුක් සැම දුරු කර ලන්නේ
යන සිතිවිලි ගෙන තවුසෙකු වන්නේ
හැම තැන දහමයි සොයමින් යන්නේ
තම නැණ බලයෙනි වටහා ගන්නේ

මහ පාරමි ගුණ පිරු බල එන්නේ
මැද මණ්ඩල බෝ පිය වෙත යන්නේ
සම් මස් ඇට ලේ වියළිව යන්නේ
බෝසත් තුම වෙර වීරිය ගන්නේ

මහ සෙත දෙන සිවු දහැන් වැඩෙන්නේ
පිළි සමුපා දම් මෙනෙහි කරන්නේ
මහ ලෙස සිත පිරිසිදු කර ගන්නේ
තුන් වැදරුම් විදු නැණස ලබන්නේ

මහ පාරමි බල පූරණ වන්නේ
ලොවුතුරු බුදු රජ බලය ලබන්නේ
බුදු අණ හැම සක්වල විහි දෙන්නේ
ගෝතම බුදු බලයයි ජය ගන්නේ

පබැඳුම : **මනුජය කරුණාරත්න - ගම්පහ**

**අභයරතනාලංකාරය - 30**

# ඇසට නොපෙනෙන ගුප්ත ලෝකයේ බලපෑම්......



**- වහරක අභයරතනාලංකාර හිමි**

*(පසුගිය කලාපයෙන් - අමනුස්සයන්ගේ වගතුග.....)*

ප්‍රේත තටුවක් එක්ක සාංඝික දානයක් දීල පුණ්‍යානුමෝදනාවක් සිද්ධ කරන ආකාරය සහ ඒ සම්බන්ධ අත්දැකීම් තමයි පසුගිය කලාප කිහිපයකින්ම විස්තර කළේ. දැන් මේ විස්තර කරන්න යන්නෙ, විශේෂයෙන් මම මහණ වෙන්න පෙර සිද්ධ කරපු විශේෂ පූජා ආදී කටයුතුවලදි අත් දකින්න ලැබිච්ච විශේෂ සිදුවීම් කිහිපයක්.

ගිජ්දාගම කියන ගම් පළාතෙ මම අවුරුදු ගණනාවක්ම සෙත් ශාන්ති, පූජා කටයුතු ආදිය සිද්ධ කරමින් හිටියා. ඒ පළාතට ගියපු මුල්ම කාලෙ, ඒ ගමේ ප්‍රභූවරු වගේ ඉන්න පිරිසක් මම නැවතිලා හිටපු ගෙදරට ඇවිත් බුලත් අතක් දීල, ඒ අයගෙ ස්ථානයට ඇවිත් ඒ ගම් පළාත නගා හිටුවල දෙන්න කියල මගෙන් විශේෂ ඉල්ලීමක් කළා. ඒත් එක්කම ඒ ස්ථානයේ පූජා කටයුතු, සෙත් ශාන්ති ආදිය සිද්ධ කිරීමට ඉඩ පහසුකම් සලසල දෙන බවටත් ඒ අය පොරොන්දු වුණා. ඉතින් මම කිව්වා, ඒ ගමේ කවුරු හරි මේකට අකමැති කෙනෙක් ඉන්නව නම් මම එන්නෙ නෑ කියල. ඒ ගම ඒ කාලෙ උදා කරපු ගම්මානවලින් එකක්. ගමේ ගෙවල් 82 ක් තිබුණා. ඒ ගෙවල් අසූ දෙකේම උදවිය කැමති නම් විතරයි මම එන්නෙ, කවුරු හරි විරුද්ධ නම් ඒ වැඩ කටයුතු කරන්න මම කැමති නෑ කියල ඒ අයට මම පැහැදිලිවම දැනුම් දුන්නා. මොකද මේ වගේ උතුම් පූජා, සෙත් ශාන්ති කටයුතු ආදිය ඒ වගේ විරුද්ධතා මැද්දෙ කරල ගැටුම් ඇති කරගෙන, ඒ අයටත් අවැඩක් සිද්ධ වෙන බව මම දන්න නිසා, ඒ වගේ අය ඉන්නව නම් ඒ අය කෙරෙහි අනුකම්පාවෙන්මයි මම එහෙම කිව්වෙ. ඒ පාර ඒ අය සියලු දෙනාගෙන්ම අහල, කිසිම කෙනෙක් අකමැත්තක් නැති බව දැනගෙන, ඉල්ලීම භාර ගෙන කටයුතු කරන්න කියල නැවත මාව හමුවෙලා දැනුම් දුන්නා. එහෙනම් ඊළඟ දවසෙ උදෙන්ම කිරිබත් දානයක් සකස් කරල, ඒ ස්ථානයට ගමේ ඉන්න පිරිස් එකතු කරගෙන බුද්ධ පූජාව තියල හැමෝටම සෙත් කරන්න කටයුතු සලස්වන්න පුළුවන්ද කියල මම ඇහුවා. එහෙම පුළුවන් කියල ඒ අය පොරොන්දු වෙච්ච නිසා මමත් ඒ පුණ්‍ය කටයුත්තට ඒ ස්ථානයට ගියා.

ගිහින් බලන කොට එතන 15 - 20 කට වඩා ඉන්න පුළුවන්කමක් නෑ. කටු පඳුරු කැලෑ එක්ක හදිසියේ සුද්ධ කරගෙන, ඒ පුංචි සීමාවෙ තමයි අර ගමේ පිරිස එකතු වෙලා හිටියෙ. හැබැයි ගමේ හැම කෙනෙක්ගෙම සහයෝගය ලැබිල තිබුණා. එතන තිබ්ච්ච ගලක් උඩ වගේ තැනක තමයි ඒ ගමේ පළවෙනි පූජාව ආරම්භ කළේ. ඒ ළඟ ගෙදරක තමයි අපි නිදහසේ නැවතිලා හිටියෙ. ඊට පස්සෙ ඒ කිට්ටුව මහ බෝධි පූජාවක් ලෑස්ති කළා. ඒ වෙන කොටත් එතන ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේගෙ ශාඛා නමක් වඩම්මල යම්කිසි පූජනීය ස්ථානයක් විදියට සකස් කරල තිබුණා. ඒ කාලෙ හිටපු ඇමතිවරයෙක් සමග රටේ හිටපු රාජ්‍ය නායකයෙක් තමයි ඒකට සම්බන්ධ වෙලා තිබුණෙ. පුංචි ගල් වැටියක් බැඳල බොහොම පොඩියට තමයි ඒ වෙද්දි ඒ පූජනීය ස්ථානය තිබුණෙ. එතන සිද්ධ කරපු පළවෙනි මහ බෝධි පූජාව පැය 5 ක් විතර එක දිගටම කළා. ඒක ඒ ගමටම බොහොම ආලෝකමත් වෙන්න කියල කරපු පූජාවක්. ඔය කාලෙ වෙන කොට ඒ ගම හදල අවුරුදු 17 ක් ගිහින්. නමුත් ඒ අවුරුදු 17 ඇතුළත යන්තම් ඉඩෝරයක් ආවත් මුළු ගමටම වතුර නැති වෙන තත්ත්වයක් තමයි උදා වෙලා තිබුණෙ. ගමේ හැම ළිඳකම ඒ තත්ත්වය තිබුණා. අවුරුද්දකට සැරයක් ගමේම ළිං හිඳෙනවා. එතකොට ගමේ පිරිස් නාන්න ඔයට යනවා. බොන්න වතුරවත් නැති තරම්. ඒ වගේ වෙලාවට ප්‍රාදේශීය සභාවෙන් හරි කොහෙන් හරි වතුර බවුසර් ගෙනත් ගමේ හැම ගෙදරකටම බෙදනවා. ඒ විදියට මාසයක් එකහමාරක් විතර ඒ වැඩේ සිද්ධ කරන්න වෙනවා. ඔය විදියට අවුරුදු 17 ක් එකාකාරව තිබුණා. ඉතින් ඒ වගේ නියං කාලෙට, ඉන්න පුළුවන් තත්ත්වක් නැති වෙන්නම කර වෙලා යනවා. ඒ නිසා ගමේ පිරිස් බොහොම දුෂ්කරතා මැද තමයි කල් ගෙව්වෙ.

මම ගිහින් ඉස්සෙල්ලම පූජාව තිව්ව දවසෙදි, පෙර හිටපු ආරච්චිල පරම්පරාවෙ වගේ කෙනෙක්, හොඳ කෝට් එකක් ඇඳල රැවුල උඩට කරකවල බස්තමක් එක්ක මහේශාක්‍ය ලීලාවෙන් ගන්ධබ්බ ලෝකයේ ඉඳන් ඇවිත් (චිත්තජ රූපයෙන් හෙවත් චිත්තජ කයෙන්) මේ අවස්ථාවට සම්බන්ධ වුණා. ඒ පුද්ගලය ගන්ධබ්බ ලෝකෙ තවත් පිරිසක් එක්ක පූජාව දිහා බලාගෙන හිටියා. ඊට පස්සෙ මම ඒ ගමේ පිරිසගෙන් ඇහුවා, මේ වගේ විශේෂ කෙනෙක් ඇවිත් හිටියා, කවුද ඒ කියල. ඒ තමයි ඉස්සර මේ ඉඩම්වල අයිතිය තිබ්ච්ච වළව්වෙ හාමු කියල ඒ අය කිව්වා. විස්තර අහගෙන යන කොට ඔහු හරි තේජස් විදියට හිටපු කෙනෙක්. ඒ ප්‍රදේශයේ තියෙන පන්සලත් තවම වළව්වට අයිතියි. ඒ වළව්වෙ දේපල තමයි පන්සලක් විදියට හදල භික්ෂූන් වහන්සේලා වඩම්මවල පවත්වාගෙන ගිහින් තියෙන්නෙ. පන්සල නඩත්තු කරල තියෙන්නෙත් වළව්වෙන්. නමුත් සඟසතු කරල නෑ. ඒ නිසා තවමත් අයිති වළව්වට. ඒ වළව්වෙ හාමු තමයි අර විදියට ගන්ධබ්බ ලෝකෙ ඉඳන් සූක්ෂම කායිකව එදා විදියටම පෙනී හිටියෙ. ඔහු මැරිල දැන් හුඟක් කල්. නමුත් බොහොම තේජස් විදියට ඇවිත් රැවුල උඩට කරකවල, හරියට රාජසිංහ ලීලාවෙන් වගේ බලාගෙන හිටියා.

දවසක් මම ඔය පන්සලට ගියා. ඒ පන්සලේ තැනක චිත්‍ර ඇඳල තිබුණා. බලන කොට මම දැකපු පුද්ගලය වගේම තමයි ඒ රූප ඒ විදියටම ඇඳල තිබුණෙ. මුහුණුවර හොඳට හුරුයි. මම දැනගත්ත ඒ පුද්ගලයම තමයි මේ චිත්‍රයට නගල තියෙන්නෙ කියල. මොකද ඔහු පන්සල ගොඩනගල කරපු විශේෂ කාර්ය භාරය සිහිවෙන්න තමයි එහෙම කරල තිබුණෙ. ඉතින් එදා ඒ විදියට බෝධි පූජාව තිව්වට පස්සෙ, ඒ පුද්ගලය ඒක ඉවර වෙනකල්ම එතනට වෙලා බලාගෙන හිටියා. ඊට පස්සෙ බොහොම ගරුත්වයෙන් තමයි එතනින් ගියේ.

තව දවසක් ඒ ප්‍රදේශයට ටිකක් ඈතින් තැනක තවත් මහ බෝධි පූජාවක් තියන්න යන්න අපි ලෑස්ති වුණා. ගමේ පිරිස් එක්ක වාහනවලින් තමයි ඒකට ගියේ. ඒ ගමේ පිරිස් බොහොම එකතුයි. එතන බෝධි පූජාව තියද්දි, අර කලින් දැකපු පුද්ගලයත් තමන්ගෙ ඒ ගුප්ත ලෝකෙ (ගන්ධබ්බ ලෝකෙ) පිරිස් එක්ක වෙනම ඇවිත් නැවතත් මහේශාක්‍ය ලීලාවෙන් මා ඉදිරියේ පෙනී හිටියා. එහෙම පෙනී ඉඳල පින් අරගෙන අනුමෝදන් වුණා. ඒ දවස්වල ඒ ගමේ සෙනසුරාදා, බදාදා වගේ දවස්වලට විශේෂ පූජා කටයුතු සිද්ධ කළා. ඒ පූජා තියන කොටත් සෙනසුරාදා විශේෂ බුද්ධ පූජාවක් වශයෙන් තමයි තිව්වෙ. ඒවටත් අර පුද්ගලය ඇවිත් සම්බන්ධ වුණා. එහෙම සම්බන්ධ වෙලා දවසක් පුණ්‍යානුමෝදනාව අවසානයේ මට මෙහෙම කතාවක් කිව්වා. ''මේ ගම බලහත්කාරයෙන් අල්ල ගත්තු ගමක්. ඒ පිරිස මේ අපේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලගෙන තමයි මේ ගම හැදුවෙ.'' මෙහෙම කියල අර අතේ තිබ්ච්ච බස්තමෙන් පොළවට ඇනල, නැවතත් මෙහෙම දෙයක් කිව්වා. ''මම මේ ගම වනසන්නයි හිටියෙ. නමුත් මේ වටිනා පූජනීය ස්ථානයේ දැන් මේ විදියට යහපත් කටයුතු කෙරෙන නිසා, මම ඒකට චිත්තප්‍රසාදයෙන් මීට පස්සෙ මේ ගමට කරදර නොකර මේ පූජනීය ස්ථානයත් එක්ක නිදහස් කරනවා''. මෙහෙම කියල ගරු කරල යන්න ගියා. ඒ අවුරුද්දෙ ඉඳල මම ඒ ප්‍රදේශයේ අවුරුදු 9 ක් විතර පූජා කටයුතු සිද්ධ කරගෙන හිටියා. පිංවත් පිරිස් දීපු ආධාරවලින් ඒ කාලෙ ලක්ෂ 30 ක් විතර වියදම් කරල ඒ පන්සල වැඩි දියුණු කරල සකස් කරල දුන්නා. ඒ කාලෙ ඉඳන් අද වෙනකල් එක දවසක්වත් ඒ ගමට අර කලින් වගේ ඉඩෝර කාලෙට වතුර නැති වුණේ නෑ. හැම ළිඳකම වතුර තියෙනවා. අවුරුදු 17 ක් තිස්සෙ නැති වතුර එක පාරටම ආවෙ කොහොමද කියල ලොකු ප්‍රශ්නයක්. අහවල් හේතුව නිසා වතුර නැතිවුණයි කියල ඒ වෙද්දි ඒක කවුරුවත් දැන අඳුනගෙන තිබුණෙත් නෑ. ඊට පස්සෙ නාන්න බොන්න දෙකටම නියං කාලෙටත් වතුර තිබුණා. තවමත් ඒ සශ්‍රීකත්වය ඒ ගමට තියෙනවා. ඒක හරි විශේෂ දෙයක්.

මුලින් අර ඉඩම් අයිති වෙච්ච පුද්ගලය දැන් ගන්ධබ්බ ලෝකෙ යම් කිසි ආකාරයක මහේශාක්‍ය ලීලාවෙන් හිටියත්, හොඳ කරන්න පුළුවන් වගේම තමන්ට කරපු අසාධාරණය නිසා තමන්ගෙ තියෙන තේජස් බලයකින් යම්කිසි සාපයක් කරන්නත් පුළුවන්. ඒ සිද්ධියෙන් පස්සෙ තමයි මම දැනගත්තෙ මේ විදියෙ අයට සාප



කරන්නත් පුළුවන් කියල. ඒ විදියට කරපු සාපයකින් තමයි අර විදියට අවුරුදු 17 ක් තිස්සෙම වතුර නැති වුණේ. එහෙම දේවල් කරන්න පුළුවන් අය ගුප්ත ලෝකයේ ඉන්නවා.

උදාහරණ විදියට වසර්වති කියන්නෙ දෙවියෙක් වුනත් සාප කිරීම් කරනවා. හැබැයි ඒක මනුස්සයො වගේ අධික ද්වේශයෙන් කරන සාප කිරීමක් නෙවෙයි. ''මේ ලෝකෙ සැප සම්පත් විඳගෙන හොඳින් ජීවත් වෙලා ඉන්න පුළුවන්කමක් තියෙද්දි, ඉපදීම නතර කරල දාන එක (නිවන් දැකීම) මොන තරම් අපරාධයක්ද? මෙච්චර මේ පින් දහම් කරගෙන හොඳින් ඉන්න පුළුවන්නෙ! මෙච්චර මේ සැප සම්පත් තියෙද්දි ඇයි නෑ කියන්නෙ...'' මේ ආදී වශයෙන් ගත්තු දෘෂ්ටියක තමයි වසවර්ති මාරයා ඉන්නෙ. මේ නිසා තමයි බෝසතාණන් වහන්සේටත් කිව්වෙ පින් දහම් කරන්න, රජකම් කරන්න, සක්විති රජ වෙන්න කියල. එතකොට ඒක ද්වේශයකින් කියපු දෙයක් නෙවෙයි. අර දෘෂ්ටිය නිසයි එහෙම කිව්වෙ. නමුත් උන් වහන්සේ ඒක ගණන් ගත්තෙ නැති වුණාම තමයි, ඔය වැඩෙන් ඔබ වහන්සේ ජයග්‍රහණයක් නොලබාම මරණයට පත් වෙන්න පුළුවන් කියල අදහස් අරගෙන, උන් වහන්සේට විරුද්ධව කටයුතු කළේ. ඊළඟට උන් වහන්සේ බුදු වුනාට පස්සෙත්, ඔබ වහන්සේ ඉන්නවට වඩා හොඳයි පිරිනිවන් පෑව නම්, ඔබ වහන්සේ වැඩේ කරගත්තනෙ ඕව අනික් අයට කියන්න යන්න ඕන නෑ... ආදී වශයෙන් ප්‍රකාශ කරල බුදුන් වහන්සේ ඇතුළු සාසනයට විරුද්ධකම් කළේ, සාප කළේ ලෞකික සැප සම්පත් හොඳයි කියන අර දෘෂ්ටියේ බලවත්කම නිසා. එතකොට ඒ සාපය මේ මනුස්ස ලෝකෙ මිනිස්සු කරන සාපයට වඩා වෙනස්. මෙතනදි තමන් හරි මතයෙ ඉන්නවයි කියන දෘෂ්ටියක ඉඳගෙන තමයි එහෙම කටයුතු කරන්නෙ. ඒක අවිද්‍යාවෙ දෘෂ්ටියක්. ද්වේශය කියන එක නැති වුණාට ඒක ඊට වඩා බරපතල මෝහාධික පාපයක්. මොකද දෘෂ්ටිය නිසා. හැබැයි ඒක ශාස්වත දෘෂ්ටියේ ඉඳගෙන කරන දෙයක් මිසක් උච්ඡේද දෘෂ්ටියෙන් කරන දෙයක් නෙවෙයි. මොකද ඒ අය උපත ගැන, පිං පව් ආදිය ගැන පිළිගන්නවා. ඒ නිසා ඒක දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියේ ඉඳගෙන කටයුතු කරන උච්ඡේදවාදය තරම් බරපතල නෑ. උච්ඡේද දෘෂ්ඨියේ ඉඳගෙන සාසනයට විරුද්ධව කටයුතු කළොත් සමහරවිට අට මහ නිරයට ගිහිල්ල කල්ප කාලාන්තරයකටවත් ලේසියෙන් ගොඩ එන්න බැරි වෙන්න පුළුවන්. නමුත් සාස්වත දෘෂ්ඨියේ ඉඳගෙන විරුද්ධකම් කරන නිසා වසවර්ති මාරයාට ඒ තරම් බරපතල වෙන්නෙ නෑ. උදාහරණ විදිහට දූසී මාරයා කාශ්‍යප බුදුන් වහන්සේගෙ කාලෙදි සාසනයට එච්චර විරුද්ධව කටයුතු කරලත් ඔසුපත් නරකයේ ගිහින් ඒකෙ විපාකය විඳවල ගෞතම බුද්ධ සාසනයේ අග්‍ර මහා ශ්‍රාවකයෙක් වුණා. ඒ තමයි මුගලන් මහ රහතන් වහන්සේ. නමුත් මේ ශාස්වත දෘෂ්ටිය නිසා තීරණ අරගෙන බුද්ධ ශාසනයට විරුද්ධව කටයුතු කිරීමත් මහ පාපයක්.

ඒ වගේම පාලක දෙවියන්ගෙ රැකවරණය යටතෙ හිටියට ගන්ධබ්බ

ලෝකෙ ඉන්න විවිධ තේජස් තියෙන කොටස් පවා, තමන් ඒ තත්ත්වයට එන්න පෙර තිබිච්ච තමන්ගෙ පුද්ගලික දේවල්වලට බැල්ම දාගෙන, ඒවාට යම්කිසි අසාධාරණයක් වෙන කොට ඒක තමන්ට රුස්සන්නෙ නැත්නම්, මේ විදියට විවිධාකාරයෙන් අඩත්තේට්ටම් කරන්න පුළුවන්. එතකොට ඉතින් අසාධාරණයට සම්බන්ධ වුනයි, නැහැයි කියල හොයන්නෙ නෑ. ඒ ස්ථානයට සම්බන්ධ ඔක්කොටම ඒ කරදරවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මොකද ඒ පුද්ගලයගෙ දේපල නිසා. හැබැයි ඉතින් අර කලින් සඳහන් කරපු පුද්ගලය මේ වගේ, ඒ ස්ථානයට ලැබෙන ජලය හින්දෙව්වට, මනුස්ස ලෝකෙදි වගේ පළිගන්නව කියල මිනී මැරුවෙ, කැපුවෙ කෙටුවෙ නෑ. ඒ වුනත් ගමකට වතුර හින්දවන්න තරම් ශක්තියක් නොපෙනෙන ලෝකවල අයට තියෙනවයි කියල මේ වගේ දේවල්වලින් ඔප්පු වෙනවා. එහෙම හිර කරගෙන වතුර හින්දෙව්ව වගේම ඒ ස්ථානය නිදහස් කළාම නැවතත් වතුර ලැබුණා. මොකද අර කලින් කරපු සාපය නැති වෙලා ඇති වෙච්ච චිත්තප්‍රසාදය නිසා ඊළඟට ආශිර්වාද කරන්න පටන් ගත්තා.

දේවෝ වස්සතු කාලේන සස්‍ය සම්පත්ති හේතුච - පීතෝ භවතු ලෝකෝච රාජා භවතු ධම්මිකෝ ... ආදී වශයෙන් දෙවියන්ගෙ සම්බන්ධයෙන් කාලයට වැසි වැහැල, යම්කිසි විදියක සස්‍ය සම්පත් ලැබිල රජවරු ධාර්මික වෙන්න කියල ඉල්ලීමක් කරන්නෙත් එහෙම දෙයක් තියෙන නිසා. ඒ වගේම ඒවායින් ශක්තියක් ලැබෙනවා. කාලයට වැසි වහින්න, ජල සම්පත්තියක් ලබන්න කියල එතනත් කිය වෙනවා. එතකොට කාලයට වැසි වස්සවන්නත්, ඒ වගේම නොවසින්න කටයුතු කරන්නත් සමහර අයට පුළුවන්. උදාහරණ විදියට, එන්න තියෙන වැහි වළාකුළක් ආපසු අතින් මුහුද පැත්තට තල්ලු කරන්න රාහු අසුරයට පුළුවන් කියල ධර්මයේ සඳහන් වෙනවා. එතකොට මහ ඉඩෝරයක් හෝ මහා ජල ගැල්මක් ඇති වෙන විදියට ඒ වැහි වළාකුළු එක පැත්තකට තල්ලු කරන්න පුළුවන්. ඒ වගේ යම්කිසි භෞතික වස්තුවලට බලපෑම් කරන්න පුළුවන් අය අපට නොපෙනුනාට ගුප්ත ලෝකයේ ඉන්නවා. සමහර විට ගස්කොළං විනාස වෙලා යන්න සාප කරන්නත් පුළුවන්.

ඒ වගේම වැස්ස වළාහක, වායු වළාහක, උෂ්ණ වළාහක, සීත වළාහක ආදී වශයෙන් ඒ ඒ දේවල් පාලනය කරන දෙවි දේවතාවො ඉන්නවා. ඒ ඒ අය ඒ ඒ දේවල්වලට අධිපතිකම් කරමින් පාලනය කරනවා. ඒ විදියට වැස්ස වළාහක දෙවියන්ට වැස්ස ඇති කරන්නත්, වායු වළාහක දෙවියන්ට හුළං ඇති කරල තල්ලු කරන්නත් ඒ ඒ කාලවලට ඒ අයගෙ ශක්තියෙන් පුළුවන්. ඒ වගේම භූමියට සම්බන්ධ භූමාටු දේවතා වගේ කොටස්වලට භූමියට සම්බන්ධ කටයුතුවලට යම් යම් බලපෑම් ඇති කරන්නත් පුළුවන්. හැබැයි එහෙම බලපෑම් කරන්නෙත් නිකම්ම නෙවෙයි, යම්කිසි හේතුවක් ඇතිව. හේතුවක් නැත්නම් එහෙම බලපෑම් කරන්නත් බෑ. නොපෙනෙන ලෝකවල උදවිය වුනත් තමන්ට යම්කිසි අසාධාරණයක් වුණාම ඒකට දඬුවම් දෙන්න ඒ වගේ විවිධාකාර අඩත්තේට්ටම්, දුර්වලකම් ඇති කරන්න පුළුවන්. එතකොට අර විදියට ඉඩෝර නියං කාල ඇති වෙන්න පුළුවන්.

මනුස්සයො වෙලා ඉඳෙද්දි කරපු හොඳ වැඩවලින් යම්කිසි සම්පත්තියක් සහිතව හොඳ තැනක ඉපදිලා හිටියත්, තමන්ට වෙච්ච අසාධාරණයන් නිසා ඒක නිවැරදි කරන කල් යම්කිසි කොස්සක් හිතේ තියෙන්න පුළුවන්. එතකොට තමන්ගෙ තියෙන අධිපතිකම ඒ හැම තැනම පතුරුවා ගෙන ඉන්න බලනවා. සමහර විට වතුර එන කොට හින්දවල දාන්න, වාෂ්ප කරල දාන්න පුළුවන්. ඒ වගේම වතුර නැති කාලෙක වතුර ඇති කරල දෙන අවස්ථාත් තියෙනවා. ඒ වගේ මුට්ටියක් ඇතුලෙ වතුර නොතිබිච්ච අවස්ථාවක වතුර ඇති කරපු යම්කිසි ගුප්ත බලවේගයක් ගැන මීට පෙර 15 වන කලාපයේ අභයරතනාලංකාරය ඔස්සේ විස්තර කළා. ජලයට බලපෑම් කරන්න පුළුවන් ඒ වගේ අමනුස්ස කොටස් ඉන්නවයි කියන කාරණය ඒකෙන් පැහැදිලි වෙනවා. ඒක මගේ අත්දැකීමක්. ඒ දේ සිද්ධ වුනාට පස්සෙ මම ඒ කාරණය යොමු කරල බලල කිව්ව මිසක් කලින් දැනගෙන හිටියෙ නෑ.

දැන් මේ වගේ ගුප්ත ලෝකවල ඉන්න උදවියගෙ බලපෑම්, සම්බන්ධකම් ගැන මම ගිජිඳාගම ඉන්න කාලෙ වෙච්ච තවත් අත්දැකීමක් තියෙනවා. නමුත් ඒ අය එක්තරා දේශපාලන පක්ෂයකට සම්බන්ධ වෙලා හිටපු නිසා ඒ අයගෙ නම් ගම් කියන්න පුළුවන්කමක් නෑ. එහෙම කියන එක ගැලපෙන්නෙ නෑ. ඒ නිසා පිංවතුන්ගෙ දැන ගැනීම පිණිස, මෙහෙම දේවල් මේ ලෝකෙ සිද්ධ වෙනවයි කියන කාරණය පෙන්වන්න විතරක් ඒ කතාව කෙටියෙන් ඉදිරිපත් කරනවා. සාමාන්‍යයෙන් මැතිවරණ කාලයකදි ප්‍රධාන දේශපාලන පක්ෂ ඔක්කොම වගේ තමන්ට ජයග්‍රහණය පතාගෙන නොයෙක් බෝධි පූජා කටයුතු වගේ පිංකම් ආදියත් සිද්ධ කරනවා. ඒ වගේ මැතිවරණයක් ආපු කාලෙක තමයි මේ සිද්ධිය සිද්ධ වුණේ. ඔය අවස්ථාවෙදි එක්තරා ප්‍රධාන දේශපාලන පක්ෂයකට සම්බන්ධ වෙලා ඉඳල මිය පරලොව ගියපු සමහර නායකකාරකාදීන් ඒ ගන්ධබ්බ ලෝකවල ඉඳගෙන තමන්ගෙ ගතිවලට සම්බන්ධ පිරිස් එක්ක, තමන්ගෙ පක්ෂය ජයග්‍රහණය කරවන්න ආශිර්වාද කරන්න ඒ වගේ බෝධි පූජාවකට සම්බන්ධ වුණා. මොකද මනුස්ස ලෝකෙ ඉන්න තමන්ගෙ පක්ෂයෙ පිරිස් ඒ වගේ අවස්ථාවලට සහභාගි වෙන කොට ඒ අයගෙ උදව්වට ඒ ගන්ධබ්බ ලෝකවල ඉන්න අයත් සහභාගි වෙනවා. එතකොට ඒ ගන්ධබ්බ ලෝකෙ පිරිස් මිය පරලොව යන්න ඉස්සෙල්ල මේ මනුස්ස ලෝකෙදි ඇඳගෙන හිටපු තමන් ප්‍රිය කරන ඇඳුම් ආයිත්තම් පිටින්ම චිත්තජ රූපයෙන් (චිත්තජ කයෙන්) තමයි ඒ විදියට සම්බන්ධ වෙන්නෙ. (මේ ගැන විස්තර මේ සඟරාවෙ පළවන සූක්ෂම මනෝ කාය සම්බන්ධ ලිපි පෙළකින් වෙනම ඉදිරිපත් කරල තියෙනවා) ඒ කාලෙ ආර්ය සිංහල ඇඳුම් ඇඳගෙන හිටපු අය තවමත් ඒ ඇඳුම් පිටින් ඒ විදියටම පෙනී ඉන්නවා. ඒ වගේම ඉංග්‍රීසි පන්නයට ටයි කෝට් ඇඳපු අයත් ඒ විදියටම ඉන්නවා. ඒ අයගෙ හැඩරුවත් එදා හිටිය වගේමයි.

ඉතින් මේ බෝධි පූජාව තියද්දි ඒ වගේ හිටපු කිහිප දෙනෙක් ඒකට සම්බන්ධ වෙලා පිං ලබා ගත්තා. එහෙම හිටපු එක්තරා ප්‍රසිද්ධ දේශපාලන නායකයෙක් ගන්ධබ්බ ලෝකෙදි බෝපත්‍ර ස්වභාවයෙන් හැදිච්ච දිව සළු හා සමාන ඇඳුමක් සහිතව මේ පිං අනුමෝදනාවට සම්බන්ධ වුණා. එහෙම සම්බන්ධ වෙලා, මම මේ ස්ථානය දියුණු කරල පිරිස් එකතු කරල ජයග්‍රහණය ලබල දෙනව කියලත් ගුප්ත ලෝකෙ ඉඳගෙනම කිව්වා. ඉතින් දේශපාලනය කරන අයගෙ පොරොන්දු ගැන මමත් දැනගෙන හිටපු නිසා මම ඒ කාරණය වැඩිය ගණන් ගත්තෙ නෑ. ඒ අය ඉතින් මෙහෙම පොරොන්දු දීල යන අයනෙ කියල මම නිකං එතන හිටපු පිරිස් එක්ක කිව්වා. ඒ වගේ දේශපාලනයට සම්බන්ධ වෙලා ඒ කාලෙ හිටපු තවත් විවිධ පිරිස් හිටියා. ඒ අය කවුද කියල මම හරියටම දන්නෙ නෑ. නමුත් එදා දේශපාලනය කරපු හුඟක් පිරිස් මිය පරලොව ගිහින් ගන්ධබ්බ ලෝකෙ ඒ ස්වරූපයෙන්ම තවමත් ඉන්නවා. ඒ අය ගුප්ත ලෝකයේ ඉඳගෙනත් තමන්ගෙ පක්ෂයට දිනන්න සහයෝගය දෙනවා. ඒ අය බොහෝ කොටම මනුස්ස ගන්ධබ්බයො. ඉතින් ඔහොම ඉන්න කොට සුදු පාට ජාතික

ඇඳුමක් ඇඳගත්තු තවත් එක් නායකයෙක් ගුප්ත ලෝකෙ ඉඳන් බොහොම ගැඹුරු හඬින්, මේ පාර අපි දිනනවයි කියල කිව්වා. හැබැයි ඉතින් ඒ කිව්ව වගේම ඒ මැතිවරණයෙදි ඒ අයගෙ පක්ෂය ජයග්‍රහණය කළා. නමුත් ඒකට මගේ කිසිම සම්බන්ධයක් නෑ. මොකද මම තිව්වෙ සියල්ලන්ටම ආශිර්වාද කරන පොදු බෝධි පූජාවක් මිසක් කාටවත් පුද්ගලිකව නෙවෙයි. ඒකට ඕනෑම කෙනෙකුට සම්බන්ධ වෙන්න පුළුවන්. ඉතින් ඒ අයගෙ පිරිස් එක්ක ඇවිත් ඒ අයත් සම්බන්ධ වුණා. ඒ අයගෙ ඒ කාලෙ තිබ්ච්ච හේතුවට අනුව ඒ අය ජයග්‍රහණය කළා.

ඊළඟට ඒ වගේ තවත් දේශපාලන නායකයෙක් සම්බන්ධ වෙච්ච පූජාවකදි ඔහුට සම්බන්ධ නාග ලෝකෙ ඥාති පිරිසකුත් පිං ගන්න ආවා. හැබැයි ඒ විදියට ඒ පිරිස ඔහුට ඥාති වෙලා ඉඳල තියෙන්නෙ අද ඊයෙ නෙවෙයි. බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්න කාලෙ උන් වහන්සේට දානයක් දීපු අවස්ථාවක ඒ පින අනුමෝදන් වෙලා සතුටු වෙච්ච එදා මනුස්ස වශයෙන් හිටපු ඥාති පිරිසක් තමයි ඒ විදියට සම්බන්ධ වුණේ. ඒ අය එහේ ඉඳගෙන තමන්ගෙ ඥාතියට ආශිර්වාද කරන්නයි, පිං අනුමෝදන් වෙන්නයි ඒ පිංකමට ඇවිත් හිටියා. එදා තමයි මම ඒ නාග ලෝකෙ ඉන්න අය විශේෂයෙන් දක්කෙ. ඒ නාග ලෝකෙ කන්‍යාවන්ට හරි අමුතු රූප සම්පත්තියක් තියෙන්නෙ. හරියට දේව වගෙයි. හැබැයි ඒ අයට ඒ තත්ත්වෙ ඉඳගෙන මගඵල ලබන්න බෑ. නමුත් බණ අහල පිං කරගන්න, දන් දෙන්න පුළුවන්. ඒ අය පිනට බොහොම කැමතියි. ඒ අයත් මනුස්ස වගේ ශරීර තියෙන අය. නමුත් මනුස්සයින්ට වඩා රූප ස්වභාවයෙන් අග්‍රයි. උප්පත්ති ස්වභාවය ඕපපාතික නාග වුනාට එහේ ඉන්නෙත් මනුස්ස වෙසින්. හැබැයි අවශ්‍ය නම් ඒ අයට නාග වෙස් මවාගන්න පුළුවන්. ඒ වගේම මෙහාට ආවෙත් මනුස්ස වෙසින්. මොකද ඒ අය මනුස්ස ස්වභාවයට තමයි වැඩිපුර කැමති. මනුස්ස වැඩවලටත් කැමතියි. ඒ නිසා නාග වෙසින් ඉන්න ඒ තරම් කැමැත්තක් නෑ. කර්ම විපාක සෘද්ධි නිසා ඒ විදියට වෙස් මවාගන්න ඒ අයට පුළුවන්. ඒ වගේ විවිධාකාර ස්වරූපයෙන් ඉන්නවා. ඉතින් ගුප්ත ලෝකෙ මේ වගේ මහ පුදුමාකාර සිද්ධි තමයි තියෙන්නෙ. මේ මොනවද, කවුද කියල වෙලාවකට හිතාගන්නත් බෑ. ඒ වගේම ගුප්ත ලෝකෙ පරිවර්තනත් මේ මනුස්ස ලෝකෙ වගේ නෙවෙයි, හරි ඉක්මනට ක්ෂණයකින් පරිවර්තනය වෙනවා.

දැන් මේ වගේ අත්දැකීම් සහිත කාරණා ටිකක් මේ විදියට ඉදිරිපත් කළේ, මේ ලෝකෙ ක්‍රියාත්මක වෙන අපි නොහිතන බොහොම සංකීර්ණ පැතිකඩවල් කිහිපයක් පෙන්වා දෙන්න. මොකද සමහර උදවිය දෘෂ්ටිගත වෙලා විවිධාකාර දේවල් හිතනවා, කියනවා, කරනවා. ඒ වගේම නොයෙක් මතවාද ගොඩනගනවා. ''මැරුණට පස්සෙ ඔක්කොම ඉවරයි, දැන් කරන හරියක් තමයි, ආයෙ මැරිච්ච අය අපිට බලපෑම් කරන්න එන්නෙ නෑ, මේ ලෝකෙ තමයි ඔක්කොම තියෙන්නෙ, දැන් අපිට ඕන දෙයක් කරන්න පුළුවන්.'' .... මේ ආදී වශයෙන් විවිධ දෘෂ්ටිවල එල්බ ගෙන කටයුතු කරනවා. නමුත් ඒ මොනව කළත්, මොන භෞතික තර්කවාද ගෙනාවත්, මළාට පස්සෙ සිද්ධ වෙන දේවල් එහෙම මස් ලේ ඇහැට පේන්නෙ නෑ, මස් ලේ කන්වලට ඇහෙන්නෙ නෑ. නමුත් ඒව බලාගන්න විවිධ ක්‍රම තියෙනවා. විශේෂයෙන් ඒකට අධ්‍යාත්මික ශක්තියක් අවශ්‍යයි.

**මේ ගුප්ත ලෝකය අරගෙන බැලුවොත්, මොන තරම් පුංචි දේවල්වලට මොන තරම් කෙටි කාලයකටද මේ මනුස්ස ලෝකෙ මිනිස්සු මේ ලෝකෙ දේවල්වලට ගහ මරාගන්නෙ, අයුතු අසාධාරණකම් කරන්නෙ කියල හිතෙනවා. අපි මේ ඉන්න මනුස්ස ලෝකෙට වඩා මළාට පස්සෙ යන ගුප්ත ලෝකය ඒ තරම් හරි සංකීර්ණයි. නමුත් ඒ කාරණය මේ ඉන්න බොහොමයක් මිනිස්සුන්ට තේරෙන්නෙ නෑ. එහෙම දැක බලාගන්න, තේරුම් ගන්න පුළුවන්කමක් තියේ නම් මේ විදියෙ අයුතු අසාධාරණකම් කර කර ඒ විදියට හැසිරෙන්නෙ නෑ. මොකද එහේ ගිහින් විපාක විඳවන කොට ලේසි නෑ.** සමහරුන්ට තමන් කරපු හොඳ දේට අනුව ගුප්ත ලෝකෙදි යම් කිසි සම්පත්තියක් ලැබුණත්, ඒ වගේම කරපු පව්වලට ඒ සම්පත්තියත් එක්කම දුක් විඳින්නත් සිද්ධ වෙනවා. සමහර විට ඒක අවුරුදු සිය දහස් ගණනක් වෙන්නත් පුළුවන්. දැන් බලන්න අර ගුප්ත ලෝකෙ ඉන්නවයි කියපු දේශපාලනය කරපු උදවිය එහේ ගිහිල්ලත් තමන්ගෙ දේශපාලන පක්ෂෙ බදාගෙන ඒ අයගෙ ජයග්‍රහණයට කොච්චර දාහයකින්ද ඉන්නෙ? නමුත් මෙහෙදි දාපු සෙල්ලම් එහෙදි දාන්න බෑ. ඉතින් ඒ වෙලාවට විසාල දාහයක් එනවා.

ඒ වගේම ඒ අය මනුස්ස වෙලා ඉදෙද්දි කරපු කටයුතුත් විවිධාකාරයි. සමහර විට පුද්ගලයින්ගෙ ජීවිත නැති කරන්න, අතපය කඩන්න, පළිගන්න, ගෙවල් දොරවල් විනාස කරන්න ආදී කටයුතුවලට විවිධාකාරයෙන් දීපු රහසිගත නියෝග ආදිය නිසා නැවතත් මිනිස් කයක් අරගෙන උපදින්න සෑහෙන කලක් බලන් ඉන්න වෙනවා. මිනිස් කයක් ලබාගන්න බලාපොරොත්තුව, අසහනය තිබුණත් අර වගේ විපාක නිසා කරගන්න දෙයක් නැතිව ගන්ධබ්බ ලෝකෙම විපාක විඳින අවස්ථා තියෙනවා. ඒ විපාක ගෙවෙනකල් ඒ විදියට සෑහෙන කලක් බලන් ඉන්න වෙනවා.

මෙතනදි ගන්ධබ්බ කිව්වමත් කොටස් 2 ක් ඉන්නවා. එක කොටසක් විවිධ භූමාටු දේවතාවන් වගේ ගන්ධබ්බ අත්බැව් ලබල ඉන්න අය. අනෙක් කොටස මනුස්ස, තිරිසන් වගේ අත් භවයක් ලබන්න බලාපොරොත්තුවෙන් සුදුසු කාලය එනකල් කර්ම ශක්තියෙන්ම ගන්ධබ්බ විදියට ඉන්න අය. මේ දෙගොල්ලන්ම චාතුර් මහා රාජික දේව ලෝකයෙන් තමයි පාලනය වෙන්නෙ. ගන්ධයේ එල්බ ගෙන ඒක ආහාර කරගෙන ඉන්න නිසා තමයි ගන්ධබ්බ කියන්නෙ. ඒ නිසා මේ අය අතර හොඳට කැමති, හොඳ කරන අය වගේම නරකට කැමති, නරක කරන කොටස් කියන මේ දෙවර්ගයම ඉන්නවා.

දේශපාලනය විතරක් නෙවෙයි, මේ ලෝකෙ තියෙන අනිත් හැම කටයුත්තක්ම තණ්හාවෙන් බදාගෙන කරපු කියපු උදවියත් එහෙම තමයි. ඒ නිසා මේ යථාර්ථය දැන ගෙන, තම තමන්ගෙ විමුක්තියට කටයුතු කරගෙන, මේ භයංකර සංසාරෙන් එතෙර වෙන්න උත්සාහ කරන්න කියන එක තමයි මේ වගේ අත්දැකීම්වලින් කියන්න තියෙන්නෙ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන**


**නීතිඥ චන්දන සිරිවර්ධන**

**නිවැරදි කිරීමයි :**

**හෙළබොදු පියුම 28 වන කලාපයේ 13 වන පිටුවේ පළ වූ ''දොළොස් පිරිකර පූජා කරන කොට අට්ඨ පරික්කාරං කියන වචනෙ වෙනුවට දෝලස පරික්කාරං ...'' යන්නෙහි ''දෝලස'' වෙනුවට ''ද්වාදස'' යනුවෙන් යෙදිය යුතු බව සලකන්න.**

# නූතන විද්‍යාවට වැරදුණු
# ජීවයේ සම්භවය හා පරිණාමය දහම් ඇසින්

ජීවීන්ගේ ආරම්භය සහ පරිණාමය සම්බන්ධයෙන් බොහොම තදබල විදියට කරුණු සොයා මෙහෙයුම් කරන තත්ත්වයක් වර්තමානය වෙන කොට ඇති වෙලා තියෙනවා. ඒ සඳහා විවිධ තර්කවාද සහ මතවාද ගොඩ නගමින් අති විශාල පරීක්ෂණාගාර තුළ කාලය, ශ්‍රමය සහ මුදල් වැය කරමින් පර්යේෂණ කරන කාලයක් තමයි මේ. ජීවීන්ගේ පහළවීම සහ පරිණාමය ගැන ඇත්ත තත්ත්වය දැනගැනීම වැදගත් වුනත්, වැරදි කරුණු මත එල්බ ගෙන දෘෂ්ටි ගතවීම නම් යහපත් දෙයක් නෙවෙයි. විශේෂයෙන් පරලොව ජීවිතයට ඒ දෘෂ්ටි ගතවීම බොහොම බරපතල විදියට බලපාන්න පුළුවන්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් දහමට අනුකූලව සැබෑ තත්ත්වය හෙළිදරව් කිරීමේ උත්සාහයක් තමයි මේ ලිපියෙන් සිද්ධ කරන්නෙ.



මේ මහා භද්‍ර කල්පයේ ලෝකය පහළ වෙච්ච මුල් අවස්ථාවෙ, ප්‍රබෝධමත් ප්‍රභාස්වර ගතියට ළං වෙලා හිටපු, ආභස්සර බ්‍රහ්ම ලෝකෙන් ආපු බ්‍රහ්ම කල්පික මනුස්සයො බිහි වුනා මිසක් සතර අපාගත සත්තු හිටියෙ නෑ. නමුත් ඊට පස්සෙ ඒ මනුස්සයො ක්‍රමයෙන් දස අකුසල්වල නිරත වෙන්න පටන් ගත්තම සතර අපාගත සත්වයින්ගෙ පහළ වීම ආරම්භ වුණා. ඊළඟට සුදුසු ද්‍රව්‍ය, වස්තු උපකාරයෙන් ඕපපාතික, සංසේදජ, අන්ඩජ, ජලාබුජ .... ආදී ක්‍රමයන්ට නොයෙක් සත්වයින්ගෙ පහළ වීම සිද්ධ වෙන්න පටන් ගත්තා. නමුත් ලෝකයේ විවිධ රටවල විද්‍යාඥයන්, සත්ත්ව ශරීර හටගැනීම පිළිබඳව නොයෙක් මතවලට බැහැගෙන ඉන්නවා. කෙනෙක් පරිණාම වාදය කියනවා. ඩාවින් නම් විද්‍යාඥයාගේ මනස්කල්පිතයක් අරගෙන ඒ මත පිහිටල නොයෙක් පර්යේෂණ පවත්වනවා. ඇමයිනෝ අම්ල වගේ මූල ධාතුවලින්, නැත්නම් වෙනත් ලෝකයකින් මෙලොවට ආපු ''ජාන'' නම් සත්ත්ව අංශු මාත්‍රයකින් ආදී ජීවියා බිහි වුණා දැයි පරීක්ෂණ පවත්වනවා. දියුණු සත්ත්ව කොට්ඨාසයක් පිටසක්වළකින් මෙලොවට ආවා දැයි සැක කරනවා. මේ විදියේ නොයෙක් මතවාද පවතින කාලයක් තමයි මේ. මෙයින් ප්‍රධාන වාදයක් වන පරිණාම වාදයට පිළිතුරු මුලින්ම නුවණැසින් විමසා බැලීම වැදගත්.

''ලෝකයේ මුල්ම ජීවියාගේ බිහිවීම ගොඩබිම නෙවෙයි. මුහුදු හෝ ජලජ ඉතා කුඩා ඒක සෛලික සතුන්ගෙ ක්‍රම විකාශනවලින් ගොඩබිම සත්ත්වයා බිහි වෙලා, ඉන්ද්‍රිය සහිත සත්ත්ව ජීවිත සහ සංවේදී ඉන්ද්‍රිය වර්ධනයෙන් මනුස්සයා දක්වා පහළ වුණා'' මේ අද විද්‍යාඥයන් අතර ප්‍රසිද්ධ මතයක්. **නමුත් බුද්ධ භාෂිතය අනුව යමෙක් දිවැසින් හෝ වේවා, තමාගේ පියා අහවල් නමැත්තෙක්, ඔහුගේ පියා මේ නම් ඇත්තෙක්, ඔහුගෙත් පියා මේ නමින් ජීවත් වූවෙක්... ආදී වශයෙන් කියමින් තමන්ගෙ පිය පරපුර කොච්චර වේගයකින් ආපස්සට බලමින් සිහි කළත්, ජීවිතය ගෙවිල කෙළවර වෙනව මිසක් පරපුර මුල දක්වා කියන්න පුළුවන් සමතෙක් තුන් ලෝකෙම නෑ.**

ඒ කාරණය උපමාවකින් මේ විදියට පෙන්වනවා. දඹදිව් තලයේ (ජම්බුද්වීපයේ) ඇති සියලු ගස්වැල් අඟල් හතරෙ කෑලිවලට කපල, මේ මගේ පියා වෙනුවෙන්... මේ මගේ මව වෙනුවෙන්... මේ පියාගෙ මවුපියන් වෙනුවෙන්... ආදී වශයෙන් කෑල්ලෙන් කෑල්ල ඒ එක් එක් පරපුර වෙනුවෙන් වෙන් කළා නම්, ඒ විදියට මේ කල්පයේ මුල පටන් ගත්තු තැනට යනකොට අර අඟල් හතරෙ කෑලි ඉවර වෙනව මිසක් පරපුර ඉවර නෑ. ඒක තවත් ඈතට යනවා. එතකොට මේ කල්පයේ මුල බැලුවත් එච්චර දුරක් යනව කියල පෙන්වනවා. ඉතිං කල්ප ආරම්භය කොච්චර නම් ඈතද? සංසාරයේ මේ දක්වා අපි ආපු වාර ගණන ඒ තරම් අනන්තයි. එතකොට මනුස්සයගෙ තිරිසන්ගත (වානර) මූල පැවැත්මක් බුදු දහමෙ පෙන්වල නෑ. එහෙනම් මේ පිළිබඳව විද්‍යාඥයන්ගෙ මතය පරීක්ෂා කරල බලන්න ඕන.

එවරස්ට් කියන්නෙ ලෝකයේ තියෙන උසම කන්දක්. හිමෙන් වැසුණු, සතුන් හෝ ගස් කොළන් නැති මේ කඳු මුදුනෙ හරස් කඩක පස් පරීක්ෂා කරන විද්‍යාඥයන්ට සිප්පි කටු, හුණු ගල් එක්තරා රටාවකට පිහිටල තියෙන බව දැකගන්න ලැබිල තියෙනවා. නමුත් මේ සිප්පි කටු රටාවන් කොහොම පිහිටියාද කියල නිගමනය කරන්න ඔවුන්ට නොහැකි වෙලා තියෙනවා. ඒ කාරණය මේ විදියට පැහැදිලි කර ගත්තොත්, වසර කෝටි 100 කට වරක් පෘථිවියේ වෙනසක් සිද්ධ වෙනවා. ඒ කියන්නෙ මුහුදු, සාගර මහාද්වීප (ගොඩබිම්) ලෙස නැගීඒමත්, මහාද්වීප මුහුදට කිඳා බැසීමත් කියන මේ කාරණා දෙක. මේක සිද්ධ වෙන්නෙ සියලුම මහාද්වීප එකවර නෙවෙයි. වරකට එකක්. ඒක පොළව සතු ස්වභාව ධර්මයේ ක්‍රියාවලියක්. ලෝකයේ නියමාකාර පැවැත්ම තමයි මේකෙන් පෙන්වන්නෙ. හැම රටකම, හැම කඳු මුදුනක වගේම හැම මතුපිට බිමකම එක්තරා ක්‍රියාවලියක් සිද්ධ වෙනවා. ඒ කියන්නෙ පස්, ගල්, ශාක හා සත්ව කොටස් ආදිය ඔක්සිකරණය වගේ ප්‍රතික්‍රියාවලට ගොදුරු වෙලා සියුම් පාංශු, වායු ආදී වශයෙන් අනිකුත් සැහැල්ලු ද්‍රව්‍ය බවට පත් වෙනවා.

මේ විදියට සිද්ධ වෙන කොට මහාද්වීපයක පොළවෙ ස්කන්ධය, වාතය හමා යෑම සහ විවිධ ප්‍රතික්‍රියාවන් හේතුවෙන් ක්‍රමයෙන් ගෙවිල යනවා.

වසර කෝටි ගණන් යන කොට වැස්සට හසු වීමෙනුත් රටක ද්‍රව්‍ය ස්කන්ධය බරින් අඩු කරමින් මුහුදට ඇදිල යනවා. මුහුදු පතුලේ මේ රොන් බොර, තට්ටු විදියට තැන්පත් වෙනවා. මේවා යටවෙමින් මුහුද අභ්‍යන්තරයේ වායු නිපදවමින් අධි පීඩනයකට පත් වුණත්, රොන් බොර තට්ටු පසාරු කර ගෙන උඩට එන්න බැරි නිසා තෙල්, අඟුරු හා වායු බවට පත් කරමින් ඒ සැහැල්ලු වායු ආදිය හුළං පුරවපු ටියුබ් සහිත ටයරයක් වගේ, විශාල ඝන පස් තට්ටුවක් පිටින් දරා සිටින වායු පුරවපු බැලූනයක් වගේ පිහිටනවා. මුහුද යට තියෙන බැලූනයක් මුහුදු වතුරේ පීඩනයෙන් උඩට තෙරපනව වගෙයි, මුහුදු පතුල යට තියෙන වායු හා තෙල් උඩට තෙරපීමේ ශක්තියෙන් දිය මතු පිටින් උඩට ඇදෙනවා. සූර්යාලෝකය, වාතය හා ජලය හේතුවෙන් ගොඩ බිම තියෙන ගල් තට්ටුව ක්‍රමයෙන් දිරමින් විවර වෙලා, ඒ තෙල් හා වායු පිටතට එන කොට ගොඩ බිම, මුහුද උඩින් තෙරපා සිටින ශක්තිය හීන වෙලා නැවත මුහුදට ගිලා බහිනවා. ඒ තට්ටුව තුනී වෙනකොට දරා ඉන්න බැරිව ඒ ගල් පර්වතය විශාල කම්පනයකින් පුපුරනවා. එතකොට මහාද්වීපය උස්සගෙන හිටපු තෙල්, වායු ආදී සියල්ලම එතැනින් එළියට ඇවිත් ගිනි ගන්නවා. ඒක මුළු මහාද්වීපයේම ඉඳන් අහස උසට යනකල්ම පැතිරෙන මහ ගින්නක්. මේක හදිසියේ ක්ෂණිකවම ඇතිවන විශාල පරිවර්තනයක්. ඒ නිසා සැතපුම් ගාණක් දුරට මුහුද යට විවිධාකාර රටා හැදෙනවා. ඊට පස්සෙ බොහොම සියුම්ව නැවතත් මහාද්වීප ගොඩබිම් ආදිය හෝදගෙන ඇවිත් රොන් බොර මුහුදේ තැන්පත් වීම සිද්ධ වෙනවා.

මේ විදියට කෙටි කාලයක් තුළ ක්ෂණයකින් ඇති වන්නා වූ මහාද්වීපයක් යට ගිහින් මහාද්වීපයක් උඩ එන අවස්ථාවක් උදා වෙනවා. ඒ අවස්ථාවේ සිද්ධ වෙන කැළඹීමෙන් තමයි, යටගිය මහාද්වීපය වටා විශාල කාබනික තට්ටු කන්දරාවක් ඇති වෙන්නෙ. ඊට පස්සෙ ඒකෙ උඩින් තිබිච්ච රොන් බොර උඩින් නැවතත් කාබනික තට්ටු මිදිල ඒක තමයි ඝනීභවන තට්ටුවක් බවට පත් වෙන්නෙ. ඊළඟට ඒකට එකතු වෙන රොන් බොරත් ඝනීභවන තට්ටු බවට පත් වෙනවා. ඒකෙන් පස් තට්ටු හැදෙනවා. එතකොට කාබනික ද්‍රව්‍ය ගොඩක් තැන්පත් වෙච්ච ප්‍රදේශය තියෙන්නෙ ඒ පස් තට්ටුවේ හුඟක්ම යට. ඒක රත් වෙලා නැවතත් අධික පීඩනයකට අහු වෙලා තමයි තෙල්, වායු, ගල් අඟුරු ආදිය හැදෙන්නෙත්. ඒකෙන් තමයි මහාද්වීපයක් උස්සගෙන ඉන්න වායුව හැදෙන්නෙ. හරියට බැලූන් එකක් ඇතුලෙ තියෙන වායුව වගේ. ඒක රත් වුණාම ඒ වායුව පිටතට ඇවිත් මහද්වීපය උඩට උස්සන්න හදනවා. නමුත් ඒ පස් තට්ටුවේ බරට යට ගිහින්, යට තියෙන කාබනික පස් තට්ටුවට ඇලිල එරිල තියෙන නිසා උඩට එන්නෙ නෑ. ඒ වගේම උඩ තියෙන ඝන පස් තට්ටුව නිසාත් පුපුරල උඩට එන්නෙ නෑ. ඒකෙන් මුළු මහාද්වීපයම උස්සගෙන ඉන්නවා. වසර කෝටි ගණනකට වරක් සිද්ධ වෙන අර වගේ විශාල කැළඹීමකදි තමයි ඒවා උඩට එන්නෙ. ඒ කැළඹීම, මහද්වීපයක් හොල්ලන්න තරම් බලවත් වෙනවා. එතකොට තමයි යටින් සම්බන්ධ වෙලා තියෙන මහද්වීපය ගැලවෙන්නෙ.

**දැන් මේ විදියට මහාද්වීප උඩ යට යෑම වසර කෝටි 100 කින් සිද්ධ වෙන ක්‍රියාවලියක්. මේ මහා භද්‍ර කල්පය තුළත් බොහෝ වාර ගණනක් ඔය ක්‍රියාවලිය සිද්ධ වෙනවා. සාමාන්‍යයෙන් සමාධියට ගෝචර වෙන විදියට ඒක 64 වතාවක් විතර සිද්ධ වෙනවා. ඒ ප්‍රමාණයෙන් දැනටමත් 45 වතාවක් විතර දළ වශයෙන් සිද්ධ වෙලා තියෙනවා. හැබැයි මේ දළ අදහසක් විතරයි. ඉතාමත් ඉහළ සමාධියකට, දිවැසකට තමයි ඒ වාර ගණන හරියටම කියන්න පුළුවන් වෙන්නෙ.**

වසර කෝටි 100 කින් සිද්ධ වෙන මහාද්වීප ගොඩ බිම් මුහුදට ගිලා බැසීමෙන් තෙල්, වායු හා ගල් අඟුරු ඇතිවීමේ ක්‍රියාවලිය ඒ විදියට සිද්ධ වෙනවා. මේ තෙල්, වායු ආදියෙන් බැලූනයක් වගේ පිට තට්ටුවක් හැදෙනවා. ඒ වගේම රොන් බොර ආදිය කාලගුණ සහ භූ විෂමතා ලක්ෂණයන්ට අනුව තැන්පත් වෙලා මුහුදු පතුල එක්තරා රටාවකට හැදිල සකස් වෙනවා. පිටින් තියෙන රොන් බොරවල ඇති වායු (ගෑස්) ගති ඉවතට පිට කරමින් පිටකටුව වගේ කළු ගැහෙමින් ඝනත්වය වැඩි වෙලා මුහුදු පතුලේ පිට පෘෂ්ඨය කළු ගලක් වගේ වෙනවා. ඒකෙ තියෙන දූපත්වල සිප්පි බෙල්ලන් වාසය කරනවා. වසර කෝටි ගණන් මුහුදු මැද දූපත් මේ බෙල්ලන්ගෙ වාසස්ථාන වෙනවා. යම් මොහොතක විශාල විනාශයක් සිද්ධ කරමින් මෙතෙක් කල් මහාද්වීපයක් උඩට තෙරපගෙන තිබිච්ච වායුව හා තෙල් අඩුවීමෙන් බර දරා ගන්න බැරි වෙලා ගොඩබිම මුහුදට ගිලා බැහැල, මුහුදු පතුලේ තවත් තැනකින් වායු (ගෑස්), තෙල් ආදියෙන් පිරිච්ච බැලූනයක් වගේ පොළොව ඒ වායු තලයත් සමග මුහුදින් උඩට මතුකරල ඒ බලයෙන් මතු පිටට නෙරා හිටිනවා.

මේ තමයි ලෝකය මහා ජල ගැල්මකට පත් කරමින් ගොඩබිමක් මුහුදු බත් වෙලා, මුහුදු පතුලක් ගොඩබිමක් වෙන ක්‍රියාවලිය. මේ විදියට යට යන්නෙත්, උඩ එන්නෙත් මහාද්වීප වශයෙන්. එතකොට මුහුදෙ තියෙන දූපත් කියන්නෙ පෙර තිබිච්ච ගොඩබිම්. ඒකෙ තමයි ඔය සිප්පි බෙල්ලන් ආදී සතුන් ඉන්නෙ. නැවතත් මහද්වීපය අර විදියට උඩට ආවම, දැන් ඒ දූපත් ලෝකයේ කඳු මුදුන් විදියටත් පිහිටනවා. එවරස්ට් කන්දෙ පස්වල සිප්පි කටු තියෙන්න හේතුව ඒකයි.

දැන් මේ විදියට ආසන්නම කාලයේ වෙච්ච කම්පනයෙන් තමයි අත්ලාන්තික් මහාද්වීපය යට ගිහින් අත්ලාන්තික් සාගරය ඇති වුණේ. ඒත් එක්කම ඕස්ට්‍රේලියානු මහාද්වීපය යට ගිහින් තිබිල නැවත උඩට ආවා. ඊළඟට ඒ වගේ සිදුවීමක් නැවත වෙන්නෙ එතැන් පටන් අවුරුදු කෝටි 100 ක් සම්පූර්ණ වුණාම. අවුරුදු කෝටි 600 ක් යන්නෙ උඩට ආපු මහාද්වීපයක් නැවත යට යන්න. මොකද මහාද්වීප 6 න් එක් වතාවකට යට යන්නෙ 1 යි. ඒක තමයි අවුරුදු කෝටි 100 කට සැරයක් සිද්ධ වෙන්නෙ. මේ විදියට ඊළඟට යට යන්න තියෙන්නෙ අප්‍රිකානු මහාද්වීපය. මොකද ඒක තමයි දැනට තියෙන පැරණිම මහාද්වීපය. ඒක යට ගිහින් අප්‍රිකානු සාගරය බවට පත් වෙන කොට නැවතත් අත්ලාන්තික් සාගරය මහාද්වීපයක් වෙලා උඩට එනවා. මේ විදියට එක මහාද්වීපයක් යට ගිහින් සාගරයක් බවට පත් වෙන කොට යට තිබිච්ච තවත් සාගරයක් මහාද්වීපයක් විදියට උඩට එනවා.

එතකොට දැනට තියෙන පැරණිම මහාද්වීපය තමයි අප්‍රිකාව. ඒකෙන් තමයි දැනට ලෝකයේ පැරණිම සතුන්ගෙ හා ශාකවල පොසිල හොයා ගන්න පුළුවන් වෙන්නෙ. මොකද ඒක තමයි යට ගිහින් තිබිල උඩට ඇවිත් දැනට අවුරුදු කෝටි 500 ක් පමණ පැරණි මහාද්වීපය. අවුරුදු කෝටි 600 ක් පැරණි වුනාම (තවත් අවුරුදු කෝටි 100 කින් පමණ) ඒක නැවත මුහුදට ගිලා බහිනවා. එතකොට දැනට තියෙන අලුත්ම මහාද්වීපය වන ඕස්ට්‍රේලියාවේ අවුරුදු කෝටි 100-200 ක් වත් පැරණි පොසිල හොයා ගන්න බෑ. කැනීම් කටයුත්තකින්වත් අවුරුදු කෝටි 100 ක් හෝ ඊට වඩා පැරණි පොසිල ඒකෙන් හොයා ගන්න බෑ. එතකොට විද්‍යාඥයො කවද හරි මේ මහාද්වීපවලින් ලෝකයේ පැරණිම පොසිලය කියල එකක් හොයා ගත්තත්, අවුරුදු කෝටි 500 - 600 කට වඩා පැරණි පොසිලයක් කවදාවත් හොයා ගන්න බෑ. මොකද මහාද්වීපයක් යට ගිහින් විනාශ වුනාම ඊට වඩා පැරණි පොසිල ඒ තත්ත්වයෙන් තියෙන්නෙ නෑ. ඒවා දැවිල අළු වෙලා යනවා. ඉතින් ඒ තියෙන පැරණිම පොසිලය අරගෙන ජීවයේ ☞

පටන් ගැන්ම එතැනයි කියල නිගමනය කළොත් ඒක කොච්චර වැරදිද? ඔය විදියට මහාද්වීප උඩ යට ගිහින් තියෙන වාර කොච්චර නම් ඇත්ද? එතකොට මේ මහා භද්‍ර කල්පයටත් පෙර කල්පවලට ගියොත් ඒක අනන්තයට දිව යනව මිසක් කවද කියල පටන් ගැන්මක් හොයන්නද?

දැන් එතකොට අද අපි ගල් අඟුරු, තෙල්, වායු (ගෑස්) කියල ඉවතට ගන්නෙ මහාද්වීපය කියන බැලුනය මුහුදු පතුලෙන් උඩට ඔසවාගෙන හිටින බලය. හැබැයි ඒ විදියට ගන්නෙ අර පතුලෙම තැන්පත් වෙලා තියෙන විශාල කොටස නෙවෙයි. උඩම තියෙන සාමාන්‍ය කොටස් තමයි තෙල්, වායු, ගල් අඟුරු විදියට ගන්නෙ. මොකද යට තියෙන මහ කොටස ගන්න බෑ. ඒක යටම ස්ථරයෙ තියෙන්නෙ. ඒක ගන්නවයි කියන්නෙ මුළු මහද්වීපයම අර වගේ විනාශ වෙනවයි කියන එක. මොකද ඒකෙන් තමයි මහද්වීපය උඩට උස්සගෙන තියාගෙන ඉන්නෙ. හැබැයි ඒ ඇතුලෙ තියෙන කොටසත් පුපුරල එළියට එන කාලයක් එනවා. ඒක තමයි අවුරුදු කෝටි 100 කට සැරයක් සිද්ධ වෙනවයි කිව්වෙ. ඒ අතර කාලෙදි ගන්න තෙල්, වායු ආදිය මතුපිට තියෙන කොටස්වලින් තමයි ගන්නෙ.

එතකොට අදත් ගල් අඟුරු ගන්න කොට ගස් කොළං අතුවල සහ ජීවීන්ගෙ ඇටසැකිලිවල ආකෘතින් ඒවායෙ තියෙනවයි කියන්නෙ, පෙර මුහුදු බත් වෙන්න කලින් ගොඩබිමක තිබිච්ච ගස් කොළං සහ හිටපු සත්තු මුහුදට යට වුනාට පස්සෙ ඇතිවන ප්‍රතික්‍රියාවලදි අධික තාපය ඇති කරමින් අඟුරු බවට පත්වෙච්ච කොටස්. ගස්වැල්, සත්ව කොටස් ආදිය ඔක්සිකරණය වෙන කොට ඒ අභ්‍යන්තරයේ නිදන්ගත වෙලා තැන්පත් වෙලා තිබිච්ච ඒ කොටස් තමයි ජීර්ණ වෙලා තෙල්, වායු, ගල් අඟුරු ආදිය බවට පත් වෙන්නෙ. නැවත ගොඩබිමක් විදියට මතුවෙන්න සකස් වෙන කල් රොන් මඩ නිසා ඒ ද්‍රව්‍ය වස්තු, සත්ව ආදී කොටස් සැතපුම් ගණනාවක් යට වෙලා තියෙනවා. තවත් කොටසක් විශාල කළුගල් සහ තද පස් තට්ටු ඇති කරල, උඩ පස ක්ෂුද්‍ර ජීවීන් සහිත වෙනවා. මෙතැනදි තවත් සැඟවෙච්ච කරුණක් දැන ගැනීම සඳහා මතක් කරල දෙන එක හොඳයි.

අපි එදිනෙදා පරිභෝජනය කරන තෙල්, වායු (ගෑස්), ගල් අඟුරු ආදිය ඒ විදියට හැදෙන්න හේතුව අපි දැනගෙන හිටියෙ නෑ. ලෝකෙන් කාලා ලෝකෙන් පලා යන්න බැරි බවත්, ඒ කාපු ඒවාට කවදා හෝ වන්දි ගෙවන්න සිද්ධ වෙන බවත් මීට පෙර අවස්ථා කිහිපයකදිම පැහැදිලි කළා. මේ කියන්න යන්නෙත් ඒ වගේම කාරණයක්.

කෙනෙකුට ශෝකයක්, කරදරයක් ඇති කරල අනුන්ගෙ ළය තවන ගති ලක්ෂණය ඇති පිරිසක් එදත් හිටියා, අදත් ඉන්නවා. ඒ විදියට ළය තැවීම් නිසා යම්කිසි ශක්තියක් ඒ අය කෙරෙන් ඉවත් වෙනවා. ඒ ඉවත් වෙච්ච ශක්තිය තමයි තැවුණු ළය හෙවත් තෙල් බවට පත්වෙන්නෙ. ඒ වගේම ගැහැට ගති ආශ්‍රය කරන තවත් පිරිසක් එදත් හිටියා, අදත් ඉන්නවා. මේ නිසා ඉවත්වෙන ශක්තිය ගැහැ + අස් හෙවත් ගෑස් බවට පත් වෙලා ලෝකෙට වන්දි ගෙවන්න එකතු වෙනවා. ඒ වගේම ගැවි ගැවී ආශ්‍රය කරපු නිසාත් ගෑ + අස් - ගෑස් කියල අර්ථය එනවා. ඒ තමයි ගැහැට ගති ආශ්‍රය කරපු ගති ලක්ෂණයට අදාල ස්වභාවය. හැබැයි විපාකයට වන්දියක් විදියට ඒකෙනුත් ප්‍රයෝජන ගන්නවා.



වචනය මොන භාෂාවෙන් ආවත් පද නිරුක්තිය සිංහලෙන් දෙන්න පුළුවන් බව මේ වෙනකොටත් පද නිරුක්ති ලිපි පෙළින් පෙන්වල තියෙන නිසා මේ කාරණය දැන් ගැටළුවක් වෙන්න විදියක් නෑ. වැඩි වශයෙන් සමාජයේ ව්‍යවහාර වෙන්නෙ ගෑස් කියන වචනය වුනත් ඒකෙ නියම සිංහල වචනය තමයි වායු කියන්නෙ. ඒකත් පද නිරුක්තිවලින් ඒ ආකාරයටම සම්බන්ධ කරල කියන්න පුළුවන්. ආයු වර්ධනය කරන එක තමයි වා + ආයු - වායුවලින් කරන්නෙ. ඒ කියන්නෙ හුස්ම ගන්න එක. එතකොට ගැවි ගැවී ආශ්‍රය කරන කොට ඇඟට ගෑවිලා ආශ්‍රය කරන එකක් තමයි වායු කියන්නෙ. ඒකෙ තියෙන්නෙ ජීව ශක්තිය. ජීව වායුව කියල කියන්නෙත් ඒකයි. ඒ තිබිච්ච ශක්තිය තමයි අද වායු (ගෑස්) කියල ගන්නෙ. විස වායු සහ විස නොවන වායු කියල ඒකෙත් කොටස් 2 ක් තියෙනවා. උදාහරණ විදියට මීතෙන් වගේ වායු හරි විසයි.

ඒ වගේම පංච දුශ්චරිතයේ ගෑවී ඇලී අල්ල ගෙන සිටින කොටසක් එදත් හිටියා, අදත් ඉන්නවා. ඒ හේතුවෙන් ඒ ශක්තිය ගිහින් ගෑ + අල් හෙවත් ගල් විදියට තැන්පත් වෙනවා. ඒත් සමගම අනුන්ට අනින්න, රිදවන්න "අංග" පාවිච්චි කළා. අංග ගුරු කරගෙන තමයි ඒව සිද්ධ කළේ. ඒ විදියට අංග ගුරු කරගත් නිසා අංග + ගුරු අඟුරු වුණා. ගල් අඟුරු හැදුනෙ මේ විදියට. ඊළඟට කෙනෙකුගෙ සිහිය අප්‍රිය කරපු පිරිසක් එදත් හිටියා, අදත් ඉන්නවා. සිහිය අප්‍රිය කරනවයි කියන්නෙ, මේ දේ කළොත් හොඳක් වෙනවා, මේ දේ කළොත් නරකක් වෙනවා කියල දකින හැකියාව නැතිවෙන විදියට කටයුතු කිරීම. පංච කාමයට ලොල් වෙන විදියෙ වැඩ කටයුතු දියත් කළාම සිහිය අප්‍රිය වෙනවා. ඒ හේතුවෙන් ඇතිවන ගති ලක්ෂණයෙන් තමයි සිහි + අප්පි - සිප්පි හැදෙන්නෙ. ඒ වගේම ක්ෂය වෙන හෙවත් පහත් දේවල් දරපු පිරිසක් එදත් හිටියා, අදත් ඉන්නවා. ක්ෂුද්‍ර වැඩ කියන්නෙ ඒ වගේ පහත් වැඩවලට. ක්ෂ + උද් + දර - ක්ෂය වූ දේ දරපු නිසා, පහත් දේවල් උස්සගෙන දරා සිටීම නිසා ක්ෂුද්‍ර ජීවීන් ඇති වෙනවා.

දැන් මේ ඔක්කොම හැදිල තියෙන්නෙ එදා ලෝකෙ කාපු හේතුවට වන්දි ගෙවන්න. එතකොට මේ තෙල්, වායු (ගෑස්), ගල් අඟුරු... ආදිය හැදිල තියෙන්නෙ, එදා අර කියපු දුශ්චරිත වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරපු සහ ඊට සහාය වෙච්ච පිරිස්වල ඇටසැකිලි සහ ශාකත් අනෙක් හැම දෙයක්මත් සම්බන්ධ වෙලා. ඒ කරපු දේවල්වලට මැරිලත් වන්දි ගෙවෙන්නෙ මේ විදියට. ක්ෂුද්‍ර ජීවීන් සහ සිප්පි බෙල්ලන් කරන්නෙත් ඒ වන්දිය ගෙවන එක. **ලෝකයට කවද හරි අඩුවක් කළොත් ඒක නැවතත් ලෝකයට දෙන්න ක්‍රමයක් හැදෙනවයි කියන කාරණය න්‍යාය ධර්මයක්. ඒකට තමන්ම වන්දිය ගෙවනව මිසක් කාටවත් භාර දෙන්න බෑ. ඒ ක්‍රමයෙන් තමයි ලෝකයක් සමතුලිත වෙන්නෙ.**

මෙතනදි දැනගන්න ඕන අනෙක් විශේෂ කාරණය තමයි, රහතන් වහන්සේලා පිරිනිවන් පෑවට පස්සෙ උන්වහන්සේලාගේ දේහයන් මේ විදිහට තෙල්, වායු (ගෑස්), ගල් අඟුරු ආදිය බිහි වෙන්න සම්බන්ධ නොවන බව. මොකද උන් වහන්සේලා රහත් වෙන කොට අනාගාමී අවස්ථාව පහු කරලයි රහත් වෙන්නෙ. එතකොට අනාගාමී බවට

පත් වෙන කොට සිද්ධ වෙන ප්‍රධාන කාරණයක් තමයි අප්‍රමාණ මෛත්‍රියක් බිහි වීම. ඒ වගේ කෙනෙක්ගෙ හිත අප්‍රමාණ මෛත්‍රී සහගතයි. ඒ හේතුවෙන් ඊට පෙර තමන්ගෙන් ලෝකයට වෙච්ච අවැඩ අසාධාරණකම් සියල්ලටම (ආනන්තරික පාප කර්ම හා සමහර ආර්යෝපවාදවල ශේෂ මාත්‍රයන් හැර) වන්දි ගෙවෙනවා. ඒ නිසා අනාගාමී ඵලයෙ උපරිමයට යන කොට ඒ අයගෙ ප්‍රධාන වන්දිය ගෙවිල ඉවරයි. අරිහත් වෙන කොට ඒ ප්‍රධාන වන්දියේ ශේෂ මාත්‍රයක් තිබුණ නම් ඒකත් ගෙවිල ඉවර වෙනවා. ඒ නිසා අරිහතුන් වහන්සේලා ලෝකයට ණය නෑ. අරිහතුන් වහන්සේ නමක් පිරිනිවන් පෑවට පස්සෙ සිද්ධ වෙන්නෙ ශරීරය ධාතු බවට පරිවර්තනය වීම. ධාතු කියන්නෙ දැවීමේ පරිවර්තනයක්. හැබැයි මෙතන දැවීම කියල කිව්වෙ දහනය වීම, පිච්චීම විතරක් නෙවෙයි. යම් කිසි ආකාරයක තිබුණු තණ්හා තත්ත්වයන් දහනය වෙලා ගෙවිල ගිහින් නිරෝධ නම් වූ විපර්යාසයට පත්වීමත් දැවීමක්.

උදාහරණ විදියට පනාවක් පිච්චුවාම මුලින්ම සිද්ධ වෙන්නෙ උණුවෙලා කැටිවෙන එක. ඒ වගේ පරිවර්තනයක් තමයි මෙතන සිද්ධ වෙන්නෙත්. ඒ කියන්නෙ අලුත් වීමක් නෙවෙයි පරිවර්තනය වීමක්. නිබ්බාන ධාතුව කිව්වත් එතැන ධාතු කියන වචනය සම්බන්ධයි. නමුත් මෙතන කියන්නෙ පරිවර්තනය වෙලා අන්තිම කෙළවරට ගියාට පස්සෙ හිත්වලින් දැවීමේ අවසානය. ඒ කියන්නෙ දැවිය යුතු කොටස දැවිල ඉවරයි. රාගයෙන් රත් වෙච්ච දෙයක්, ද්වේශයෙන් දැවෙන දෙයක් ගිනි ගන්න පුළුවන්. නමුත් වීත රාගී, වීත දෝෂී ගුණයන්ගෙන් යම් දෙයක් වට කළොත් ඒක ගින්නෙන්, ජලයෙන් විනාශ කරන්න බැරි තත්ත්වයට පත් වෙනවා. ඊට පස්සෙ ඒකට උරුම යම්කිසි ශක්තියක් තියෙනව නම්, ඒක තුළින් විසිරිලා විශ්වයට නිදහස් වෙලා යනවා. රහත් උත්තමයෙකුගෙ දේහය ආදාහනය කරන කොටත් සිද්ධ වෙන්නෙ මේ වගේ දෙයක්.

අද කාලෙ මේ වගේ දෙයක් දැක බලා ගැනීම දුර්ලභ වුණත්, ඒ වගේ ආශ්චර්යමත් සිදුවීමක් මීට අවුරුදු 5 - 6 කට විතර උඩදි ලංකාවෙ එක්තරා ප්‍රදේශයක සිද්ධ වෙච්ච පුවතක් පැහැදිලිවම දැන ගන්න ලැබුණා. නමුත් ඒ කාරණය බොහොම අප්‍රකටයි. ඒ වගේ උත්තමයෙක් තමන්ගෙ වැඩේ නිහඬවම කරගෙන, නිහඬව සේවයක් කරල අවසන් මොහොතෙදි සසර කෙළවර කරපු එක් අවස්ථාවක් තමයි ඒ. එතනදි උන් වහන්සේගෙ දේහය සාමාන්‍ය ශරීර වගේ පිච්චිලා අළු වුනේ නෑ. වඩපු ශක්තියට අනුකූලව ශරීර සැකිල්ල ඉතිරි වෙලා ධාතු බවට පරිවර්තනය වුණා. ඒ වගේම විශේෂයෙන් බුරුම රටේ වැඩ වාසය කරපු භික්ෂූන් වහන්සේලා කිහිප නමක් මීට අවුරුදු කිහිපයකට උඩදි අරිහත්වයට පත් වෙලා පිරිනිවන් පෑමෙන් පස්සෙ, උන් වහන්සේලාගේ දේහයන් විවිධ වර්ණවලින් යුත් ධාතුන් බවට පරිවර්තනය වෙච්ච අවස්ථා කිහිපයක්ම පසුගිය කාලයේ පොත්පත්වලින් පැහැදිලිවම දැක ගන්න ලැබුණා. මේ වගේ සිදුවීම් ඉදිරි අනාගතයෙදි මීටත් වඩා වැඩියෙන් අහන්න ලැබේවි. ඒ සම්බන්ධ මග සලකුණු තමයි මේ ටික ටික මතුවී ගෙන එන්නෙ.

ඒ වගේම අනාගාමී, සකෘදාගාමී, සෝවාන් වෙච්ච අය ගත්තත්, ඒ අයගෙ



ශරීරත් තෙල්, ගල්, අඟුරු ආදිය නිපදවීමට සම්බන්ධ වෙන්නෙ නෑ. මොකද ඔය කියන මහාද්වීප උඩ යට යාමෙන් වෙන විනාශයක් සිද්ධ වෙන්නෙ අබුද්ධෝත්පාද කාලයක. ඒ කාලයට බුද්ධ ශාසනයක් නෑ. ඉතින් අබුද්ධෝත්පාද කාලයක මේ කියන මගඵල ලාභීන් කොහොමටවත් මේ මනුස්ස ලෝකෙ නෑ. ඒ නිසා ඒ මගඵල ලාභීන් බුද්ධෝත්පාද කාලයක මිය ගියත් ශරීර නිකං පොළවට දිරල යනව මිසක් අර වගේ තෙල්, ගල් අඟුරු ආදිය හැදෙන්න සම්බන්ධ වෙන්නෙ නෑ. මොකද ඒ වගේ දේවල් හැදෙන්න මුල පිරෙන්නෙ එවැනි මහාද්වීප උඩ යට ගිහින් විනාශයක් සිද්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන්. ඒ වගේ කාලෙකට මැරෙන අයගෙ ශරීර විතරයි ඒකට සම්බන්ධ වෙන්නෙ. ඒකත් ධර්මතාවයෙන්ම සිද්ධ වෙන දෙයක්. හැබැයි ඒ වගේ කාලයක වුනත් පසේ බුදුවරයන් වහන්සේලා වැඩ ඉන්න පුළුවන්. නමුත් උන් වහන්සේලා අනිවාර්යයෙන්ම අභිඥාලාභීන්. ඒ නිසා උන් වහන්සේලාට තියෙන සෘද්ධි අභිඥා බලය නිසා ඒ වගේ විනාශයකට ගොදුරු වෙන්නෙ නෑ. ඒ සෘද්ධි බලයෙන් ඒ වගේ කාලයකට වෙනත් දේව, බ්‍රහ්ම කියන ඕනෑම ලෝකයකට වඩින්න පුළුවන්. ඒ නිසා කොහොමටවත් උන් වහන්සේලාගේ දේහයන් ඒ වගේ දේකට සම්බන්ධ වෙන්නෙ නෑ.

දැන් එතකොට කලින් විග්‍රහ කරපු ආකාරයට සාගර පතුලක් මහාද්වීපයක් විදියට මතු වුණාම, ජලාශ්‍රිතව හිටපු සතුන්ගෙ සිරුරුත් ඒ රොන් බොර තුළට වැද්ද ගන්නවා. ලුණු මිශ්‍රවත්, සුළං නොවදින ලෙසත් ආවරණය වීමෙන් මතු පිටට ඇවිත් වියළිලා ගියාම ඒවා පොසිල පාෂාණ නමින් හඳුන්වනවා. ඊට පස්සෙ නැවතත් පොළව සූර්යාලෝකය, වාතය හා ජලය සමග වසර කෝටි ගණනකදි සංයෝග වෙලා ක්‍රියාත්මක වෙමින් ගස්වැල් හා සතර අපාගත සතුන් සංසේදජ ලෙසට බිහිවෙනවා. ඒ බිහිවෙන්නෙත් සත්ත්වයන්ගෙ සිතිවිලි, ක්‍රියා, වදන් අනුව ගොඩනැගෙන පටිච්ච සමුප්පාද සිද්ධාන්තයකට අනුව. (පටි - බැඳීම, ඉච්ඡ - කැමැත්ත, සම් + උද්පාද - සමාන උත්පාදනය - කැමැත්තෙන් බැඳීම නිසා ඊට සමානව සිදුවන උපත)

නමුත් ඉහත කියපු විදියට ධර්මානුකූලව සිද්ධ වෙන ලෝක ක්‍රියාවලිය අද වෙනකොට මිනිසාගේ නව සොයා ගැනීම් විදියටත් හඳුන්වනවා. ඒ වගේම අලුත් මහාද්වීප සොයා ගත්ත කියල හිතාගෙන නැවත ඒවායේ පදිංචි වෙනවා. මේ විදියට සියලු මහාද්වීප එකවරම විනාශ නොවන නිසාත්, වසර කෝටි සියයකට වරක් සිද්ධ වෙන ක්‍රියාවලියක් නිසාත් අපට වෙනසක් පේන්නෙ නෑ. මේ විදියට දැනට තියෙන පොසිල හැර, අනාදියේ තිබ්බ මිනිස් ඇටසැකිලි, මිනිස් පොසිල, ශාක කොටස්, පාෂාණ ආදිය ලෝකයේ කිසි දිනක හොයාගන්න බෑ. ඒවා නැවත ඇති වෙන්නෙත් නෑ. මොකද දැන් ඒවා තෙල්, වායු, ගල් අඟුරු ... බවට පත්වෙලා දැවිල අළුවෙලා ඉවරයි. සමහර විට ගල් අඟුරු ආකර පරීක්ෂා කළා නම් ඇටසැකිලි, ශාක කොටස් සොයා ගන්න පුළුවන්. ඒත් එක්තරා සීමා සහිත කාලයකට යන කල් විතරයි. ඉන් එහාට සාක්ෂි භෞතිකව හොයා ගන්න බෑ. ඉතින් දැනට තියෙන පරණම පොසිලය හොයා ගෙන, ඒවා කාබන් සමස්ථානිකයෙන් කරන කාල නිර්ණ පරීක්ෂණයකට භාජනය කරල, පෘථිවියේ වයස බිලියන මෙච්චරයි

කියල කියනවා. නමුත් ඒ පරණම පොසිලයටත් පෙර තිබ්බ්ච පොසිල කොටස් දැන් විද්‍යමාන වෙන්නෙ නැති නිසා ඒ නිගමනය වැරදියි. ඒක දිවැස් තියෙන මහා අභිඥාලාභී උත්තමයෙක් ඒ බලයෙන් අතීතය සිහි කරල කිව්වොත් මිසක් විද්‍යා උපකරණවලින් භෞතිකව හොයන්න පුළුවන් දෙයක් නෙවෙයි.

අනෙක් අතට ඩාවින් නම් විද්‍යාඥයාට අනුව මනුස්සයා පැවතෙන්නෙ වඳුරා කියන තිරිසන් සතාගෙන්ලු. අද ලෝකයේ හැම තැනම වගේ උගන්වන්නෙත් ඒ මතවාදය. හැබැයි මේ විදියට, මනුස්සයා වඳුරගෙන් පැවත එනවයි කියන කාරණය ඔප්පු කරන්න කිසිම අතරමැදි සත්ත්වයෙක්ගෙ සාක්ෂියක් නෑ. ඒ මතයෙන් කියන්නෙ කායික පරම්පරාව පරිවර්තනය වෙලා සිද්ධ වෙන වෙනස් වීමක් ගැන. ඒ සතාගෙ පැටියා වෙනස් වෙනවා, ඊළඟ සතාගෙ පැටියා වෙනස් වෙනවා, ඊළඟට එන සතාගෙ පැටියා වෙනස් වෙනවා... ආදී වශයෙන් සිද්ධ වෙන පරිවර්තනයක් තමයි මේ මතයෙන් කියන්නෙ. නමුත් ඔය කියන කිසිම සතෙකුගෙ පරිවර්තනයේ අතරමැදි අවස්ථාවක් එදා හිටියයි කියල ඔප්පු කරලත් නෑ, අද දැක බලා ගන්නත් නෑ. ඒ මතයේ හැටියට ඊළඟ සත්ත්වයෙක් වඳුරෙක් වෙන අවස්ථාවක් හෝ වඳුරෙක් මිනිහෙක් වෙන අවස්ථාවක් තිබිය යුතුයි. නමුත් එහෙම අතරමැදි අවස්ථාවක් හොයා ගන්න නෑ.

අනෙක් කරුණ තමයි මේ කියන පරිණාමවාදයට අනුව පරිණාමයේ මුල් අවස්ථාවක් සහ පරිණාමය වෙලා අවසන් වෙන අවස්ථාවක් තිබිය යුතුයි. නැත්නම් අතරමැදි අවස්ථාවක් හෝ තිබිය යුතුයි. නමුත් ඒ කතාව සත්‍ය නම් වඳුරා පරිණාමය වෙන්න පටන් ගත්තු මුල් කාලයේ මිනිස්සු ජීවත්වෙලා ඉඳල තියෙන්නත් බෑ. එතකොට කොහොමද මේ මහා භද්‍ර කල්පයේම මීට පෙර වැඩ හිටපු බුදුවරුන්ගෙ කාලයේ දහස් ගණනින් මිනිස්සු බණ අහල නිවන් දැක්කෙ? ඔය කියන කතාව ඇත්ත නම් ඒ කාලෙ බණ අහන්න ඉඳල තියෙන්නෙ මනුස්සයො නෙවෙයි, වඳුරො විතරයි.

ඊළඟට මෙහෙම පරිණාමය වෙලා ගිහින් කවද හරි දවසක පරිණාමය ඉවර වුණාම එදාට වඳුරන් ඉන්න විදියකුත් නෑ. මනුස්සයො විතරයි ඉන්න ඕන. අනෙක අද අපිට ඇස් දෙකටම බලාගන්න වඳුරොත් ඉන්නවා, මිනිස්සුත් ඉන්නවා. නමුත් ඔය පරිණාම කතාව අනුව මේ දෙගොල්ලන් අතර පැහැදිලි සම්බන්ධයක් ගොඩනගන්න පුළුවන් අතරමැදි අවස්ථාවන් නෑ. හැමදාම ඔය කියන වඳුරොත් ඉන්නවා, මිනිස්සුත් ඉන්නවා. ජීවිත කාලයකදි ඒ වඳුරන් ජීවත් වෙලා මැරිල ගිහින් නැවතත් මොකක් හෝ අත් බවයක් ලබනව මිසක් කයේ සිදුවන පරිණාම අවස්ථාවක් කෝ? කෝ අලුතින් ඉපදෙන වඳුරන්ගෙ පරිණාම අවස්ථා? **මානේන මක්බටෝ හෝති අධිමානේන කුක්කුටෝ - මානයෙන් වඳුරෙක් වේ, අධි මානයෙන් බල්ලෙක් වේ. වඳුරෙක් වෙන්නත්, බල්ලෙක් වෙන්නත් හේතුව මනුස්සයගෙ තියෙන මානය සහ අධි මානය. මේ තමයි බුද්ධ දේශනාව. වඳුරෙක් ලෝකයට පහළ වෙන්නෙ ඒ සංඛාර වැඩීමෙන්. එතකොට මනුස්සයො මාන්නක්කාර වෙලා වඳුරො බිහි වෙනව මිසක් වඳුරගෙන් මනුස්සය බිහි වුණා නෙවෙයි.**



ඒ වගේම මීට පෙර අවස්ථා කිහිපයකදිම බල්ලෙක් වෙන ආකාරය විස්තර කළේ, සත් පුරුෂයන්ගෙ සත් බස අළු කිරීමෙන් බහ + අළු - බලු වුණා කියල. දැන් ඒ කාරණය මෙතනට ගලපන්නෙ කොහොමද කියල කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්. මෙතනදි අධි මානය කියන ගති ලක්ෂණයේ ස්වභාවය තමයි තමන්ගෙ මමත්ත්වය අධික වීම. එතකොට තමන් කියන එකයි හරි, අනෙකා කියන දේ වැරදියි කියන මතයේ දැඩිව එල්බගෙන ඉන්නවා. ඒ දෘෂ්ටිය ජය ගන්න ඕන නිසා ඊට පස්සෙ තමයි සත්පුරුෂයන් හඳුන්වා දීපු ගුණධර්ම, සත්බස විනාශ කරල අළු කරල දාන්න ඒවාට පහර ගහන්නෙ. තමන්ගෙ තියෙන අධිමාන්නක්කාර ගතිය නිසා කොහොම හරි ඒ සත් බස වනසන්න, අළු කරන්න ඕන කියන දෘෂ්ටියට බහිනවා. ඒ දෘෂ්ටිය ගලේ කෙටුව අකුරක් වගේ මුල් බැහැගෙන ඊට අනුව කටයුතු කරනවා. යථාර්ථය පිළිගන්නෙ නැතිව, ඒ අනුව කටයුතු නොකර ඒකට පහර ගහනවා. ඒ විදියට බස අළු කරල බලු උප්පත්තියක් හට ගන්න මුල් වෙන්නෙ අධිමාන්නය. එතකොට මානයට වඩා අධි මානය බලවත් නිසා වඳුරට වඩා බල්ල නීචයි.

අනෙක් කාරණය තමයි මේ පරිණාමවාදී කතා මිනිස්සු අතර නොයෙක් දුශ්චරිත ගොඩ නැගෙන්න හොඳ උල් පන්දමක් වෙනවා. මොකද ඒ මතයන්ට අනුව පිං පව්, හොඳ නරක ගැන කිසිම විශ්වාසයක් නෑ. පිං පව්, හොඳ නරක කියල මොනව කළත් උපන් සතා ගස්වැල් වගේ මැරිල යනව කියනව මිසක් නැවත පහල වීමක් ගැන විශ්වාස කරන්නෙ නෑ. එතකොට ඒ මතය විශ්වාස කරන අය, තමන් ජීවත් වෙන කාලය ඇතුලත ඕනෑම දුෂ්චරිත වැඩක් කරන්න පෙළඹෙන්න පුළුවන්. එහෙනම් මේකත් මුසාවාදය යටතේ එන උච්ඡේද වාදයටමයි වැටෙන්නෙ. ඒ කියන්නෙ දස වස්තුක මිත්‍යා දෘෂ්ටියෙන් එකක්. ඒකෙ අවසන් ප්‍රතිඵලය තමයි සතර අපාගත උප්පත්තිය.

මෙතනදි යමෙක් මියගියාට පස්සෙ, පෙර තිබ්බ්ච කර්මයක් නැවත විපාක දෙන්න ඉදිරියට එන්නෙ කොහොමද කියල කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්. කෙනෙක් මියගියාම ඒ පුද්ගලය කරපු කර්ම අතීත ස්කන්ධයන්ට එකතු වෙනවා. එතකොට ඒ ස්කන්ධ නාම ගෝත්‍ර වශයෙන් සකස් වෙනවා. නාම ගෝත්‍ර දිරන්නෙ නෑ. නාම ගොත්තං නජීරතී කියල කිව්වෙ ඒකයි. මතක සටහන් කියල කියන්නෙත් ඒවට. ඒකට කර්ම භවය කියලත් කියනවා. වේදනා ස්කන්ධෝ, සඤ්ඤා ස්කන්ධෝ, සංඛාර ස්කන්ධෝ, විඤ්ඤාණ ස්කන්ධෝ අයං වුච්චති කම්ම භවෝ සබ්බම්පි භවගාමී කම්මං කම්ම භවෝ කියල පෙන්වන්නෙ ඒ කාරණය. ඒ කියන්නෙ වේදනා ස්කන්ධය, සඤ්ඤා ස්කන්ධය, සංඛාර ස්කන්ධය, විඤ්ඤාණ ස්කන්ධය කියන මේවා කර්ම භවය වෙනවා. සියලුම භවයන් හට ගන්වන කර්ම තියේ නම් ඒ සියල්ලම කර්ම භවයේ පිහිටනවා. ඒකෙන් තමයි විපාක දෙන්න ඇදිල එන්නෙ.

ඊළඟට පරිණාමවාදයේ තවත් එහාට ගිහින් බලන කොට, ඒ අය කියන්නෙ මුල් කාලයේ ඒක සෛලික ක්ෂුද්‍ර ජීවීන් හා මුහුදු ජීවීන් හැරෙන්න වෙනත් සතුන් ජීවත් වෙලා නෑ කියල. ඒ අය එහෙම කියන්න හේතුව මොකක්ද? අර කලින් විග්‍රහ කරපු විදියට මහාද්වීපයක් මුහුද යට ගිහින් නැවත ☞

ගොඩබිමක් උඩට එන කොට, ඒ ගොඩබිමේ පොසිලවල මුහුදු ජීවීන් හැර වෙනත් ඇටකටු සහිත සතුන් ඒ අයගෙ පරීක්ෂණවලට හමුවෙලා නෑ. මුහුදක් ගොඩබිමක් බවට පත් වෙනකොට කැල්සියම් ආදී කොටස් මිදිල හට ගත්තු පොසිල තමයි ඒ අයගෙ පරීක්‍ෂණවලට පදනම වෙන්නෙ. ඒව තමයි ආදී පොළවෙ තිබිච්ච ද්‍රව්‍ය වස්තු කියල ඒ අය ගන්නෙ. ඒවායේ තියෙන ක්‍ෂුද්‍ර ජීවී ආදී කොටස් අරගෙන තමයි පෘථිවියේ මුල්ම ජීවීන් මුහුදු ක්‍ෂුද්‍ර ජීවීන් කියල නිගමනය කරන්නෙ. මොකද එයින් එහාට දෙයක් ඒවායින් හමුවෙන්නෙ නෑ. මේ නිසා ඒ මතම පදනම් වෙලා ඒ අය නිගමනය කරනවා, මුල් කාලයේ මුහුදු ජීවීන් හැර වෙනත් සතුන් ජීවත් වෙලා නෑ කියල. මොකද අර සිද්ධ වෙන ක්‍රියාවලිය දන්නෙ නැති නිසා.

නමුත් මෑතකදී හොයා ගත්තයි කියන සමහර ඉතා පැරණි පොසිලවල තිබිල මිනිස් අඩි පවා හමු වෙලා තියෙනවා. හැබැයි විද්‍යාඥයන්ගෙ පරිණාමවාදී මතය අනුව ලෝක ආරම්භ වෙච්ච මුල් කාලෙ ඉඳල තියෙන්නෙ ඒක සෛලික ජීවීන් විතරයි. එතකොට ඒ අයගෙ මතය අනුව මිනිස්සු තියා වඳුරෙක්වත් ඒ කාලෙ ජීවත් වෙලා තියෙන්න බෑ. මොකද ඊටත් වඩා එහාට ගිය ඈත කාලයක් ගැන තමයි මේ කියන්නෙ. එතකොට ඒකෙන්ම ඒ මතය බිඳ වැටෙනවා. එහෙනම් ඒ කාලෙ ක්‍ෂුද්‍ර ජීවීන් විතරක් නෙවෙයි මිනිස්සුත් ඉඳල තියෙනවා.

ඉතින් අපි දන්න කාලෙක ඉඳන් පාසල්වලයි පන්තිවලයි උදේ ඉඳන් හැන්දෑ වෙනකල්ම කාලය, ශ්‍රමය, මුදල් වැය කරගෙන ඉගෙන ගත්තෙ මොනවද? ඒවායින් අවසානයේ ලබා ගත්තු ප්‍රතිඵල මොනවද? අඩු තරමින් ලෞකික වශයෙන් හෝ දියුණුවක් ඒකෙන් ලබා ගන්න පුළුවන් වුණාද? අහස් යානයක් හෝ මොකක් හරි යන්ත්‍ර සූත්‍රයක් හැදුව නම් ලෞකික වශයෙන් මොනව හරි ප්‍රයෝජනයක් සිද්ධ වෙනවා. නමුත් මේ කියන පරිණාම වාදයෙන් මොකක්ද සිද්ධ වුණේ?

ලෝකයේ කලින් කලට පහල වෙන දිවැස්, අභිඥා වඩපු ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී උතුමන් යම්කිසි යහපත් ධර්මයක් ලෝකයාට දේශනා කරනවා. ඒ අතරින් ලොව අති දුර්ලභව පහල වෙන ලොව්තුරා බුදුවරයන් වහන්සේලා සියලු දුක් කෙළවර කරන්නා වූ ප්‍රණීත වූ ශ්‍රී සද්ධර්මය දේශනා කරනවා. ඒ දහම පැත්තකට දාල තමන්ගෙ මතයක් හෝ ආචාර්ය වාදයක් අරගෙන, ඒක ඔප්පු කරන්න විවිධ පර්යේෂණ ගවේෂණ කරමින් කාලයත්, ශ්‍රමයත් නිකරුණේ අපතෙ යවල, ඉන්න මිනිස්සුත් මංමුළා කරල පඟගාලක පටලවල, යන්න තියෙන සුගතිගාමී මාර්ගයත් වහගන්න එක තමයි අන්තිමට සිද්ධ වෙන්නෙ. පර්යේෂණ, විමර්ශන කරන්න එපා කියන එක නෙවෙයි මේ කියන්නෙ. අර කියපු ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී උත්තමයන් විසින් ලෝකානුකම්පාවෙන් හේතු සාධක සහිතව පෙන්වා දුන් දහම විකෘති නොකර, සත්ත්වයාගේ මෙලොව පරලොව යහපතට හේතුවන පර්යේෂණ, විමර්ශන ඥානාන්විතව සිදු කරනව නම් මොනතරම් යහපතක් ද? ඉතිං මේ වෙනකල් මේ බටහිර විද්‍යාඥයන්ගෙ මතයන්ට වහල් වෙලා හිටිය මිසක් ඒ ගැන දහමට අනුව විමර්ශනය කරන්න පෙළඹුණේ නෑ. නමුත් දැන් ඒ ගැන නැණ නුවණින් හොයල බලල සත්‍යය යථාර්ථය තෝර ගන්න කාලය ඇවිත් තියෙනවා. ඒ ගැන මේ වෙන කොටත් වෙනදට වඩා කතාබහට ලක් වෙනවා. ඒ නිසා මේ පොළවෙ අතීතය බලන්නත්, සත්වයින්ගෙ ආදී මූල හොයන්නත් කරන පර්යේෂණ යම් දිනක බුදු වදන් මගින් සත්‍යය යථාර්ථය වටහාගෙන එළිදක්වීම සිද්ධ වේවි. එහෙම ඉදිරියේදි සිද්ධ වෙන්න පුළුවන් යහපත් පෙරළියක මග සලකුණු මේ වෙන කොටත් මතුවෙමින් තියෙනවා.

කරුණු මෙහෙම නම්, සසර සත්ත්වයාගේ පැවැත්ම බුදු දහමට අනුව සිද්ධ වෙන්න ඕන කොහොමද ? යමෙක් මවු කුසකින් බිහි වෙලා උපත ලබන කොට සම්මත වූ උපත, ජාති හට ගැනීම... ආදී නම්වලින් හඳුන්වනවා. එහෙම ඉපදිලා වසර හැට හැත්තෑවක්, සියයක් හෝ ගිහින් ස්වභාවිකව, එහෙම නැත්නම් ආබාධයකින් හෝ හදිසි අනතුරකින් සිද්ධ වෙන සම්මුති මියයාම මරණය ලෙසත් හඳුන්වනවා. මේ තමයි ලෝකයේ ව්‍යවහාර වෙන උපත සහ මරණය. ඒ වගේම පරමාර්ථ වශයෙනුත් ජාති සහ මරණයක් තියෙනවා. ඒක චිත්තක්‍ෂණයක් පාසාත්, රූපක්‍ෂණයක් පාසාත් සිද්ධ වෙනවා. රූප ස්කන්ධයන්ගේ හෙවත් සත්ත්ව/පුද්ගල, ද්‍රව්‍ය/වස්තු වශයෙන් පවතින ලොකු, කුඩා, දුර, ඈත, පෙනෙන, නොපෙනෙන යම් තාක් දේ ඇත්ද, ඒවායේ ක්‍ෂණයක් පාසා වැනසීම හෙවත් මරණය සිද්ධ වෙනවා. නමුත් ඒක අපේ මස් ලේ ඇහැට පේන්නෙ නැති තරම් සියුම් ක්‍රියාවලියක්. එක ජාතියක මරණය තවත් ජාතියක ඉපදීමක්. තවත් විදියකින් කියනව නම්, එක් ආකාරයක වෙනස් වීමක් තවත් ආකාරයක හටගැනීමක්.

මේ විදියට බුද්ධ දේශනාව පරිදි අවිද්‍යාව නිසා සංස්කාරයෝ හටගන්නවා (මෙතන සංස්කාර හෙවත් සංඛාර කිව්වෙ ''සං'' කියන එකතුව සඳහා කයින්, වචනයෙන්, මනසින් කරන ක්‍රියාවන්) උපන් සංස්කාරයෝ ඒ ඒ මොහොතෙම වැනසෙනවා. ඒ කියන්නෙ ක්‍ෂණික මරණ හෙවත් අවස්ථා මරණ. ඊළඟට සංස්කාර නිසා විඤ්ඤාණ උපදිනවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. විඤ්ඤාණ නිසා නාමරූප උපදිනවා. ඒවත් ක්‍ෂණයක් පාසා මියයනවා. නාම රූප නිසා සළායතන උපදිනවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. සළායතන නිසා ස්පර්ශ හටගන්නවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. ස්පර්ශ නිසා වේදනාව උපදිනවා. (විඳීමක් දනවන්නේ - වේදනාව) ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. වේදනාව නිසා තණ්හා උපදිනවා. (ඒ ඒ තැන හා වීම - තණ්හා) ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. තණ්හා නිසා උපාදාන හටගන්නවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. (පටිච්ච සමුප්පාදයේ එන උපාදානයට මේ කාරණය එකගයි. මේ ක්‍රියාවලිය හේතු ප්‍රත්‍ය, අඤ්ඤ මඤ්ඤ, සම්ප්‍රයුක්ත වශයෙන් හටගෙන ඒකාරම්මන - ඒක වස්තුක, ඒකුප්පාද - ඒක භංග කියන හතරාකාරයෙන් ක්‍රියාත්මක වෙනවා.

මේවා කෙටියෙන් කියනව නම් ඒකාරම්මන කියන්නෙ එක අරමුණක් කියන එක. ඒක වස්තුක කියන්නෙ ඒ එක අරමුණට ගෝචර වෙන්නෙ චක්ඛු වස්තු, සෝත වස්තු ආදී වශයෙන් කියන මොකක් හරි අනුකූල එක වස්තුවක් කියන එක. ඒකුප්පාද කියන්නෙ ඒවා එකටම උපදිනවයි කියන එක. ඒක භංග කියන්නෙ ඒ සියල්ලම එකට භංග වෙනවයි කියන එක. මේ පිළිබඳ වැඩි විස්තර වෙනම ලිපියකින් බලාපොරොත්තු වන්න.) ඊළඟට උපාදාන නිසා භව උපදිනවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. භව නිසා ජාති උපදිනවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. ජාති නිසා රාග, ද්වේශ, මෝහ, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස උපදිනවා. ඒවත් ක්‍ෂණයක් පාසාම මියයනවා. අවසානයේ මහා මරණය සිද්ධ වෙනවා. ඇත්ත නොවැටහෙන නිසා අවිද්‍යාව ඉදිරියටත් පවත්වනවා. අවිද්‍යාවත් ඒ ඒ දේවල් අල්ලන විදියට සත්‍යය මුවා කරමින් ඒ සමගම මියයනවා. ඊළඟට අවිද්‍යාවටම සම්බන්ධ නව කරුණු ගොඩ නගනවා. මේ විදියට නැවතත් චක්‍රය සිද්ධ වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ශබ්ද විද්‍යාව සමග බැඳුණු නැකත් ශාස්ත්‍ර ආදියේ බලපෑම් ...

*(පසුගිය කලාපයෙන් - ශබ්ද විද්‍යාවේ මූලධර්ම ගැන තවදුරටත්....)*

ශබ්ද විද්‍යාවේ මූලධර්ම, නැකත් ශාස්ත්‍ර ආදිය ගැන යම් ධර්මානුකූල විග්‍රහයක් පසුගිය කලාප කිහිපයකින්ම ඉදිරිපත් කළා. හැබැයි ඒවා හැම අවස්ථාවකදීම හැමෝටම එක වගේ බලපාන්නෙ නැති බවත් සඳහන් කළා. විශේෂයෙන් තෙරුවන් ගුණවලට ඒවා බලපාන්නෙ නැති බව සඳහන් කළා. ඒ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් තමයි මේ ලිපියෙන් සිද්ධ කරන්නෙ.

ඊට කලින් මේ නැකත් කියන වචනෙ තේරුම දන ගැනීමත් වැදගත්. යම්කිසි විදියකින් යමක් යහපත් අතට නැගගෙන එනව නම් ඒකට කියනව නැගෙන අත කියල. නැගෙන අත තමයි නැගත වුණේ. ඒක ව්‍යවහාරයෙන් තමයි අද වෙන කොට නැකත වෙලා තියෙන්නෙ. **නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණං...** ආදී වශයෙන් කියන්නෙත් නැකත් දෝස, යක්ෂ දෝස, භූත දෝස, පාපග්‍රහ දෝස නිවාරණය වෙන්න කියල. එතකොට නැකත්වලිනුත් දෝස එන නිසා තමයි එහෙම කියන්නෙ.

හැබැයි ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ සම්මිශ්‍රණයක් වශයෙන් තියෙන මේ ලෝක පැවැත්මෙදි තමයි මේ නැකත් ශාස්ත්‍ර ඇතුළු කරුණු කාරණා විශේෂයෙන්ම බලපාන්නෙ. ආර්ය ධර්මයට අදාලව වීතරාග, වීතදෝස, වීතමෝහයන්ට හිත තියල අලෝභයෙන්, අදෝසයෙන්, අමෝහයෙන් කටයුතු කරන කොට ඒවායින් එන බලපෑම් බොහෝ කොටම වළකිනවා. මොකද ඒ වගේ අයගෙන් ගොඩනැගෙන ශක්තීන් එන්නෙ යහපත් පැත්තට. පෙර කර්මවලට එන කර්ම විපාක බලපාන්නෙ නෑ කියන එක නෙවෙයි මේ කියන්නෙ. දන් අනුගමනය කරන ආර්ය ගුණ ධර්ම නිසා නැකත් ශාස්ත්‍ර ආදියෙන් එන දෝස කැපෙනවයි කියන එක.

මෙතනදි නැකත් කියල එන්නෙ හොඳ විපාකයන්. සමනන්තර - අනන්තර ප්‍රත්‍යය තමයි එතනදි ක්‍රියාත්මක වෙන්නෙ. මීට කලින් ලිපිවලින් ඒ ගැන විග්‍රහ කරල තියෙන නිසා කෙටියෙන් කියනව නම්, පෙර කරපු කර්ම විපාකයක් ඵල දෙන්න දනුත් ඒ හා සමාන කර්මයක් සිද්ධ කරල පරිසරය සකස් කරන්න ඕන කියන කාරණය තමයි ඒකෙන් කියන්නෙ. එතකොට අපි ඒකට අවශ්‍ය කරන්නා වූ



කර්මයක් යහපත් පැත්තට රැස් කළොත්, ඒකෙ සමනන්තරය හැදිල තියෙන්නෙ යහපත් පැත්තට. සමනන්තරය හැදුවෙ අලෝභ, අදෝස, අමෝහයන්ගෙන් නම් අනන්තරය විදියට නරක විපාකයක් එන්න විදියක් නෑ. නරක පැත්තට සමනන්තරය හැදුවොත් තමයි නරක විපාකයක් ඇදිල එන්නෙ. එහෙම නැත්නම් ආනන්තරීය පාප කර්මවල ශේෂයන් ඉතිරි වෙලා තිබ්බ ඒ වගේ දෙයක් තමයි සමනන්තරයක් නැතුවත් ඇදිල එන්නෙ. මොකද ඒවට අමුතුවෙන් සමනන්තර හදන්න ඕන නෑ. ආනන්තරීය පාප කර්මයක් කරන කොටම සමනන්තරයත් ඒත් එක්කම හැදිල ඉවරයි. ඒ නිසා වර්තමානයේ සමනන්තරයක් හදන කොට ඇදිල එන ඒව නෙවෙයි ආනන්තරීය පාප කර්මවල ශේෂ මාත්‍ර කියන්නෙ. ඒව මහත්ගත බලවත් පවු නිසා ඕනෑම මොහොතක විපාක දෙන්න පුළුවන්.

ඒ වගේම ආනන්තරික නොවුනත් ආර්ය උපවාද කියන පාප කර්ම ඵල දෙන්නත් පරිසරය විපාක ශක්තියෙන් හදාගෙනමයි නැගෙන්නෙ. ඒවත් සමනන්තරයක් නැතුවම ඕනෑම මොහොතක නැගිල එන්න පුළුවන්. මොකද ඒව කරන කොටම සමනන්තරයත් කර්ම ශක්තියෙන්ම හදාගෙනයි එන්නෙ. තමන්ගෙන් හැදෙන්නෙ නැත්නම් බාහිර පරිසරයෙන් හරි හැදෙනවා. මේ හැර ඊට පහළින් තියෙන කර්ම විපාකවලට අපි දන් පරිසරය (සමනන්තරය) හදල දුන්නොත් තමයි ඒකට එකතු වෙලා අනන්තරය විපාක දෙන්න ඇදිල එන්නෙ. හොඳ නරක දෙකටම එහෙමයි. ඒ නිසා තමයි අලෝභ, අදෝස, අමෝහවලට හිත තියල රාග, ද්වේශ, මෝහ ක්ෂය වෙන්න කියල අධිෂ්ඨාන කරල ඒ අනුව කටයුතු කරගෙන යන අයට නරක විපාක දෙන්න පරිසරයක් හැදෙන්නෙ නැත්තෙ. එතකොට පාප කර්මවලට විපාක ඇදෙන්න සමනන්තරයක් හෙවත් පරිසරයක් නැතිව යනවා. මොකද පාප කර්මවලට විපාක ඇදිල එන්නෙ ලෝභ, දෝස, මෝහ තුනෙන් කටයුතු කළොත් තමයි. හැබැයි අර කලින් සඳහන් කරපු ආනන්තරික සහ ආර්යෝපවාද කියන කාරණාවලට යටත්ව ඒ කියන්නෙ ලෝභ, දෝස, මෝහවලින් කටයුතු නොකළත් ඒ වගේ කර්ම විපාකවල ශේෂ මාත්‍රයත් ඵලදෙන්න පුළුවන්.

එතකොට **අපලයක් කියන්නෙ පාප කර්මයන්ට අනුව ලෝකයේ ගොඩ නැගිච්ච පරිසරය.** ඒ කියන්නෙ කරපු පාප කර්මයට අනුව ලෝකයේ පරිසරයක් ගොඩනැගුනයි කියන එක. පොදු පරිසරය තුළ අදාල පුද්ගලයාට ගැලපෙන විදියට ඒක හැදෙනවා. **නැකතක් විස වුනයි කියල අදහස් අර ගන්නෙ නැකත වරද්ද ගත්තයි කියන එක, නොගැලපෙන විදියට ගත්තයි කියන එක. එතකොට පාප කර්ම**

**ඵල දෙන්න අවස්ථාවක් සකස් වෙනවා.** නොනැකත (නොනගතය) කියන්නෙ ඒකයි. ඒ නිසා ඒ කාලයට ලෞකික වැඩ කටයුතු අත්හරිනවා. මොකද ඒක නැගෙන කාලයක් නෙවෙයි. ඒ විදියට වරද්ද ගෙන කර්ම විපාකයක් ඇදිල ආවොත් තමයි ඒක ඒ පුද්ගලයට විස වෙන්නෙ.

යමෙකුට අපලයක් ඇවිත් තියෙන වෙලාවක් වුනොත්, ඒ කර්ම බලවේගයත් එක්ක ඒ පුද්ගලයගෙ ශාරීරිකවත්, මානසිකවත් විපර්යාසයන් ඇති වෙනවා. ඒ වගේ අවස්ථාවකදි හොඳ නැකතක් වුනත් නරකට බලපාන අවස්ථා තියෙනවා. හැබැයි ඒක නැකතෙ වරදක් නෙවෙයි. ඒ පුද්ගලයගෙ කර්ම දෝසයක්. ඒ නිසා ඒක අදාල පුද්ගලයට විස වෙනව මිසක් හැමෝටම විස වෙන්නෙ නෑ. උදාහරණ විදියට ඇල් වතුර පොදුවේ කාටවත් විස නෑ. නමුත් සෙම්ප්‍රතිශ්‍යාව, උණ වගේ ලෙඩ රෝග හැදිච්ච අයට ඒ වෙලාවට ඇල් වතුරත් විස වෙනවා. ඒ වගේ අයට උණු වතුර පාවිච්චි කරන්න වෙනවා. හැබැයි උණු වතුර හැමෝටම අවශ්‍ය නෑ. ඒ විස බීජ හෝ ඒවට ප්‍රතිචාර දක්වන දෙයක් ශරීරයේ තිබුණොත් තමයි ඒ පුද්ගලයට ඇල් වතුර විස වෙන්නෙ. ඒ වගේ අයට විතරයි උණු වතුර අවශ්‍ය වෙන්නෙ. එහෙම නැත්නම් ඇල් වතුර කියන එක කාටවත් විස නෑ. ඒ වගේම පරිසරයේ තියෙන සිසිලස කියන්නෙ පොදුවේ කයට සුව දායක දෙයක්. නමුත් උණ, හෙම්බිරිස්සාව, පීනස වගේ සමහර කායික රෝග තියෙන වෙලාවට ඒ සිසිලසත් අගුණයි. හැබැයි ඒක සිසිලසේ තියෙන අගුණයක් නෙවෙයි. සිසිලසත් සුව දෙන වෙලාවක් තියෙනවා. අනික් හැම ජාතියක්මත් මේ වගේ තමයි. සමහර විට යම් කිසි අසනීපයක් හැදුනම ඒකට අගුණ කෑම ජාති තියෙනවා. නමුත් පොදුවේ බැලුවොත් ඒ කෑම කාටවත් අගුණ නෑ, විස නෑ. නමුත් අර අසනීප පුද්ගලය තුළ ඇති වන්නා වූ යම්කිසි ඌනතාවයක් නිසා සමහර කෑම ඒ අයට විස වෙනවා, අගුණ වෙනවා. ඒ නිසා ඒ අගුණ වෙන්නෙ කෑමවල විසකින් නෙවෙයි. පුද්ගලයා තුළ තියෙන යම් රසායනික විපර්යාසයකින්, ඌනතාවයකින් තමයි ඒක සිද්ධ වෙන්නෙ.

මේ වගේ **හොඳ දේත් නරකට හිටින වෙලාවල් තියෙනවා. හැබැයි ඒක හොඳ දේ තියෙන නරකක් නෙවෙයි. ඒක පාවිච්චි කරපු ක්‍රමයෙ, වෙලාවෙ වැරැද්දක්. ඒ වගේ නැකත කියන්නෙ හොඳ එකක් වුනත්, කෙනෙකුගෙ පරිසරයට ගැලපෙන්නෙ නැති වෙන විදියෙ සැකැස්මක් තියෙනව නම් ඒ පුද්ගලයට ඒක නරකට හිටින්න පුළුවන්.**

මේකට තවත් හොඳ උදාහරණයක් තියෙනවා. ග්‍රහයන් ගැන කතා කරද්දි සිකුරු ග්‍රහයට කියන්නෙ මනමාල ග්‍රහය කියල. මොකද කෙනෙකුට සිකුරු ග්‍රහය ලැබුවම තරුණ කෙනෙක් නම් බොහෝ කොටම විවාහයකට, ස්ත්‍රී පුරුෂ සම්බන්ධයකට මග පෑදෙනවා. හැබැයි යම්කිසි විදියකට ඔය ග්‍රහ චාරය ලබපු භික්ෂූන් වහන්සේ නමක් ඉන්න පුළුවන්. එතකොට ඒක උන් වහන්සේට විපාක වශයෙන් ආපු දෙයක්. නමුත් ඒ කාලෙට උන් වහන්සේටත් ඔය ලෞකික බලපෑම් එනවා. ඒ කියන්නෙ යම්කිසි විදියකින් ලෞකික කටයුතු සම්බන්ධයෙන් නම් විවාහ ආදී කටයුතු සිද්ධ වෙන අවස්ථාවක් තමයි යෙදෙන්නෙ. නමුත් ඒ කාල සීමාව උන් වහන්සේගෙ මහණ කමට බාධාවක්. මොකද භික්ෂූන් වහන්සේ නමක් වුනත් ඒ වගේ වෙලාවට ඒ වගේ දේවල්වලට තමයි පෙළඹෙන්නෙ. ඉතින් ලෞකික සැප සම්පත් විඳගෙන ගිහිව ඉන්න අයට ඒ කාල සීමාව හොඳ වුනාට, නිවන් දකින්න ප්‍රතිපත්ති පුරන අයට ඒක බාධාවක් වෙනවා.

මේකෙ අනිත් පැත්ත තමයි සෙනසුරු ග්‍රහයා. සෙනසුරු කාල සීමාව කියන්නෙ ලෞකික සැප සම්පත් භුක්ති විඳින ලෝකයාට බාධකයක්. ඒ කාලෙට නොයෙක් දුක් කරදර විපත් ඇති කරනවා. නමුත් බොහෝ කොටම කෙනෙක් මහණ කරන්නෙත් සෙනසුරුගෙ ඒරාෂ්ඨක අවස්ථාවක් වගේ වෙලාවක් ආවම. එහෙම දෙයක් බුදුන් වහන්සේ දේශනා කළේ නෑ කියන එක වෙනම කාරණයක්. නමුත් ඒ වෙලාවෙ ස්වභාවයක් තමයි පෙර විපාක ඇදිල ඒම. ඒ නිසා ඒ අවස්ථාවෙ භික්ෂූන් වහන්සේ නමකට නම් වාසනාවක් පෑදුනා වගේ. මොකද දුක් කරදර දෙන එක නිවන් මගට, මහණ කමට හොඳයි. චතුරාර්ය සත්‍යය අවබෝධයට පහසුයි. හැබැයි ගිහිව ඉන්න අයට ඒ වගේ අවස්ථාවක් විසයි. උදාහරණ විදියට පටාචාරා කියන්නෙ තමන්ගෙ දරු දෙන්නයි, ස්වාමි පුරුෂයයි, මවුපියො දෙන්නයි ළඟ ළඟම අකල් මරණවලට ගොදුරු වෙලා ඒකෙන් ඇතිවෙච්ච කම්පනයෙන් මහත් දුකට පත් වෙලා මෙලොව සිහියක් නැතිව බුදුන් වහන්සේ ළඟට දුව ගෙන ආපු කෙනෙක්. එතකොට ඇයට ඒ වෙලාවෙ තිබ්ච්ච ග්‍රහචාරය ලෞකික සැප සම්පත් විඳින්න නම් උපරිම බාධා ගෙන දුන්නු අවස්ථාවක්. නමුත් ඒ අවස්ථාවම ඇයට මහත් වාසනාවක් බවට පත් වෙලා, මෙතෙක් ගෙනාපු සියලු සසර දුකින් නිදහස් වෙන්න මග පාදල දුන්නා. මේ වගේ **හොඳ දෙයක් හොඳට වගේම නරකටත් බලපාන අවස්ථා තියෙනවා. ඒ වගේම නරකයි කියන දෙයක් නරකට වගේම හොඳටත් බලපාන අවස්ථා තියෙනවා.**

මෙන්න මේ වගේ, පුද්ගලයෙක් පෙර ග්‍රහණය කරගත්තු දේට අදාල විපාක දෙන ග්‍රහ කිරණ බලපාන කොටත්, ඒ පුද්ගලයගෙ ශක්තියට අනුව තමයි ඒව විපාක දෙන්න ඇදිල එන්නෙ. එතකොට ඒ අවස්ථාවෙ ඒ පුද්ගලයගෙ කායිකත්වය, මානසිකත්වය, කර්ම ශක්තිය කියන මේ සියල්ලම එකතු වෙලා ඊට අනුකූලව ඒ පුද්ගලයට ගැලපෙන විදියට පරිසරය සකස් වෙච්ච හැටියට තමයි විශ්වයේ තියෙන කිරණ ඇදිල එන්නෙ. එහෙම සකස් වෙලා ඒ කිරණ ඇදිල ආවම ඒකෙන් පුද්ගලය හොඳට හෝ නරකට පෝෂණය වෙනවා. එතකොට අර වගේ ඌනතාවයක් නැත්නම් ඒ පුද්ගලයගෙ ශරීරය හොඳට දීප්තිමත්ව ශක්තිමත්ව හැදිල මානසිකත්වය හොඳ වෙනවා. කරන කියන වැඩ කටයුතු සාර්ථක වෙනවා.

ඒ නිසා තමයි දහමට අනුව **ජීවත්** වෙන අයට හැමදාම **උත්තරසල් (උතුරු සළු) නැකතයි කියල බුදුන් වහන්සේ දේශනා කළේ.** පෙහෙවස් සමාදානය ගැන සඳහන් කරන කොට තමයි ඒ කාරණය පෙන්වන්නෙ. ඒ කියන්නෙ හැමදාම ඒ ගුණ ධර්මවල පිහිටල ජීවත් වෙනව නම්, යහපත් වැඩක් කොයි වෙලාවෙ කළත් ඒ වෙලාව හොඳ වෙලාවක් වෙනවා. ඒ වගේ කෙනෙක් යහපත් වැඩක් මොන වෙලාවෙ කළත් ඒක උතුරුසළු නැකත වගේ කිසිම වරදක් නැති වෙලාවක් වෙනවා. එතකොට ඒකත් නැකත් 27 න් එකක්. නමුත් ඒකෙ විශේෂත්වයක් තියෙනවා. උතුරු සළුවට තමයි ඒක උපමා කරල තියෙන්නෙ. උත්තරීතර ගුණ තමයි ඒකෙන් අදහස් වෙන්නෙ. මොකද අලෝභ, අදෝස, අමෝහවලින් කටයුතු කරන කොට ඒ ගුණය තමයි එතනදි බලපාන්නෙ. හැබැයි ලෝභ, ද්වේශ, මෝහයන්ගෙන් කටයුතු කරන අයට ඒකෙන් විශේෂත්වයක් ගන්න බෑ. ඒ නිසා තමයි ඒ ගුණ ධර්මවල පිහිටපු අයට නැකත් බලන්න අවශ්‍ය නෑ කිව්වෙ. ඒ කියන්නෙ නියම ආර්ය ගුණ ධර්මවල පිහිටියොත් ඒ නැකත් ප්‍රශ්න බලපාන්නෙ නෑ. ආර්ය මගට බැහැපු කෙනෙකුගෙන් (සතර අපාගත නොවන මට්ටමට පිළිපන් අය) ඇති වන පාපය සාමාන්‍ය අයගෙ වගේ බලවත් නෑ. මොකද ඒ වගේ පුද්ගලයෙකුට වැඩි හරියක්ම එකතු වෙලා තියෙන්නෙ හොඳ පැත්ත. ඒකෙන් කවදාවත් සුගතියක් මිසක් දුගතියක් හට ගන්වන්න බලයක් නෑ. ලෞකිකත්වයට යොදාගත්තත් යහපතක් මිසක් අයහපතක් නෑ. මොකද ඒ වගේ පුද්ගලයෙකුට නැකත් කියන ඒවා ස්වභාවයෙන්ම පිහිටනවා.

**සෑම කළු වළාකුළකම රිදී රේඛාවක් තියෙනවයි කියනව වගේ, නරකයි කියන ඕනෑම තැනක ඕනෑම වෙලාවකත් හොඳක් තියෙනවා. හැබැයි ඒ හොඳ අවස්ථාව නිකම්ම අහු වෙන්නෙත්** නෑ. මනසා චේ පසන්නේන භාසතිවා කරෝතිවා - තතෝනං සුඛ මන්වේති ඡායාව අනපායිනි කියන සිද්ධාන්තයෙන් තමයි ඒ හොඳ අවස්ථාව අහුවෙන්නෙ. ඒ කියන්නෙ තමන්ගෙ ඡායාව තමන් පසු පස එනව වගේ, ප්‍රසන්න මනසකින් කරන කියන දේවල්වලට තමන්ට සුවය ලැබෙනවා. අන්තිම නරකයි කියන වෙලාවකත් ඒ වගේ කෙනෙකුට අර කළු වළාකුළේ තියෙන රිදී රේඛාව වගේ හොඳ පොඩි වෙලාවක් හරි අහුවෙනවා. ඒ අර ගුණය නිසා. ඒකට තමයි අර උතුරුසළු නැකත කියල කිව්වෙ. මොකද මේ නැකත් චක්‍රය ගත්තමත් මහ චක්‍රය, සූක්ෂම චක්‍රය, අති සූක්ෂම චක්‍රය ආදී වශයෙන් කොටස් තියෙනවා. එක මහ චක්‍රයක් කැරකෙන කොට ඒක ඇතුළෙ ඊට වඩා සූක්ෂම තවත් චක්‍රයක් කැරකෙනවා. ඒ සූක්ෂම චක්‍රය ඇතුලෙ තවත් අති සූක්ෂම චක්‍රයක් කැරකෙනවා. මේ විදියට තත්පරයක් තත්පරයක් පාසා ඇසි පිය ගහන මොහොතකත් මේ නැකත් චක්‍රය කැරකෙනවා. එතකොට අර නරකයි කියල කියන්නෙ ඒ මහ චක්‍රයක තියෙන ලොකු වෙලාවක් අල්ලල. නමුත් ඒ ලොකු වෙලාව ඇතුලෙ වුනත් අර සූක්ෂම, අති සූක්ෂම චක්‍ර කැරකෙන කොට ඒ තුළින් තමයි කුඩා වෙලාවක උතුරුසළු කියන නැකත අහු වෙන්නෙ. ඒක අහුවෙන්නෙත් පුද්ගලයගෙ තියෙන පුණ්‍ය ශක්තියට. ඒක තමයි අර කළු වළාකුළ ඇතුලෙ තියෙන රිදී රේඛාව වගෙයි කිව්වෙ. ඒකට නැකත් ශාස්ත්‍ර ආදිය හොයන්න බලන්න ඕන නෑ. ස්වභාවයෙන්ම ඒ හොඳ වෙලාව ලැබෙනවා. හැබැයි එහෙම ලැබෙන්නෙත් ගුණ ධර්මවල පිහිටපු අයට විතරයි. එහෙම නැත්නම් සසරෙ කරපු විශේෂ පුණ්‍ය ශක්තියක් ඇදිල එන්න ඕන. ඒ නිසා තමයි ආර්යයෝ නැකත් ශාස්ත්‍ර බලන්නෙ නෑ කිව්වෙ. මොකද ඒවා බලන්න අවශ්‍යතාවයක් නෑ. අර පිහිටපු ගුණයන්ට ස්වභාවයෙන්ම නැකත් අහු වෙනවා. දැන් මේ සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන් මහණ වෙන්න පෙර කරපු පරීක්ෂණයක අත්දැකීමක් උන් වහන්සේ මේ විදියට ප්‍රකාශ කළා.

''ඒ කාලෙ මං ඔය සම්බන්ධයෙන් පරීක්ෂණ පවා කරල තියෙනවා. එතනදි ආර්ය දහමට අනුව කටයුතු කරන එක්තරා මහත්තයෙක් හිටියා. ඔහු මාව හමුවෙන්න ඇවිත් ඔහුගෙ යම්කිසි වෙළඳසැලක් විවෘත කරන්න හොඳ වෙලාවක් හදල දෙන්න කියල ඉල්ලා හිටියා. මම කිව්වා, ඔබට හිතෙන වෙලාවක් කියන්න කියල. එතකොට ඔහු නිකං හිතට එන විනාඩියක වෙලාවක් කිව්වා. ඉතින් මම ඒ කියපු වෙලාව අරගෙන ඔහුගෙ නමට ගලපල, පක්ෂියා රජ වෙන වෙලාව බලල.... මේ ආදී සියල්ලම ගලපල බලන කොට, ඒ සියල්ලටම ගැලපිච්ච වෙලාවක් තමයි නැකත විදියට අහු වෙලා තිබුණෙ. මම කිව්ව ඉතින් ඕක තමයි කියන්නෙ, ධර්මානුකූලව ඉන්න කෙනාට නැකත් ස්වභාවයෙන්ම අහු වෙනව කියල. ඔහු නැකත් ශාස්ත්‍රය ගැන දන්නෙ නැතිව නිකං හිතට එන වෙලාවක් කිව්වට, ඒක ගලපල බලන කොට ඒ ශාස්ත්‍රයට හරියටම ගැලපිලා තිබුණා. ඒ විදියට තමයි ඔහුට ගැලපෙන සුභ වෙලාවක් අහු වුණේ. ඉතින් ගුණ ධර්මවල පිහිටල කටයුතු කරන අයට එහෙම ශාස්ත්‍රයකුත් තියෙනවා.



මේ විදියට මම ඒ කාලෙ නැකත් බලල දීපු ක්‍රමයක් තිබුණා. එතනදි නැකත් හදන උදවිය ලෝක සම්මත ක්‍රමයට ඒ නැකත් වෙලාවල් හදල දුන්නත්, මම දැනගෙන හිටියා ලෝක සම්මත ක්‍රමයට හැදුවට කවදාවත් අසත් පුරුෂයන්ට නැකත් අහුවෙන්නෙ නෑ කියල. ඒ නිසා ඒ අයට දහස් වර, ලක්ෂ වර ජීවම් කරල හදල තියෙන තුනුරුවන් ගුණ බලෙන් සෙත් ශාන්ති කරපු ජලය, සුවඳ දුම්, පහන් තෙල් ආදිය ලබල දීල, සාංඝික දානයක් දීල දෙමව්පියන්ට, නෑදෑ මයිලන්ට, වැඩිහිටි ආදීන්ට කැවුම් කිරිබත්වලින් සංග්‍රහ කරල, ඒ ආදී වශයෙන් ආශිර්වාද අරගෙන චිත්ත ප්‍රසාදය ඇති කර ගෙන, ඒ විදියට යම් කිසි ගුණයක පිහිටල කටයුතු කරන්න ක්‍රමයක් කියල දෙනවා. ඊට පස්සෙ මේ වෙලාවට හරියට නැකතට කරන්න කියල වෙලාවක් දෙනවා. හැබැයි එහෙම නැකතට කියල වෙලාවක් වෙන් කළාට දැන් නැකත අහු වෙලා තියෙන්නෙ ඒ පුද්ගලයගෙ චිත්තප්‍රසාදයෙන්. ඒ නිසා ඒක හරියනවා. නමුත් ඒ කාරණය ඒ අය දන්නෙ නෑ. ඒ අය හිතාගෙන ඉන්නෙ ඒක මේ පවතින ලෝක සම්මත නැකත් ශාස්ත්‍ර ක්‍රමයෙන් විතරක් හදල දුන්නු නැකතක් කියල. හැබැයි ලෝක සම්මත ක්‍රමයටත් ගලපල තමයි මම ඒක හදන්නෙ. එහෙම නැතුව නිකම්ම වෙලාවක් දෙනව නෙවෙයි. නමුත් ලෝක සම්මතයේ නැකත් කොච්චර හදල දුන්නත් අසත් පුරුෂයන්ට ඒවා බලගැන් වෙන්නෙ නෑ. ඒ නිසා අසත් පුරුෂයෙක් නැකතක් කොහොම අල්ලන්න හැදුවත් අහුවෙන්නෙ නෑ. අහුවෙන්නෙ විස එකක්. ඒ වගේ දෝස කැපෙන්න තමයි මේ විදියට ක්‍රමයක් කියල දෙන්නෙ.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, එහෙනම් ඒ විදියට නැකත් වැඩ කර ගන්න ආවෙ අසත් පුරුෂයොද කියල. නමුත් එහෙම වරදවා තේරුම් නොගත යුතුයි. මොකද අසත් පුරුෂ ගතියයි, සත් පුරුෂ ගතියයි කියන්නෙ මනුස්සයින්ට ඒ ඒ මොහොතෙ තියෙන ගති ලක්ෂණ. උදාහරණ විදියට කොච්චර හොඳට පින් දහම් කරගෙන ඉන්න කෙනෙක් වුනත්, යම් මොහොතක මත් පැන් පානය කරල නොහොබිනා විදියට හැසිරුනොත්, එහෙම නැත්නම් කවුරුහරි එක්ක තිබිච්ච තරහක් මතුවෙලා ඇවිත් ඒ අනුව කටයුතු කළොත්, ඒ වෙලාවෙදි ඒ පුද්ගලයට තියෙන්නෙ අසත් පුරුෂ ගති ලක්ෂණ. මොකද ඒක දස අකුසලයටත් අයිතියි. එතකොට අර කලින් පින් දහම් කළයි කියල දැන් සත් පුරුෂයි කියන්න බෑ.

එහෙනම් මේ සත් පුරුෂ / අසත් පුරුෂ කියන ගති ලක්ෂණ දෙකේ මිශ්‍රනයකින් තමයි සාමාන්‍ය මනුස්සයො සසර ගමන ගෙනියන්නෙ. ඉතින් ඒ වගේ තමන්ගෙ පුද්ගලික වැඩ කටයුතුවලට නැකත් ආදිය බලා ගන්න ඒ කාලෙ මාව මුණ ගැහෙන්න ආපු අයටත් ඒ වගේ මිශ්‍ර ගති ලක්ෂණ තිබුණා. එතකොට නැකත් බලල දෙනව කියන්නෙත් යම් කිසි විදියකින් ප්‍රයෝග සම්පත්තියක් නිසා, ඒකට අවශ්‍ය කරන පූජාවන්ට, ධර්ම දේශනාවලට ඒ අයව සම්බන්ධ කරල කටයුතු කරල දෙන කොට හේතු වාසනා තියෙන අය දහම තේරුම් අරගෙන බෞද්ධ වෙනවා. ඒ වගේ අය 10% ක් විතර තමයි දිගටම ඒ බෞද්ධ වැඩකටයුතුවලට සම්බන්ධ වෙලා, වත් පිළිවෙත් පුරාගෙන ඉදිරියට ගියේ. අනික් 90% ක් විතර පිරිසම තමන්ගෙ ලෞකික වැඩ කටයුතු ටික කරගෙන ඉවත් වුණා. මේ වගේ ☞

මනුස්ස-යින්ගෙ තියෙන ඒ අසත් පුරුෂ ගතිවලට නැකත් අහුවෙන්නෙ නැති නිසා තමයි ප්‍රයෝග සම්පත්තියක් යොදල අර වගේ ක්‍රමයක් අනුගමනය කරන්න කියල දුන්නෙ.

ඒ නිසා තමයි සත් පුරුෂ ගති තියෙන බෞද්ධ නොවන අය වුනත්, විශේෂයෙන් ඒ ගතිගුණ තියෙන සමහර විදෙස් රටවල උදවිය නැකත් බලන්නෙ නැතිව හරියට වැඩ කරල ජයග්‍රහණ ලබන්නෙ. මොකද එහෙම අයටත් නැකත් ස්වභාවයෙන්ම අහු වෙනවා. ඒ නිසා ඒ වගේ අයටත් හරි යනවා. නමුත් ඒ කාරණය දන්නෙ නැති නිසා සාමාන්‍ය උදවිය මොකද කියන්නෙ, ''නැකත් ශාස්ත්‍ර බලන්නෙ නැතිව අහවල් උදවිය වැඩ කරල හරි ගිහින් තියෙන්නෙ! ඒ අයට ඔය මොන නැකත්ද? නැකත් කියන්නෙ බොරු වැඩ....'' මේ ආදී වශයෙන් කියල දෘෂ්ටියකට බහිනවා. නමුත් නැකත්වල බොරුවක් නෙවෙයි එතන තියෙන්නෙ. ඉස්සරත් නැකත් හදන්න පෙර ඍෂිවරු ක්‍රමයක් කියල දීල තිබුණා. ඒ දුන්නෙත් මේ වගේ ක්‍රමයක්. ඒ කියන්නෙ හොඳ වෙලාවක් බලල දීල, ඒ වෙලාව ඇතුළත ඒ කටයුත්ත කරන්න පෙර, අර විදියට කැවුම් කිරිබත් එක්ක දානයක් දීල චිත්ත ප්‍රසාදය ඇති කරන ක්‍රමයක් කියල දෙනවා. ඒ දානය උදෙන්ම ලෑස්ති කරල ශ්‍රමණ බ්‍රාහ්මණ ආදීන්ට, දෙමාපියන්ට, වැඩිහිටියන්ට, ඒ ඉන්න සියල්ලන්ටම දන් දීල ඒ සියලු දෙනාගෙම ආශිර්වාද අරගෙන තමයි වැඩේ පටන් ගන්නෙ. එතකොට එදා හිටපු ඍෂිවරුත් මේ ක්‍රමය හඳුන්වල දීල තිබුණා. හැබැයි බුද්ධ **භාෂිතය ආවට පස්සෙ තෙරුවන් ගුණ ඔය වගේ දහස් ගුණයක් බලවත් නිසා සැබෑ බෞද්ධයින්ට මේව එකක්වත් කර කර ඉන්න දෙයක් නෑ. නමෝ බුද්ධාය කියල අවංකව වැඩේ පටන් ගත්ත නම් ඒත් හරියනවා.** ඒකෙ විශේෂත්වයක් තියෙනවා. අනෙක සැබෑ බෞද්ධයන් විසින් දාන මාන දීම්, වත් පිළිවෙත් කිරීම් ආදිය කොහොමත් කරනවා. නැකත් වෙලාවට විතරක් තමන්ගෙ වැඩේ කරගන්න ඒ වගේ දේවල් කරන සිරිතක් සැබෑ බෞද්ධයින් ළඟ නෑ. ඒ අය හැම වෙලාවෙම ඉන්නෙ වත් පිළිවෙත් සිද්ධ කරගෙන, තෙරුවන් ගුණ දරාගෙන. ඒ නිසා සැබෑ බෞද්ධයින් මොන විදියක, මොන වෙලාවක යහපත් වැඩක් කළත් ඒ වෙලාව සුභ නැකතක් වෙලා ඒ වැඩේ හරියනවා. නමුත් අද වෙන කොට බොහෝ කොටම සැබෑ බෞද්ධයින් වෙනුවට නාමික බෞද්ධයින් ඉන්න එකයි ප්‍රශ්නෙ වෙලා තියෙන්නෙ. ඒ නිසා තමයි අර වගේ විශේෂ ක්‍රමයක් කියල දෙන්නෙ.''

දැන් එතකොට අර කලින් සඳහන් කළා වගේ දාන මාන ආදිය දීල වැඩේ පටන් ගන්න කොට එතනදි කාරණා කිහිපයක් සිද්ධ වෙනවා. එකක් තමයි පුද්ගලයෙක් සමනන්තරයක් හැදුවම ඒකට අනන්තරයක් වශයෙන් පෙර කරපු පුණ්‍ය ශක්තියක් තියේ නම් ඒකත් ඇදිල ඇවිත් ඒ පුද්ගලයගෙ පුණ්‍ය ශක්තිය බලවත් කරල දෙනවා. අනෙක් කාරණය තමයි බලවත් පුණ්‍ය කර්මයක් ඇදල එන වෙලාවට ''කාලය හොඳ නම් බඹරය කැරකෙයි වැල්ලේ'' කියල කතාවක් තියෙනව වගේ, ඊට අනුකූල දෙයක් මෙතනදිත් සිද්ධ වෙනවා. කාලය හොඳ නම් කිව්වෙ ඒ පුද්ගලයගෙ පුණ්‍ය වේගයක් ඇදිල එන වෙලාව. බඹරය වැල්ලෙ කැරකෙනවයි කිව්වෙ ඒ වෙලාවෙදි ඒ පුද්ගලය මොන කටයුත්තක් කළත් ඒක සාර්ථක වෙලා ජයග්‍රහණය ලබනවයි කියන එක. හැබැයි ඒ පුද්ගලය ඒ ජයග්‍රහණය දඩමීමා කරගෙන සමහර විට දූෂ්‍ය මනසකින් අසත් පුරුෂ වැඩත් කරන්න පුළුවන්. එතකොට වෙලාව හොඳ නම් ඒවත් හරි යනවා. මොකද හේතුව ඒ පුද්ගලය කරපු පුණ්‍ය කර්මයේ බලවත් බව නිසා ඒ විපාකය එතනදි පළවෙනි වෙනවා. ඒ වගේ වෙලාවට අසත් පුරුෂයගෙ දූෂ්‍ය කටයුත්තත් සාර්ථක වෙනවා. ඒ නිසා තමයි සමහර උදවිය සූදු වගේ දුසිරිත්වලින් ජයග්‍රහණ ලබන්නෙ. ඒ පුද්ගලයට වුනත් පුණ්‍ය වේගයක් එන වෙලාවට නැකත් ඉබේම හරියනවා. නමුත් ඊළඟ සැරේ ඒ පුද්ගලයට නරක වෙලාවක් එන කොට ඒ කරගත්ත අසත් පුරුෂ වැඩේ පාප ශක්තියයි, සසරෙ පෙර කරපු පාප විපාකයයි දෙකම එකතු වෙලා ඇවිත් මහ විනාසයක් සිද්ධ වෙන්න පුළුවන්. ඒ වගේ සමහර මහා දූෂ්‍ය වැඩ කරන අය ඉන්නවා, ඒ අය මහා ජයග්‍රහණයක් පෙන්වල අන්තිමට අන්ත අසරණ තත්ත්වයට වැටෙන කාලයක් එනවා. ඒ එන්නෙත් අර විදියටම තමයි. මොකද ප්‍රවෘත්ති විපාක එන්නෙ ඔය වගේ කඩින් කඩ. වෙලාවකට හොඳ කාලයක් එනවා. ඊළඟට නරක කාලයක් එනවා. නැවතත් හොඳ නරක මිශ්‍ර සාමාන්‍ය කාලයක් එනවා. ඊළඟට නැවතත් මහ බලවත් පිං විපාක එල දෙන කාලයක් එනවා. මේ කොහොම හරි හොඳ බලවත් විපාකයක් එනව නම්, ඒ වෙලාවට පුද්ගලය මොනව කළත් ඒ විපාකය තමයි ප්‍රධාන වෙන්නෙ. විපාකය බලවත් නම් එහෙම විශේෂත්වයක් එනවා. එතකොට අසත් පුරුෂ වුනත් ඒ පුද්ගලයගෙ පුණ්‍ය විපාකය බලවත් නම් ඒක නැගී හිටිනවා. නමුත් එහෙම නැති අවස්ථාවල තමයි ඒ අඩුපාඩු මකාගන්න ප්‍රයෝග සම්පත්තියක් විදියට නැකත් බලන්නෙ. ඉතින් නැකත් හරියටම අල්ලනවයි කියන්නෙ ප්‍රයෝග සම්පත්තියක්.

ඒ නිසා මේ කාරණය ලේසියෙන් හොයන්න බෑ. මොකද කර්ම විෂය අචින්ත්‍යයි. ඒ නිසා අපි කරන, කියන හැම කටයුත්තක්ම මේ විදියට විග්‍රහ කරන කොට, තව කෙනෙක් වෙනත් විදියකට තර්ක කරන්න පුළුවන්. පිටරටවල ඉන්න මිනිස්සු ශ්‍රමණ බමුණන්ට කියල කැවුම් කිරිබත් දාන දෙන්නෙත් නෑ, අම්මට තාත්තට සලකනව කියල එහෙම විශේෂත්වයකුත් නෑ, ඔය මුකුත් කරන්නෙ නැතිව යස අපූරුවට ගෙවල් දොරවල් හදාගෙන යාන වාහන අරගෙන ඔය හරි ගිහින් තියෙන්නෙ කියල මෙහෙම තර්කවාද මතු කරන්න පුළුවන්. නමුත් ඒකටත් හේතුව තමයි අර කලින් විග්‍රහ කළේ. මොකද ඔය බොහෝ කොටම ලෞකික සැප සම්පත් අතින් දියුණු රටවල උපදින අය ලෞකික පුණ්‍ය කටයුතු හොඳට කරගෙන යනවා. හැබැයි ඒව අපි කරන පින් දහම් කටයුතුවලට වඩා වෙනස්. ඒ නිසා අපි ඒව දකින්නෙ නෑ. ඒ අයගෙ ආගම් ගත්තමත් ඒවායේ මූලික වශයෙන්ම උගන්වන්නෙ ලෝක සම්මත පින් දහම් කරන්න කියල. ඒ කියන්නෙ මනුස්සයට මේ ලෝක සම්මතයෙ තියෙන හොඳ දේවල් කරන්න කියල දෙනවා. මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි කියල ඒ කාරණය තමයි ඒ අය නිතරම හොඳ හැටියට ප්‍රධාන කරගෙන සලකන්නෙ. හැබැයි ඒ අය සේවය කියල එතනදි අදහස් කරන්නෙ සම්පූර්ණයෙන්ම ලෞකික පැත්තක්. ඒ නිසා අනෙක් අයට උදව් උපකාර කරනවා, නැති බැරි අයට කන්න බොන්න දෙනවා, ඇඳුම් පැළඳුම් දෙනවා, ගෙවල් දොරවල් හදල දෙනවා, ඒදඬු පාලම් මං මාවත් හදල දෙනවා, ලෙඩට බෙහෙත් හේත් අරන් දෙනවා.

බෞද්ධයින් නිවන ප්‍රධාන කළාට මේ වගේ ලෝක සම්මත පින් දහම් තමයි ඒ බෞද්ධ නොවන අය ප්‍රධාන කරගෙන තියෙන්නෙ. ඒ නිසා ඒ අය හැම වෙලේම යම්කිසි පින් ඵලයකට උරුමකරුවො වෙනවා. ඒවට ඵල විපාකත් එනවා. ඒ වගේ රටවල සුඛෝපභෝගී තැන්වලට ගිහින් උපදින්න හේතුවත් ඒකයි. ඉතින් බොහෝ කොටම සශ්‍රීකත්වය ලැබෙනවා. හැබැයි ඒ වගේ කාලෙක එබඳු ආගම් ශක්තියක් හරි අරගෙන පින් දහම් කළාට, පසු කාලෙකදි ආගම් විපරීත වුනාම ඊළඟට අර හොඳ වගේම නරක වැඩත් කරනවා. උදාහරණ විදියට සමහර අය ආගමේ කියල තියෙනවයි කියල සත්තු මරාගෙන කනවා. ඒ වගේ විපරීත පැත්තට බැස්සොත් පසු කාලයකදි විශාල පිරිහීමකට පත් වෙනවා. අර තියෙන ලැබීම නැති වෙලා යනවා.

ඒ නිසා ඒ ආගම්වල ලෞකික පිංවලට පළවෙනි තැන දුන්නට, බුදු දහමෙ ඒක දෙවෙනි කරල තියෙනවා. පින් ☞

අවශ්‍ය බව පෙන්නුවත්, නිවන් මග හෙවත් ආර්ය මග තමයි බුදු දහම තුළ පළවෙනි වෙන්නෙ. ඒ නිසා නිවන් මග පළවෙනියට අල්ල ගත්තු අය ලෝක පැවැත්මට කරන පින් කටයුතු අල්ල ගෙන ඒ තරම් දඟලන්නෙ නෑ. ඒ නිසා ඒ වගේ අයට පැවැත්ම සාමාන්‍ය විදියට යනවා, නිවනට ප්‍රඥාව වැඩෙනවා. අනිත් අය පැවැත්ම ලොකුවට ගෙනිච්චට ප්‍රඥාව අඩුයි. ඒ නිසා ගැඹුරු දහම් ගැන අවබෝධයක් නෑ. හැබැයි පින ප්‍රධාන කරගත්තු නිසා හොඳ සුඛෝපභෝගී ජීවිත ගත කරනවා. වසවර්ති මාරයගෙ දෘෂ්ටියත් ඔය වගේ දෙයක්. පින් දහම් කරගෙන සුඛෝපභෝගීව ඉන්න, නිවන් දකින්න ඒ පැත්ත පළාතෙවත් බලන්න එපා කියන දෘෂ්ටියේ තමයි වසවර්ති මාරයා ඉන්නෙ. එතකොට ලෞකික පින් ප්‍රධානයි. ඒ නිසා තමයි දිව්‍ය ලෝකවලින් සැප සම්පත් ඉහළම පරනිම්මිත වසවර්ති කියන දිව්‍ය ලෝකයේ උප්පත්තිය ලබන්නෙ. එතකොට මේ බෞද්ධ ක්‍රමයයි, අබෞද්ධ ක්‍රමයයි කියන්නෙ ක්‍රම 2 ක්.

ඒ වගේම මේ **බෞද්ධ ක්‍රමයට කරන පින් සහ අබෞද්ධ ක්‍රමයට කරන පින් අතරත් වෙනසක් තියෙනවා.** ඒ කියන්නෙ සැබෑ බෞද්ධයෙක් පින් දහම් කරන අරමුණින් නෙවෙයි අබෞද්ධ අය පින් දහම් කරන්නෙ. මේ පින් දහම් කරන කොට ආයුස, වර්ණය, සැපය, බලය, නුවණ කියල කාරණා 5 ක් ලැබුණත්, මේ කාරණා 5 බෞද්ධයින්ට සහ අබෞද්ධයින්ට ලැබෙන්නෙ ඒ අය බලාපොරොත්තු වෙච්ච අරමුණ අනුව වෙනස් විදියට. (21 වන කලාපයේ පළ වූ ''නිවනට පසු තලය සකසන පාරමී'' නම් ලිපියෙන්ද මේ කාරණය අවස්ථානුකූලව ඉදිරිපත් කරල තියෙනවා.)

උදාහරණ විදියට **බෞද්ධයෙකුට ආයුස කියන්නෙ නිකම්ම කාල බීල විනෝද වෙලා දිගු කලක් ජීවත් වීම නෙවෙයි. ඒකට තමයි අබෞද්ධ ක්‍රමයට ආයුස කියන්නෙ.** ඒ නිසා තමයි අප්පමාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝපදං - අප්පමත්තා නමීයන්තී - යෙ පමත්තා යථා මථා කියල කියන්නෙ. ඒ අනුව නිවනට ප්‍රමාද පුද්ගලයා දිගු කලක් ජීවත් වුනත් මැරිච්ච කෙනෙක් වගෙයි. එතකොට අප්‍රමාද පුද්ගලයගෙ අමෘත බව හෙවත් ජීවත්වීම කියන්නෙ නිවනට නොපමාව කටයුතු කරගන්නවා කියන එක. ඒ වගේ කෙනෙක් ලෝක සම්මතයෙන් මියගියත් පරමාර්ථ වශයෙන් මියයන්නෙ නෑ. දැන් මෙතනදි ආයුස කියල කියන්නෙ අප්‍රමාදීව කටයුතු කරන්න ලැබෙන හේතු වාසනාව. ඒක බෞද්ධයො පිනකින් බලාපොරොත්තු වෙන දෙයක්. මනුස්සයෙක් වෙලා නිකම්ම අවුරුදු 100 - 120 ක් ජීවත් වෙන එක නෙවෙයි. මනුස්සයෙක් වෙලා ජීවත් වෙන සුළු ආයුස කාලයකදි හරි අප්‍රමාදීව කටයුතු කරන්න හේතු වාසනා ලැබීම තමයි මෙතනදි ආයුස කියන්නෙ. අධර්මින් ජීවත් වෙනවා විතරට - දැහැමින් මියයනු සොඳමයි දන හට කියල කියන්නෙත් ඒකයි. එතකොට ඒ පුද්ගලයගෙ මනස යහපතටම මෙහෙය වෙනවා. ඒ වාසනාව ක්‍රියාත්මක කර ගන්න අවස්ථාව ලැබෙනව කියන එක තමයි ආයුස හෙවත් ජීවත්වීම කියන්නෙ.

වර්ණය, සැපය කියන්නෙත් ඒ වගේ දෙයක්. නිවන කියන යහපත කර ගන්න ප්‍රබෝධමත් වෙන්න, සැහැල්ලු වෙන්න කියන එක. ඒ වගේම ඒකට උපනිශ්‍රය වන සමාධි සුවය, දැහැන් සුවය. මොකද සමහර කෙනෙක් හොඳ දෙයක් කරන්න ඇකිලෙනවා, කම්මැලි වෙනවා. මනස ඒකට පිහිටන්නෙ නෑ. නමුත් බෞද්ධ අරමුණින් පින් කරන අයට ඒ බලාපොරොත්තු වෙන විදියට හොඳ දෙයක් කරන කොට ප්‍රබෝධයෙන් ඒ කටයුත්ත කරන්න පුළුවන් විදියට වර්ණය, සැපය කියන ඒවත් ලැබෙනවා. එහෙම නැතිව නිකම්ම හමේ පාට, ලස්සන, සුඛෝපභෝගීව ඉන්න ලැබෙනව කියන එක නෙවෙයි. අබෞද්ධ අයට ලෝකයේ වැදගැම්මකට නැති ලෞකික රැගුම්වලට යොදා ගන්න තමයි ඒ වර්ණයෙන් සහ සැපයෙන් එන ප්‍රබෝධය තියෙන්නෙ. නමුත් බෞද්ධයාට වර්ණයෙන්, සැපයෙන් එන කායික මානසික ප්‍රබෝධය කියන්නෙ ලෝකයෙන් මිදෙන නිවන් සුවයට අදාල හොඳ දේවල් කරන්න ලැබෙන ප්‍රබෝධමත් ගතිය. ඒක තමයි බෞද්ධයින්ට පිනේ ඵලයක් වශයෙන් ලැබෙන වර්ණය, සැපය කියන්නෙ.

ඊළඟට බලය කිව්වම දාමරිකයන්ටත් බලයක් තියෙනවා. හැබැයි බොදුනුවන්ට ලැබෙන බලය කියන්නෙ අර කලින් කිව්ව වගේම නිවනට අදාල යහපත් දේ කරන්න බලවත්ව නැඟී හිටින කායික මානසික ශක්තිය. අබෞද්ධ අයගෙ අරමුණ ඇඟපත මහත් කරගෙන, ශක්තිමත් කරගෙන ඒ වගේම චණ්ඩිකම, ලොකුකම, බලපුළුවන්කාරකම පෙන්වල ලෝක බලවත්තු වෙන්න. ඒ අය කරන පිනෙන් ඒව ලැබෙනවා. නමුත් ආර්යන්ගේ (බෞද්ධයින්ගෙ) බලය තමයි මාර පාක්ෂික බලවේග මැඩ පවත්වන්න ලැබෙන ශක්තිය, වීර්ය. විරිය සම්බොජ්ජංගය, සම්මා වායාම ආදී වශයෙන් ලැබෙන්නෙ ඒ බලය. ශ්‍රද්ධා බල, විරිය බල, සති බල, සමාධි බල, ප්‍රඥා බල ආදී වශයෙන් කියන්නෙත් ඒවම තමයි.

ඊළඟට නුවණ කියන එකෙත් ඒ වගේම දෙපැත්තක් තියෙනවා. ලෝකයේ තියෙන ලෞකික නුවණ තමයි අභස් යාත්‍රා, රොකට්, චන්ද්‍රිකා, පරිගණක ආදිය හදල ලෝකයාට පේන ලොකු වැඩ කරන්න යොදා ගන්නෙ. නමුත් බෞද්ධයින්ගෙ නුවණ තමයි නිවන් මගට අවශ්‍ය කරන්නා වූ චතුරාර්ය සත්‍යය අවබෝධයට මග පාදල දෙන්නෙ. මේ විදියට මේ කාරණා පහම පින් කරන ක්‍රම දෙකෙන්ම ලැබෙනවා. දැන් මේ කාරණා 5 ලෞකික පැත්තෙන් අරගෙන බැලුවොත්, ඒ නිසා ලෝකය හරි දියුණුයි කියල බොහෝ දෙනෙක් පුරසාරම් දොඩන්න පුළුවන්. ඒ වගේම ඒ ලෞකික දියුණුව නැති නිසා බොදුනුවො හරියට පිරිහිලා ඉන්නව කියලත් කෙනෙක් කියන්න පුළුවන්. නමුත් එහෙම කියන්නෙ මේ ලෝකෙ සත්‍යය, යථාර්ථය දන්නෙ නැති අය. කවද හරි සත්‍යය යථාර්ථය අවබෝධ වෙලා ප්‍රතිඵලය බැලුවම බොදුනුවො ඒ හේතුවෙන් සියලු දුක් කෙළවර කරල සැනසීම ලබාගන්නවා. ලෞකික අදහසින් පින් දහම් කටයුතුවල නිරත වෙච්ච අය අනන්ත සංසාරෙ සතර අපා ගත වෙලා දුක් විඳිනවා. හැබැයි ඒ පින් කරපු නිසා නෙවෙයි, පින හරියට යොදා ගත්තෙ නැති නිසා. ඕක තමයි අවසානයේ සිද්ධ වෙන්නෙ.

ඒ වගේම මේ ලෞකික අරමුණින් කරන පින් දහම්වලින් ඒ වගේ ලෞකික සැප සම්පත්තියක්ම ලැබෙනවයි කියල පෙන්වන්න පුළුවන් තවත් තැනක් තමයි පරනිම්මිත වසවර්ති කියන දිව්‍ය ලෝකය. ඒ තමයි දිව්‍ය ලෝකවලින් වැඩිම ආයුස සහ වැඩිම සැප සම්පත් තියෙන තැන. ඒ අය කරන පින් දහම්වලින් බලාපොරොත්තු වෙන්නෙ හුඟක් කල් ජීවත් වෙලා පංචකාම සම්පත්තිය විඳින්න. ඒ පරමාර්ථයෙන් පින් කරන නිසා ඒ අයට ඒ විදියට ආයුස ලැබෙනවා. හැබැයි පමාදෝ මච්චුනෝ පදං කියන තැන තමයි ඉන්නෙ. මච්චු කියන්නෙ මරණය. ඒ නිසා තමයි මච්චු මාර කියල කියන්නත් හේතුව. මොකද ජීවත් වුනත් මළ මිනියක් වගෙයි. මාර කියන එකේ එක අර්ථයක් තමයි ඒ. මොකද ඒ අය අනෙක් සියල්ලටම වඩා වැඩි ආයුසක් වින්දත් මැරිච්ච අය වගෙයි. ඒකට හේතුව තමයි ප්‍රමාදය. ඒ කියන්නෙ පංච කාමයේ ඇලී ගැලී ඒවම ආස්වාද විදියට අරගෙන ඒවටම ලෝකය හසුරුවමින්, ප්‍රමාදයට ඇද දමමින් යන ගමනක් තමයි ඒ අයට තියෙන්නෙ. මච්චු මාර කිව්වෙත් ඒකයි.

ඒ අය ආයුස කියල කියන්නෙ මේ ලෝකෙ සම්මත විදියට දිගු කලක්

ජීවත් වීම. වර්ණ කියල කියන්නෙ ශරීරය හොඳට ප්‍රබෝධමත්ව, හරියට මල් පිපිල වගේ ලස්සන වෙලා, හැඩ වැඩ වෙලා අනිත් සියල්ලන්ටම වඩා උපරිම ලස්සනින් ජීවත්වීම. නමුත් ඒ වර්ණය වෙන එකක්, ලෝකෝත්තර වර්ණය තව එකක්. ඒ නිසා ඒ අය බුදු දහම ඇහුවොත් වර්ණ වෙන්නෙ නෑ, එතකොට අඳුරු වෙනවා. යම් කිසි විදියකින් නිවන් දකින මගක් ගැන කතා කළොත් අඳුරු වෙනවා. ඒ නිසා බෞද්ධයින්ගෙ වර්ණය ඔවුන්ට නෑ. ලෝක සම්මතයේ වර්ණය විදියට සලකන කාමයන් ගැන කතා කළොත් ඒ අය හොඳට ප්‍රබෝධමත් වෙනවා, වර්ණවත් වෙනවා. ඒ වර්ණය තමයි ඒ අයට තියෙන්නෙ. ඒ තමයි ලෞකික පිනේ හැටි. ඒකෙත් සැපයක් තියෙනවා. ඒ තමයි ලෞකික පංචකාම සම්පත්තිය. සැපය කියල ඒ අය නැඹුරු වෙන්නෙ ඒකට. නමුත් බෞද්ධයො ලබන්නෙ ඒ සැපය නෙවෙයි. සමාධි සුවය, දැහැන් සුවය වගේ නිරාමිස සුවයක්. ඒකෙ උපරිමය තමයි නිවන් සුවය. එතකොට මේ සැප වර්ග දෙකක්. එකක් කාම සුවය, අනෙක කාමයන්ගෙන් නික්මීමේ නෙක්ඛම්ම සුවය.

එතකොට අර සමහර අබෞද්ධ අයටත් ලෝකයේ තියෙන ලෞකික කටයුතුවලින් හරියන්න හේතුව මොකක්ද, ඒ අය අබෞද්ධ වුනත් හොඳ වැඩ, සත්පුරුෂ ගුණ ඒ අය ළඟත් තියෙනවා. සත් පුරුෂයො වශයෙන් ඒ අය ලෞකිකව හොඳ දේවල් කරනවා. හිතේ ඊර්සියා, වෛරය, ක්‍රෝධය, කුහක ගතිවලින් තොරව ජීවත් වෙනවා. ඒ නිසා හේතුවට අනුකූල ඵලය ඒ අයටත් අවස්ථානුකූලව ලැබිල ඒ අය කරන වැඩත් හරි යනවා. ඒ වගේ අයටත් අමුතුවෙන් නැකත් හදන්න ඕන වෙන්නෙ නැත්තෙ ඒකයි.

එතකොට **ආර්ය ධර්මය තුළ කටයුතු කරන අයට නැකත් බලන්න අවශ්‍ය නෑ කිව්වෙ ඒක වැරදි නිසාවත්, එහෙම දෙයක් නැති නිසාවත් නෙවෙයි. ඒ අයට ස්වභාවයෙන්ම කොහොමත් නැකත් ලැබෙන නිසා අමුතුවෙන් මහන්සි වෙන්න ඕන නෑ.** නමුත් අද ඒ කාරණයත් වරද්දගෙන. ඒ නිසා තමයි බුදුන් වහන්සේ, නක්ඛත්ත පධානි ධාරේ තබ්බානි සකලානිවා ඒකදේසානිවා කියල, නැකත් පද සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ දරාගන්න, මිනිස්සු ඇහුවම උත්තර දෙන්න කියල චුල්ලවග්ග පාළියේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරල තියෙන්නෙ. ඉතින් නැකත් ශාස්ත්‍ර කියන්නෙ මිථ්‍යා දෘෂ්ටියක් නම් උන් වහන්සේ ඒ විදියට භික්ෂූන් වහන්සේලාට එහෙම දේශනා කරන්නෙ නෑ. මොකද මිනිස්සු නැකත් ගැන අහන කොට උත්තර දෙන්නෙ නැති වුණාම, භවත් ගෞතමයන්ගෙ ශ්‍රාවකයො මුකුත් දන්නෙ නෑ කියල මිනිස්සු දොස් කියනවා. ඒ වගේම බමුණන් අතරට ගියා නම් අපිට ඕව අහගන්න පුළුවන් කියල මිනිස්සු කියනවා.

එතකොට මිනිස්සු මොනව කිව්වත් ඒක මිථ්‍යා දෘෂ්ටියක් නම් බුදුන් වහන්සේ ඒක දරන්න කියල භික්ෂූන් වහන්සේලාට දේශනා කරන්නෙ නෑ. මොකද මිනිස්සු සතුන් මරාගෙන කන කොට, සොරකම් කරන කොට ඒව හොඳයි කියල වර්ණනා කළේ නෑ. අසත් පුරුෂයො කියල ඒ අයට ඒකෙ ආදීනව කිව්ව මිසක් ඒව අනුමත කළේ නෑ. ඒ නිසා මිනිස්සු අහන නිසාම නැකත් ශාස්ත්‍ර අනුමත කළා නෙවෙයි. ඒ විදියෙ වරදක්, මිත්‍යා දෘෂ්ටියක් නොවන යම් යහපත් ශාස්ත්‍රයක් තියේ නම් ඒක මිනිස්සුන්ගෙ යහපතට අනුමත කළා. ඒකෙ හේතුඵලය හරියට විග්‍රහ කරල දුන්නා. ඒ නිසා නැකත් ශාස්ත්‍ර ආදියට බුදුන් වහන්සේ ගරහල නෑ. මොකද ඒක ඍෂිවරුන්ගෙ භාෂිතයක්. නමුත් ඒවා දඩමීමා කරගෙන අසත් පුරුෂ වැඩ කරන බමුණන්ට නම් උන් වහන්සේ දොස් කියල තියෙනවා. හැබැයි ඒ කාරණය අද වරද්දගෙන, බුදුන් වහන්සේ නැකත් ශාස්ත්‍රවලට දොස් කිව්වා, ඒවා කරන්න එපා කිව්වා, මිථ්‍යා දෘෂ්ටි කිව්වා ... ආදී වශයෙන් කථා හදල තමන්ගෙ මත ප්‍රකාශ කරනවා. නමුත් ඒව තමන්ගෙ දෘෂ්ටි.

එතකොට මේ ආර්ය ධර්මය තුළ හරියට හැසිරෙන බෞද්ධයින්ටත් ස්වභාවයෙන්ම නැකත් පිහිටල සුභ වෙලාවල් ලැබෙන නිසා, ඒ විදියට නැකත් බලන්න අවශ්‍ය නෑ කිව්ව මිසක්, ඒවා කරන්න එපා කියල කිව්වෙ නෑ. මොකද මේ භෞතික ලෝකය තුළ යමකට යම් කිසි විදියකින් පරිසරය හැදුවොත්, ඒ වැඩ කටයුත්ත සාර්ථක කරගන්න උපනිශ්‍රයක් ලබන්න පුළුවන්. ඒ විදියට හොඳ පැත්ත නමුත්, ඒ හොඳ පැත්ත තියෙන කෙනාටත් ඒක පළදෙන්න සමනන්තරයක් හැදිල තියෙන්න ඕන. ඒ සමනන්තරයට ඉඩ හදල දුන්නොත් අනන්තරයක් ඇදිල ඇවිත් හොඳ පැත්තට තවත් උපනිශ්‍රය වෙනවා. හොඳ දේට හොඳ පරිසරයක් සකස් කළොත්, එහෙම ක්‍රමයක් තියෙනව නම්, ඒ ක්‍රමය අනුගමනය කළොත්, ඒ කාරණය උපනිශ්‍රය වෙලා ලැබෙන්න තියෙන යහපත තවත් ප්‍රබල වෙනවා. ආර්යන්ට වුනත් ඒක එහෙමයි. ඒක තවත් හොඳයි, විශේෂයක් වෙනවා. නමුත් ආර්ය ගුණ ධර්ම තුල කටයුතු කරන අයට ඒ වගේ නැකත් ශාස්ත්‍රවලටම වහල් වෙලා ඒවා පසුපසම ගිහින් ඒ මත්තෙම යැපෙන්න අවශ්‍ය නෑ. ඒ නිසා ඒ කාරණයේ ස්වභාවය ධර්මානුකූලව මේ විදියට තේරුම් ගන්න ඕන.

ඒ වගේම සමහර උදවිය යම්කිසි ආකාරයක නිමිති බලල, තත්කාල නිමිත්ත... ආදී වශයෙන් ගන්න ක්‍රමයක් තියෙනවා. ඒ වගේ අවස්ථාවකදි ගහක නමක්, මලක නමක්, සතෙක්ගෙ නමක්, එහෙම නැත්නම් ඉලක්කමක් ආදී වශයෙන් යම් යම් ද්‍රව්‍ය වස්තු, සත්ව පුද්ගල නාම ඇසුරින් ගන්න චක්‍රයක් තියෙනවා. ඒ චක්‍රානුසාරයෙන් ගත්තම ඒ පුද්ගලයා හිතපු අදහසට අනුව ප්‍රතිඵලය කියන්න පුළුවන්. හැබැයි ඒ පුද්ගලය අදහසට අනුව හිතල මතල සැලසුම් කරල ඒ වචන, ඉලක්කම්, ගස්වල, මල්වල නම් කිව්වෙ නෑ. පුද්ගලයගෙ හිතට ආපු අදහස තමයි කිව්වෙ. නමුත් ඒ පුද්ගලයගෙ තිබ්ච්ච මොකක් හරි අදහසක් බලපාල ඒ අදහස පිළිබඳ සම්බන්ධතාව අර මල්, ගස්, සතුන්, ඉලක්කම් ආදියෙන් සංකේතමත් වෙනවා. ඒක පටිච්ච සමුප්පාද සිද්ධාන්තයට අනුව හේතුඵල න්‍යායට අනුව සිද්ධ වෙන දෙයක්. ඒක ගැඹුරින් හොයාගන්න සූක්ෂම චක්‍ර ක්‍රමයක් තියෙනවා. ඒ ක්‍රමයට ඒ පුද්ගලය මේ අදහසින් ඇවිත් තියෙන්නෙ, මේ විදියට සිද්ධ කරන්න ඕන... ආදී වශයෙන් කියන්න පුළුවන්. ඒකෙනුත් පෙන්වන්නෙ ඒ පුද්ගලයගෙ අදහස හොඳ නම්, ඔහුගෙ හිතට එන්නෙ හොඳ දෙයක්, ඒකෙන් යහපතක් සිද්ධ වෙනවයි කියන එක. එතකොට ඒකට එන වෙලාවත් හොඳයි. ආර්ය ධර්මය තුළ කටයුතු කරන අයට නැකත් ශාස්ත්‍ර බලන්න ඕන නෑ කිව්වෙත් ඒකයි. අන්තිම නරකයි කියන වෙලාවකත්, ඒ වගේ පුද්ගලයෙක් දැන් හොඳයි කියල වැඩක් පටන් ගත්තොත්, ඒ වෙලාවට හොඳම වෙලාවක් අහු වෙනවා. මොකද ඒ පුද්ගලයගෙ හිත, ධර්මය තුළින් පටිච්ච සමුප්පාද සිද්ධාන්තය අනුව යහපත් විදියටම මෙහෙය වෙනවා. ඒ නිසා කවදාවත් ඒ වගේ කෙනෙකුට නරක වෙලාවක යහපත් කටයුත්තක් ආරම්භ කළා කියල චෝදනා කරන්න බෑ. ඒක ඔප්පු කරන්න විදියක් නෑ. ඒ කටයුත්තෙන් බොහොම සශ්‍රීක වෙලා ජයග්‍රහණය ලැබෙනවා. නමුත් සමහර විට මේ කාරණය තේරුම් ගන්න බැරි උදවිය, නැකත් ශාස්ත්‍ර කියන ඒව බොරුයි කියල දෘෂ්ටියකට බහිනවා. නමුත් නැකත් බොරු නෙවෙයි, නැකත් අහු වෙන ක්‍රමය ඕකයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# සත්වයින්ට පහළ වන විවිධ කායික අවස්ථා


*(පසුගිය කලාපයෙන්: සත්වයින්ගේ පරමායුස සහ උස මහත තීරණය වන හැටි....)*

මේ තිස් එක් තලයේ වාසය කරන දෙවි, බඹ, මිනිස්, සතර අපා කියන සියලුම සත්වයින්ගේ කයේ සනීභවන ස්වභාවය අනුව ඒකජ කය, ද්විජ කය, ත්‍රිජ කය, චතුජ කය කියන මේ කුමන හෝ ආකාරයක කාය සකස්වීමක් තියෙනවා. (අරූප බඹ ලොව බ්‍රහ්මයින්ට හැර) ඒ පිළිබඳ කෙටි විග්‍රහයක් තමයි මේ ලිපියෙන් ඉදිරිපත් කරන්නෙ.

මේ අවස්ථා හතරෙන් ඒකජ කය තමයි අති සූක්ෂතම අවස්ථාව. ඒක සර්වඥගෝචරයි. වෙනත් කිසිම කෙනෙකුට පේන්නෙ නෑ. ඒ කියන්නෙ බුදු ඇසට විතරයි පේන්නෙ. ඒ නිසා මේ ඒකජ කය ගැන කතා වෙන්නෙ බුදු දහමේ එන සර්වඥ ගෝචර කොටසක් හැටියට. එකම කර්ම ශක්තියෙන් ජනිත වන්නා වූ කියන අදහස තමයි ඒකජ කියන්නෙ. ඒ කියන්නෙ කර්ම ශක්තියේ පාලනය හැර වෙනත් කිසිම ආකාරයක බාහිර බලපෑමකින් මේ අවස්ථාව සකස් වෙන්නෙ නෑ. මනුස්සයෙක් මැරිල චුත වෙලා පටිසන්ධි වෙද්දි කාය, භාව, වස්තු කියන දසක තුන විතරයි ඒකජ කයට අයිති වෙන්නෙ. ඒ කියන්නෙ ශුද්ධාෂ්ඨක තුනක් විතරයි. ඒ නිසා තමයි බුදු කෙනෙකුගෙ අනාවරණඥානයට මිසක් වෙන කිසි කෙනෙකුට අහු වෙන්නෙ නැත්තෙ.

මෙතනදි කාය දසක කියන්නෙ කයේ හැඩය. උදාහරණ විදියට තනි පරමාණුවක් වුනත් ඒක භ්‍රමණ චක්‍රයක් විදියට කැරකෙන කොට යම් ආකෘතියකට අනුව තමයි කැරකෙන්නෙ. ඒක අධිවේගවත් කැරකීමක්. එතකොට ඒක යම්කිසි හැඩයක් ගන්නවා. ඒ කැරකීම නිසා එන හැඩය තමයි කයේ හැඩය වෙන්නෙ. ඊළඟට භාව කියන්නෙ ස්ත්‍රී හෝ පුරුෂ කියන ගති ලක්ෂණ දෙකෙන් එකක්. ඒ ගති ලක්ෂණත් ඒත් එක්කම සකස් කරන තවත් පරමාණුවක් තියෙනවා. ඒ පරමාණුව ඔප් නැංවිලා තියෙන්නෙ ස්ත්‍රී හෝ පුරුෂ ගතිය අනුව. ඒකත් අර කාය දසකයට අනුව කැරකෙනවා. වස්තු දසකය කියන්නෙ වස්තු රූපය. ඒක මනෝමය කයේ හදවත ඇසුරු කරගෙන පවතිනවා. වස්තු රූපයෙන් තමයි යමක් ගෝචර කර ගන්නෙ.

ඒ වගේම මේ ඒකජ කය කියන අවස්ථාව ඇසි පිය ගහන මොහොතකටත් වඩා කුඩා අවස්ථාවක තියෙන දෙයක්. ඒ වගේම පටිසන්ධි මොහොතකදි විතරයි ඒ වගේ අවස්ථාවක් උදා වෙන්නෙ. එතනදි මනුස්ස හෝ තිරිසන් පටිසන්ධියක් නම් දසක තුනක් ඇවිත් පටිසන්ධියෙන් පස්සෙ ගන්ධබ්බ වුනාම තමයි දසක 7 ම සම්පූර්ණ වෙන්නෙ. දෙවියෙකුට තියෙන ඕපපාතික උප්පත්තියකදි නම් පටිසන්ධියේදි මීට



අමතරව ජිව්හා, ඝාන කියන දසකත් එක්ක දසක 7 ම පහළ වෙනවා. ඒ කියන්නෙ කාය, භාව, වස්තු, චක්ඛු, සෝත, ඝාන, ජිව්හා කියන දසක හත.

මේ දසක කියල කියන්නෙ පරමාණු 10 ගොඩවල්. ඒ විදියට 10 බැගින් එකතු වෙලා තමයි මූලිකම කය සකස් වෙන්නෙ. පරමාණු 10 ගොඩක් කියල කිව්වට ඇත්තටම එකම පරමාණුවේම පරිවර්තන, පරිභ්‍රමණ වගේ අවස්ථා 2 කින් තමයි 10 ක් හැදෙන්නෙ. මෙතනදි ශුද්ධාෂ්ඨකයක් කියන්නෙ ශුද්ධ වූ කොටස් 8 කින් (ශුද්ධ වූ අටකය) හැදිච්ච අවස්ථාවක්. මේ 8 වෙන් කරන්න බෑ. ඒ නිසා තමයි මේවට අවිනිර්භෝග රූප කලාප කියන්නෙ. (ආපෝ, තේජෝ, වායෝ, පඨවි, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන අවස්ථා 8) මේ අටේම ක්‍රියාදාමය තමයි රූප වශයෙන් ගන්නෙ. හැම වෙලේම මේ 8 ක් එකට එන්නෙ. ඒක ශුද්ධාෂ්ඨකවලින් 10 ක් කරන්න බෑ. නමුත් ඒ අටට ජීවිත රූපයයි, වස්තු රූපයයි දෙකත් එකතු වුනාම තමයි දසකයක් හැදෙන්නෙ. හැබැයි ඒ දෙකත් ඒකෙම තියෙන්නා වූ රූප දෙකක්. එතකොට ඒ 10 ම හැදෙන්නෙ එකම ශුද්ධාෂ්ඨකයෙන්. මනුස්සයෙක් හෝ තිරිසනෙක් පටිසන්ධි ලබන මොහොතෙදි ඒ වගේ ශුද්ධාෂ්ඨක 3 යි (දසක 3 යි) හට ගන්නෙ. ඒක තමයි කාය, භාව, වස්තු දසක කියල කිව්වෙ. ඒ නිසා හැම වෙලේම මේ පූර්ණ අවස්ථාව කියන එක දෙවි, බඹ, මිනිස්, තිරිසන් කියන මේ ඕනෑම අවස්ථාවක පටිසන්ධි මොහොතක හැර වෙනත් කිසිම අවස්ථාවක දක බලාගන්න බෑ. ඒ පටිසන්ධි අවස්ථාව තමයි ජාති කියල කියන්නෙ.

ඊළඟට ද්විජ කාය කියන කොට ඒ පටිසන්ධි අවස්ථාව (ඒකජ කය) ඉක්මවා ගිහින් සුළු මොහොතකින් ඒක ගන්ධබ්බ ලෝකෙදිම ඍතු විපර්යාසයට පත් වෙනවා, පරණ වෙනවා. ඒ කියන්නෙ හට ගත්තු මොහොතෙ පටන් උප්පාද, ඨිති, භංග කියන අවස්ථා තුනේ ක්‍රියාකාරීත්වයට හසු වෙනවා. මොකද හට ගත්තු යම් දෙයක් තියේ නම් ඒක උප්පාද අවස්ථාවෙන් නවතින්නෙ නෑ. ඨිති අවස්ථාවෙන් විපරිනාමයට පත් වෙලා භංග අවස්ථාවෙදි නිදහස් වෙනවා. ඒක තමයි උතුජ අවස්ථාව කියන්නෙ. ඒ කියන්නෙ ඍතු විපර්යාසයෙන් වන පරිනාමයක්. තවත් විදියකින් කියනව නම් සිටියහුගේ (උප්පාද සහ භංග අතර සිද්ධ වෙන වෙනස්වීමක්) විපරිනාමයක්. එතකොට සංඛතයකට ලක්ෂණ 3 ක් තියෙනවා. ඒ තමයි උපතක්, විපරිනාමයක්, භංගයක්. ඒ නිසා මේ හැම රූපයක්ම සංඛතයි.

එහෙනම් උප්පාද අවස්ථාව ඉක්මවා ගිහින් ඨිති අවස්ථාවට පත් වෙලා භංග වෙන කොට ඒක උතුජ අවස්ථාවට පත් වෙනවා. උතුජ හෙවත් ඍතු කියන්නෙ ඒකෙ තියෙන්නා වූ වෙනස්වීම, විපර්යාසය. ඒ කියන්නෙ ඒ අවස්ථාවෙදි ඒකට තියෙන කර්මජ ක්‍රියාවලිය පරිවර්තනය වෙනවා. ඊට පස්සෙ ඒක මොහොතකින් නිදහස් වෙනවා. ඒ විදියට නිදහස් වෙන හැම රූපයක්ම උතුජ රූප බවට පත් වෙනවා. නමුත් කර්ම ශක්තියෙන් නිදහස් කර දුන්න ශක්තිය නිසා අර ශුද්ධාෂ්ඨක යළි යළිත් භ්‍රමණය කරවමින් නැවතත් මේ ක්‍රියාවලියම සිද්ධ කරමින් උතුජ රූප හදනවා. ඒ නිසා කර්මජ කය (ඒකජ කය) දිගටම ක්‍රියාත්මක වෙනවා. එතකොට මේ කර්මජ ශක්තියයි, උතුජ ශක්තියයි කියන කාරණා 2 කින් ජනිත කරන නිසා ඒකට ද්විජ කය (දෙකකින් ජනිත වූ) කියල කියනවා. ඒ නිසා මේ ඒකජ කයම තමයි ඍතු විපර්යාසයෙන් ද්විජ කය බවට පත් වෙන්නෙ.

එතකොට මේ කියන ද්විජ කායික සත්වයො ඉන්නෙ අසඤ්ඤ කියන රූපාවචර බඹ ලොවේ විතරයි. ඒ කියන්නෙ ඒ අයට චිත්තජ කයක් නෑ. චිත්තජ කයක් තිබුණොත් ඒක ත්‍රිජ කායික වෙනවා. ඒ කියන්නෙ ද්විජ කයක් (කර්මජ කයක්) එක්ක චිත්තයක් සම්බන්ධ වුනොත් තමයි චිත්ත රූප ගොඩ නගමින් ඒක ත්‍රිජ කායික වෙන්නෙ. නමුත් චිත්තජ කයක් අසඤ්ඤ සත්වයින්ට නෑ. ඒ කියන්නෙ මේ ද්විජ කායික අවස්ථාවට සිතක් නෑ. සිත නැති කය විතරයි. සිතක් නැති නිසා කය කර්ම ශක්තියෙන් තමයි පවත්වන්නෙ. මොකද හිතක් හට ගන්න නම් මනංච පටිච්ච ධම්මේච උප්පජ්ජති මනෝ විඤ්ඤාණං කියන ක්‍රියාවලිය සිද්ධ වෙන්න ඕන. නමුත් මේ අසඤ්ඤ තලයෙදි මනේන්ද්‍රිය අක්‍රියයි. ඒක සංකෝචනය කරල තාවකාලිකව යටපත් කරල තියෙන්නෙ. කවද හරි ඒ අසඤ්ඤ තත්ත්වයට හිමි මහා කල්ප 500 ක ආයුස ගෙවිල ඉවර වෙච්ච දවසට තමයි නැවතත් මනසට ධර්මය සට්ටනය වෙලා ක්‍රියාත්මක වෙන්නෙ. එදාට තමයි සිතිවිලි පහළ වෙලා එතනින් චුත වෙන්නෙ. එතකල් මනසට ධර්මයක් ගැටෙන්න ඉඩක් නෑ. කර්ම ශක්තියෙන් ඒක නවත්වල තියෙන්නෙ. මොකද අසඤ්ඤ කිව්වම සඤ්ඤා එන්න විදියක් නෑ. මනංච පටිච්ච ධම්මේච කියන තැනට එන්න නම් මනසට ධර්මයක් ගැටෙන්න ඕන. එතකොට තමයි මනෝ විඤ්ඤාණය පහළ වෙන්නෙ. මනෝ විඤ්ඤාණයක් පහළ වුනේ නැත්නම් හිතක් පහළ වෙන්නෙ නෑ. අනිත් අවශ්‍ය දේවල් තිබුණට ක්‍රියාත්මක වෙන්නෙ නෑ. මනේන්ද්‍රිය ගොඩ නගන්න කර්ම ශක්තිය තිබුණට සිතිවිලි නැති නිසා මනේන්ද්‍රිය අක්‍රියයි. **හිතක් නැති නිසාම ඒ අසඤ්ඤ තලයේ ඉන්න බ්‍රහ්මයින්ට එක් කෙනෙකුට එක්කෙනෙක් පේන්නෙ නෑ. බලන්න විතරක් නෙවෙයි අහන්න, ගඳ සුවඳ දැන ගන්න, ස්පර්ශ දැන ගන්න මේ එකක්වත් බෑ. මුකුත් දැනුම් දෙන මානසිකත්වයක් නෑ. මහා කල්ප 500 ක ආයුස ඉවර වෙන කල්ම සිත ක්‍රියාත්මක වෙන්නෙ නෑ.** ඒ තමයි ද්විජ කායික අවස්ථාව. එතකොට අසඤ්ඤ තත්ත්වයේ ඉන්න බ්‍රහ්මයින් අනිත් අයට බලන්න බෑ. මොකද ඒකෙ තියෙන්නෙත් ශුද්ධාෂ්ඨක විතරයි. ශුද්ධාෂ්ඨකවලින් හට ගන්න අති සූක්ෂම අවස්ථාව දකින්නෙ ලොවුතුරා බුදුන් වහන්සේ නමක් විතරයි.

ඊළඟට රූපාවචර බ්‍රහ්ම ලෝකයේ ඉන්න අනෙක් බ්‍රහ්මයින්ට යම්කිසි විදියකින් චිත්තජ කයක් ලැබෙනවා. ඒ චිත්තජ කය හෙවත් හිත හට ගත්තට පස්සෙ ඒ අය ප්‍රීතිය ආහාර කරගෙන ජීවත් වෙනවා. ප්‍රීතිය කියන්නෙ චෛතසිකයක්. චෛතසික කියන්නෙ සිත සමග එක් වූ කියන එක. ප්‍රීතිය නිසා චිත්තජ රූප හැදෙනවා. එතකොට ඒ අවස්ථාවට කර්මජ කය, චිත්තජ කය, උතුජ කය (ඍතු) කියල කයවල් 3 ක් සම්බන්ධයි. ඒ තුනෙන්ම හට ගත්තු රූප පොදිය තමයි ත්‍රිජ කායික අවස්ථාව කියන්නෙ. මේ අවස්ථාව තියෙන්නෙත් රූපාවචර බ්‍රහ්මයින්ට විතරයි. අනෙක් සත්වයින්ට මේ ත්‍රිජ කායික අවස්ථාව පටිසන්ධියෙන් පස්සෙ ගන්ධබ්බ මොහොත වෙනකල් තිබිල, ඒ මොහොත ඉක්ම ගිහින් ගන්ධබ්බ අවස්ථාවට ආවම, කර්ම ශක්තියෙන්ම යොමු කර දෙන්නා වූ ඉතා සියුම් උතුජ ආහාරයෙන් චතුජ සූක්ෂම කයක් බවට පත් වෙනවා. එතකොට බ්‍රහ්මයින්ට විතරයි මේ ත්‍රිජ කායික අවස්ථාව අත්බැව ඉවර වෙනකල්ම පවතින්නෙ. හැබැයි මේ අවස්ථාව බුදුන් වහන්සේට අමතරව රහතන් වහන්සේලා ඇතුළු දිව්‍යස් අභිඤ්ඤාලාභීන්ටත් දැක බලාගන්න පුළුවන්. ඒ වගේම බ්‍රහ්මයින්ගෙ දිව්‍යසටත් මේ බ්‍රහ්ම අවස්ථාව පේනවා. නමුත් දෙවියන්ට පේන්නෙ නෑ.

හැබැයි මේ ත්‍රිජ කායික අවස්ථාව දකින්න පුළුවන් වෙන්නෙත් ඍද්ධි අභිඤ්ඤා තියෙන සියල්ලටම නෙවෙයි. මොකද සමහර විට ඍද්ධි අභිඤ්ඤා බල අඩු අයට බ්‍රහ්මයො දැක බලා ගන්න බැරි වෙන්න පුළුවන්. **නමුත් යම්කිසි විදියකින් බ්‍රහ්ම කය (චිත්තජ රූපය) ඝනීභවනය කළොත් ඒ අවස්ථාව සාමාන්‍ය අයටත් දකින්න පුළුවන්. එහෙම නැත්නම් ප්‍රකෘති තත්ත්වයෙන් සාමාන්‍ය අයට දකින්න බෑ.** ඒ නිසා අවස්ථානුකූලවයි ඒක දැකබලා ගන්න පුළුවන් වෙන්නෙ. උදාහරණ විදියට ගිජ්ජකූට පර්වතය පාමුල සැරි සරපු පෙරේත රූළක් දැක්කෙ බුදුන් වහන්සේ හැරුනම මුගලන් මහ රහතන් වහන්සේ විතරයි. එතකොට ඒ පෙරේත රූළ චතුජ සූක්ෂම කයෙන් ඉඳලත් අනෙක් අයට බලාගන්න බැරි වුනා නම්, ඊටත් වඩා සූක්ෂම ත්‍රිජ කායික බ්‍රහ්මයො දකින එක කොච්චර අමාරුද? ත්‍රිජ කායික බ්‍රහ්මයො අතරත් ඉහළ බඹ තලවල ඉන්න අයට, ඊට පහළ බඹ තලවල බ්‍රහ්මයින් පෙනුනට පහළ අයට ඉහළ අය පේන්නෙ නෑ. නමුත් ඉහළ ඉන්න අය කය ඝනීභවනය කරගෙන පහළට ආවොත් ඒ අයටත් පේනවා.

ඊළඟට අරූප ලෝකෙ බ්‍රහ්මයින්ට තියෙන්නෙ මනේන්ද්‍රිය විතරයි. හිත මිස කය නැති බඹ ලොව කියන්නෙ ඒකයි. ඒ කියන්නෙ වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන උපාදානස්කන්ධ 4 තියෙනවා. නමුත් රූප උපාදාන ස්කන්ධයක් නෑ. හැබැයි රූපයන්ගේ අනු රූප මාත්‍රයක් උපාදාන කරගෙන ඉන්නෙ. මොකද රූපස්කන්ධයේ අනුරූප මාත්‍රයක්වත් නැතිව හිතක් හට ගන්නෙ නෑ. ඒ සඳහා වස්තු රූපයක් තියෙන්නම ඕන. වස්තු රූපය කියන්නෙ සතර මහා භූතවලින් හැදිච්ච එකක්. නමුත් බ්‍රහ්මයින්ට තියෙන්නෙ ඒකෙ අනුරූප මාත්‍රයක් විතරයි. ඒකෙන් තමයි හිතක් හට ගන්නෙ. නමුත් මේ අවස්ථාවෙදි ඒක වස්තු රූපයේ අනුරූප රූප මාත්‍රයක් විතරයි. ඒ නිසා කයක් විදියට ගණන් ගන්න බෑ. එතකොට මේ කියන අරූප බ්‍රහ්ම ලෝකයේ ඉන්න බ්‍රහ්මයන් අර ඒකජ, ද්විජ ආදී වශයෙන් කියන අවස්ථා 4 න් මොකකටවත් අහුවෙන්නෙ නෑ. මොකද ඒ අවස්ථා 4 ටම කය සම්බන්ධයි. ඒ නිසා මෙතනදි නාම ධර්මයක් විදියට තමයි ගැනෙන්නෙ. කයක් කියල පෙන්වන්න දෙයක් නෑ. ඉන්ද්‍රිය වශයෙන් ක්‍රියාත්මක වීමක් නෑ. මොකද පංචේන්ද්‍රියන්ගෙන් ස්පර්ශ කරන්න වස්තු රූපයක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා එතන සතර මහා භූත රූප තියෙන්න ඕන. සතර මහා භූත රූප තමයි අපි මේ කයක් කියල ගන්නෙ. මොකද ශුද්ධාෂ්ඨකය සතර මහා භූතයි. නමුත් සතර මහා භූත රූප නැති වුණාට මේ අරූපී බ්‍රහ්මයින්ට පෙර ගෝචර කරගත් රූපවල සටහන් අනුශය වශයෙන් තියෙනවා. ඒ සටහන් එන්නෙත් අත්බැව අවසානයේ. එතකල් සිතින් නිශ්චලයි. ඒ වගේම රූප කිව්වම භූත රූප, ප්‍රසාද රූප, විෂය රූප ආදී වශයෙන් රූප කොටස් 28 ක් තියෙනවා. එතකොට ඒ සියල්ලම සතර මහා භූත රූප නෙවෙයි. ඔය 28 න් 4 යි මහා භූත රූප වෙන්නෙ. ආපෝ තේජෝ, වායෝ, පඨවි කියන්නෙ ඒ හතර.

ඒ වගේම මේ ප්‍රසාද රූප කියන ඒවා මහා භූත රූපයන්ගෙන් තොරව තනියෙන් හට ගන්නෙත් නෑ. ඒ දෙක හැම තිස්සෙම එකට බැඳිල තියෙන්නෙ. එතකොට අර කලින් සඳහන් කරපු ශුද්ධාෂ්ඨකයේ තියෙන රූප කොටස් 8 න් 4 ක් භූත රූප, අනෙක් 4 ප්‍රසාද රූප. වර්ණ, ගන්ධ, රස, ඕජා කියන්නෙ ඒ ප්‍රසාද රූප 4. මේවා ගත්තම වර්ණයෙන් චක්ඛු ප්‍රසාදයත්, ගන්ධයෙන් ඝාන ප්‍රසාදයත්, රසයෙන් ජිව්හා ප්‍රසාදයත්, ඕජාවෙන් කාය ප්‍රසාදයත් හට ගන්නවා. සෝත ප්‍රසාදය මේ හතරෙම සංකලනයක්.

ඒ වගේම මේ සතර මහා භූත සහ සතර මහා ධාතු කියන්නෙ අවස්ථා 2 ක්. උදාහරණ විදියට කරජ කය හෙවත් මස් ලේ කය හැදිල තියෙන්නෙ සතර මහා ධාතුවලින්. ධාතු කිව්වම ඒක ඝනීභවන අවස්ථාවක්. මේ ධාතු 4 න් හදන ආහාර තමයි ඝනීභවන කබලිංකාර ආහාර කියන්නෙ. බත්, පාන් ආදී ඝන ආහාර කියන්නෙ ඒ වගේ ධාතුවලින් හැදිච්ච ආහාර. මේ ධාතු 4 න් පඨවි ධාතුව ඝනීභවන වෙලා තමයි කෙස්, ලොම්, නිය, දත් ආදිය හට ගන්නෙ. පිත, සෙම්, සොටු, සැරව, ලේ ආදිය ආපෝ ධාතුව විදියට තමයි ගැනෙන්නෙ. එතකොට ඒව සතර මහා භූත නෙවෙයි. සතර මහා භූත කියන්නෙ ඊටත් වඩා සියුම් අවස්ථාවක්. ඒ සතර මහා භූතවලින් තමයි සූක්ෂම චතුජ කය හැදෙන්නෙ. මේ සතර මහා භූත කියන අවස්ථාව ඉක්ම ගිහින් තමයි සතර මහා ධාතු බවට පත් වෙන්නෙ. ඒ නිසා ලෝකෙ ආපෝ ධාතුව කිව්වොත් අයිති වෙන්නෙ ද්‍රව දේවල්, තේජෝ ධාතුව කිව්වම උෂ්ණ දේවල්, වායෝ ධාතුව කිව්වම මේ හමන වායුව, පඨවි ධාතුව කිව්වම තද දේවල්. මෙන්න මේ වගේ ධාතු 4 න් හැදෙන කයට තමයි චතුජ කයේ ඝනීභවන අවස්ථාව වන කරජ කාය හෙවත් මස් ලේ කය කියන්නෙ. එතකොට සතර මහා භූත එකතු වෙලා කැටි වෙලා හැදිච්ච එක තමයි චතුජ සූක්ෂම කය කියන්නෙ. ඒ වගේම සූක්ෂම කබලිංකාර ආහාර හැදෙන්නෙත් මේ සතර මහා භූත එකතු වෙලා. ඒ සතර මහා භූත එකතුවෙලා කැටි වෙලාම තමයි ඊළඟට සතර මහා ධාතු අවස්ථාවට පරිවර්තනය වෙලා කබලිංකාර ඝන ආහාර හැදෙන්නෙ.

එතකොට මේ රූප 28 න් 4 ක් හැර ඉතිරි 24 ම සතර මහා භූත නොවන රූප. උදාහරණ විදියට අපි හීන ලෝකයක් දැක්කයි කිව්වොත් ඒකෙත් රූප තියෙනවා. හැබැයි ඒවා සතර මහා භූත නෙවෙයි. නමුත් සතර මහා භූත රූප නිසා උපන් රූප වර්ගයක්. අරූප බඹ ලොව තියෙන්නෙත් එහෙම ස්වභාවයක්. අරූප කියල කිව්වට රූපයෙන්, වේදනාවෙන්, සඤ්ඤාවෙන්, සංඛාරයෙන් තොරව විඤ්ඤාණයක ගමනක්, හිටීමක්, චුතියක්, වෘද්ධියක් (වැඩි දියුණු වීමක්) නෑ කියල ධර්මයේ පෙන්වනවා. හැබැයි එතනදි රූප කියල කිව්වට සතර මහා භූත රූප මුල් කරලම කිව්ව නෙවෙයි. සතර මහා භූත රූප නැතිව අර 24 ට වැටෙන රූප තියෙනවා. ඒ වගේ අවස්ථාවක් (අනුරුවක්) තමයි මේ කියන්නෙ.

උදාහරණ විදියට ඇස ආබාධ නැතුව හොඳට පේන්න තියෙනව නම්, බාධකයකින් තොරව ඇසට එන්න රූපයකුත් තියෙනව නම්, ආලෝකයත් තියෙනව නම් පැහැදිලිවම ඒ රූපය මස් ලේ ඇහැට ගැටිල මනසෙ පිහිටනවා. ඒක රූපස්කන්ධයන්ට සංග්‍රහ වෙනවා



(ඇතුලත් වෙනවා). හැබැයි අර රූපයේ භෞතිකව තියෙන සතර මහා භූත නෙවෙයි සංග්‍රහ වෙන්නෙ. ඒ සතර මහා භූත නිසා හට ගන්නා ඡායාවන්. ඒ ඡායාවන් තමයි සංග්‍රහ වෙලා රූපස්කන්ධ විදියට පිහිටන්නෙ. ඒකට ඡන්ද රාගයෙන් බැඳුනොත් තමයි උපාදානස්කන්ධයක් බවට පත් වෙන්නෙ. එතකොට රූපස්කන්ධය කියන්නෙ සතර මහා භූත විතරයි කිව්වොත් ඒක වැරදියි. සතර මහා භූත කියන්නෙ එක රූප කොටසක් විතරයි. ඒ තමයි මස් ලේ ඇහැට පේන කොටස. ඒ වගේම සතර මහා භූත නිසා හට ගන්නා තවත් රූප තියෙනවා. ඒව තමයි රූපස්කන්ධයට සංග්‍රහ වෙන්නෙ. හැබැයි ඒ සතර මහා භූත නිසාම හට ගත්තු ඡායා මාත්‍රත් රූපම තමයි. අනෙක් රූප 24 ම හට ගන්නෙත් ඒ ප්‍රධාන සතර මහා භූත කියන රූප නිසා. ඒ ඉතිරි ඒව තමයි ගෝචර රූප, ප්‍රසාද රූප ආදී වශයෙන් කියන්නෙ. ඒව ඇහැට රූප වශයෙන්, කනට ශබ්ද වශයෙන්, නාසයට ගන්ධ වශයෙන් ගන්නවා. එහෙම ගත්තට පස්සෙ ඒවට කියන්නෙත් රූප කියල. රූප - රූප, ශබ්ද - රූප, ගන්ධ - රූප, රස - රූප, ස්පර්ශ - රූප ආදී වශයෙන් ඒවා මතකයේ තියෙනවා. මතක් කරල ගත්තම ඒ රූපවලින් ලෝකයක් මනසේ මවන්න පුළුවන්. ඒ මවාගත්තු ලෝකෙ මනසින් ඉන්නත් පුළුවන්. හැබැයි ඒකෙ සතර මහා භූත නෑ. මොකද යළි යළිත් ඇහෙන් රූප බලන, කනින් ශබ්ද අහන බලාපොරොත්තුවක් නෑ. ඒ තමයි අරූපී බ්‍රහ්ම ලෝකයේ ස්වභාවය. ඒ කියන්නෙ වර්තමාන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ගන්න බලාපොරොත්තුවක් නෑ. එතකොට ඒ පුද්ගලය මනසින් අතීතයට යනවා. එහෙම අතීතයට ගිහින් ගත්තු මතක සටහන් පස්සෙ තමයි ඊළඟට ඉන්නෙ. ඒකට තමයි මනේන්ද්‍රිය හෙවත් නාමේන්ද්‍රිය කිව්වෙ. ඒකෙ තියෙන්නෙ මතක රූප.

ඊළඟට චතුජ කය කියන්නෙ ඉහත අවස්ථා 3 ටම වඩා ඝනීභවනය වෙච්ච, ඉතා සූක්ෂම කබලිංකාර ආහාරයේ පටන් ඝනීභවන ආහාරයෙන් ජීවත් වන අවස්ථාවක්. ඒකෙ මුල්ම අවස්ථාව තමයි කබලිංකාර ආහාරයේ ගඳ, සුවඳ මට්ටමින් ජීවත් වන ඉතා සූක්ෂම මනෝ කායික අවස්ථාව. දෙව් දේවතාවො, ගන්ධබ්බයො, ප්‍රේතයො, යක්ෂයො, අමනුස්සයො ආදීන්ට තියෙන්නෙ මේ චතුජ කයේ සූක්ෂම අවස්ථාව. ඊට පස්සෙ ඒකෙ ඝනීභවන අවස්ථාව තමයි තිරිසනුන්ට සහ මනුස්සයින්ට තියෙන මස් ලේ කය හෙවත් කරජ කය කියන්නෙ. ගල් භූතයින්ට තියෙන්නෙ ඊටත් වඩා වැඩි ඝනීභවන අවස්ථාවක්. මේ කයවල් 4 න් ඒ තමයි උපරිම ඝනීභවන අවස්ථාව. මේ චතුජ කයේම අවස්ථා 2 ක්. එකක් සූක්ෂම අවස්ථාව. අනෙක කරජ අවස්ථාව. ඊළඟට අට මහ නරකය, ඔසුපත් නරකය වගේ තැන්වල ඉන්න තිරි සතුන්ට තියෙන්නෙ චතුජ කයේ සූක්ෂම අවස්ථාව. ඒ අයටත් වේදනා, සඤ්ඤා ආදී සියල්ලම දැනෙනවා.

ඒ වගේම **හොල්මන් කියල දකින්නෙත් මේ චතුජ කයේ සූක්ෂම අවස්ථාවක්. සමහරක් අමනුස්ස, ප්‍රේත ආදීන්ට ඒ සූක්ෂම කය යම්කිසි විදියකින් පෙන්වන්න හිතුනොත් ඒ අයගෙ චිත්ත වේගය අනුව පහළ වෙන කර්ම විපාක ඍද්ධියෙන් ඒ කය මිනිස්සුන්ට පේන්න සලස්වන්න පුළුවන්.** ඒ වගේම පුණ්‍ය ඍද්ධි තියෙන දෙවියන්ටත් තමන්ගෙ කය ඒ විදියට පේන්න සලස්වන්න පුළුවන්. තමන්ට ඒ තියෙන බලයෙන් කය ඝනීභවනය කරන්න ඒ වගේ අයට ☞

පුළුවන්. එහෙම ඝනීභවනය කළොත් ඒ වෙලාවෙදි මස් ලේ ඇහැට ඒක පේනවා. පේන මට්ටමට ඝනීභවන කරන්න ඕන කියල හිතුනොත් එහෙම කරන්න පුළුවන් අමනුස්ස ප්‍රේත ආදී කොටස් ඉන්නවා. එතකොට හොල්මන් වගේ තමයි පේන්නෙ. ඒ කියන්නෙ හිටි ගමන් පෙනී ඉඳල හිටි ගමන් අතුරුදන් වෙන්න පුළුවන්. ඒ කරන්නෙ අර විදියට සූක්ෂම චතුජ කය ඝනීභවනය කිරීමෙන්. ඒ වගේ අවස්ථා විශේෂයෙන් පේන්නෙ හවස් යාමයට හෝ පාන්දරට වගේ අඩ අඳුර තියෙන වෙලාවල්වලට. එහෙම නැත්නම් රාත්‍රියට. ඒකට හේතුව තමයි සූක්ෂම රූපයක් පේන්නෙ සාමාන්‍යයෙන් අඩ අඳුරෙදි. එහෙම නැත්නම් රාත්‍රියෙදි. තද ආලෝකයට ඒක පේන්නෙ නෑ.

උදාහරණ විදියට තද අව්වෙ පහනක් පත්තු කරල තිව්වොත් ඒ පහන් දැල්ල ලේසියෙන් පේන්නෙ නෑ. නමුත් හැන්දෑවට හෝ රෑට පත්තු කළොත් කණාමැදිරි එළියක් වගේ පුංචි දැල්ලත් පේනවා. හැබැයි කණාමැදිරි එළියත් දවල්ට පේන්නෙ නෑ. මොකද අව්ව සැරට උගේ පුංචි එළිය පේන්නෙ නෑ. නමුත් රෑට ඒ පුංචි එළියත් හොඳින් දර්ශනය වෙනවා. **මෙන්න මේ වගේ සූක්ෂම ශරීර පෙන්වන්නෙ යම්කිසි දීප්තියකින්. ඒකෙන් විහිදෙන යම්කිසි වර්ණ කිරණකින් අමනුස්සයො පෙන්නුම් කරනවා. එහෙම පෙන්වන්නෙත් බොහෝ දුරට යම්කිසි චිත්ත බල තියෙන අයගෙන් විහිදෙන කිරණ ශක්ති උපනිශ්‍රය කරගෙන. විශේෂයෙන් ඍද්ධි අභිඥා ලාභීන් ඉන්න කොට ඒ අයගෙන් විහිදෙන ශක්ති විශේෂ ඔය අමනුස්ස, ප්‍රේත ආදීන්ට ආධාරයක් වෙනවා. ඒ කිරණ ශක්තිවලින් ඒ අයට පෙනී හිටින්න අවශ්‍ය කරන සූක්ෂම ශක්තියක් ලබාගන්නවා. ඒ ශක්තිය ආධාර කරගෙන තමයි බොහෝ කොටම මනුස්සයින්ට පේන්න ඉන්නෙ. ඒකත් එක්තරා හැකියාවක්.**

ඒ වගේම සමහර විට සාමාන්‍ය මනුස්සයින්ගෙ ශරීරවලිනුත් යම්කිසි කිරණ ශක්ති විහිදෙන අවස්ථා තියෙනවා. එතකොට ඒ වගේ අවස්ථාවලට අනුකූල වීම කියල දෙයක් සමහර අමනුස්සයින්ට තියෙනවා. අන්න ඒ විදියට සමහර මනුස්සයින්ගෙන් පිටවන කිරණ ආධාර කරගෙනත් සමහර අමනුස්ස ප්‍රේත ආදීන්ට පෙනී හිටින්න පුළුවන්. නමුත් සියල්ලටම ඒ වැඩේ කරන්න බෑ. මොකද ඒ වගේ පුද්ගලයො අවට හිටියොත් තමයි ඒ අනුකූල වීම සිද්ධ වෙන්නෙ. එක්කො ඍද්ධි අභිඥාලාභීන් ඉන්න ඕන. එහෙම නැත්නම් අමනුස්සයින්ට ගෝචර කර ගන්න පුළුවන් ශක්ති විහිදෙන පුද්ගලයො ඉන්න ඕන. ඒ නිසා තමයි මේ අමනුස්ස ප්‍රේත ආදීන් හැමෝටම හැම අවස්ථාවකම පේන්නෙත් නැත්තෙ. මොකද අර වගේ ශක්ති විශේෂ නැත්නම් කය ඝනීභවන කරන්න බෑ.

ඒ වගේම ඒ විදියට **අපිට ඒ අමනුස්ස ප්‍රේත ආදීන් පෙනුනට අල්ලන්න බැලුවම අහුවෙන්නෙ නෑ. හැබැයි ඕන නම් අතට අහුවෙන්න ඝනීභවනය කරන්න පුළුවන් සමහර අමනුස්ස කොට්ඨාසත් ඉන්නවා. එහෙම කරන්න පුළුවන් අමනුස්සයො තමයි ඔය සමහර වෙලාවට ඇවිත් පුද්ගලයන්ට පහර දෙන්නෙ, දොරවල් බඩු මුට්ටු පෙරලන්නෙ, පහුරු ගාන්නෙ, පුද්ගලයොත් එක්ක පොර බදන්නෙ.** ඒ වගේ අයට විවිධ වෙස් මවාගෙන එන්නත් පුළුවන්. ඒ සියල්ලම සූක්ෂම චතුජ කයේ අවස්ථා.

ඒ වගේම මනුස්සයෙක් වශයෙන් ජීවත් වෙලා මරණින් පස්සෙ චුත නොවී ගන්ධබ්බයෙක් විදියට හිටියොත් චිත්තජ කයේ ආකෘතියක් එක්කමයි ඉන්නෙ. එතකොට ඒ වගේ ගන්ධබ්බයින්ගෙ සූක්ෂම කයට අමතරව මනුස්ස වෙලා ඉඳෙද්දි වඩාත් ප්‍රියමනාපයෙන් ඇඳල හිටපු සරම්, කබා ආදියත්, පළඳල හිටපු ආභරණ ආදියත් ඒ ලෝකෙ සූක්ෂම කයත් එක්කම නිර්මාණය වෙලා පිහිටනවා. කොටින්ම කියනව නම් මනුස්ස ලෝකෙ හිටිය විදියටම ඒ රූප ස්වභාවයෙන් ඉන්නවා. ඒ අය තමයි සමහර විට හොල්මන් කියල පෙනුනයි කියන්නෙ. ''මැරිච්ච අහවලා හිටපු විදියටම ඇඳුමකින් ඇවිත් පෙනී හිටියනෙ, සරමයි කමිසයයි ඇඳල ආවෙ, එක පාරටම ඇවිත් ගියා ....'' මේ ආදී වශයෙන් කියන්නෙත් ඒ වගේ අවස්ථාවලට. ඥාති ප්‍රේත කියන්නෙ ඒ අයට. ඒකත් චතුජ කයේ සූක්ෂම අවස්ථාවක්. මේ චතුජ සූක්ෂම කයත් ඒ ඒ අමනුස්සයින්ගෙ / ගන්ධබ්බයින්ගෙ හැකියාවන් අනුව ලොකු කුඩා කරන්න, හකුලන්න, ඝනීභවනය කරන්න පුළුවන්. එහෙම වුනාම ඒක චිත්තයේ පාලනයට අයිති වෙනවා. ඒ කියන්නෙ චිත්තජ කය තමයි එතකොට ප්‍රධාන වෙන්නෙ.

උදාහරණ විදියට අපි පුංචි උමගකින් වගේ තැනකින් රිංගන කොට ශරීරය ඒ අවස්ථාවට ගැලපෙන විදියට උන්ඩි කර ගන්නවා. ඒ වගේ මේ **ගන්ධබ්බයින් මවු ගැබකට යනකොටත් අවශ්‍ය ප්‍රමාණයට කුඩා වෙලා තමයි ඔක්කන්ති වෙන්නෙ. (ගැබට ඇතුළු වෙන්නෙ.) එහෙම ඇතුල්වෙලා තමයි යුක්තානුව අල්ල ගන්නෙ.** මොකද ඒ අවස්ථාවෙදි චතුජ කය සූක්ෂම නිසා එහෙම කුඩා කරන්න පුළුවන්. කර්ම, චිත්ත කියන දෙකේ පාලනය එතනදි ප්‍රධාන වෙනවා. ඒ නිසා ඒක දකින්නෙ අංශු මාත්‍රයට ගිහින්. ඒ කියන්නෙ හිත, ගැබ ඇතුලට යන කොට ගත පුංචි වුණාට හිත ලොකුයි. පුංචි තැනකට ගියා කියල හිත පුංචි වෙන්නෙ නෑ. හැබැයි එතන තියෙන ඉඩ ප්‍රමාණයට අනුව ගත අකුල ගන්න පුළුවන්. එහෙම අකුළල උණ්ඩි වෙලා තමයි ගැබට ඇතුල් වෙන්නෙ.

හැබැයි ගන්ධබ්බයෙක් **මවු ගැබකට ඔක්කන්ති වෙන කොට කර්ම ශක්තිය ප්‍රධාන වෙන නිසා ඒ වෙලාවට හිතා මතා ගැබට ඇතුල් වෙන්න පුළුවන්කමක් නෑ. ඒ නිසා කය කුඩා වෙලා උන්ඩි කරගෙන ගැබට ඇතුල් වෙනවයි කිව්වට ඒක සිද්ධ වෙන්නෙ කර්ම ශක්තිය මුල් වෙලා. හැබැයි හිතා මතාම ගැබට ඇතුල් වෙන්න පුළුවන් අයත් බොහොම කලාතුරකින් ඉන්නවා.**

උදාහරණ විදියට මහ බෝසතාණන් වහන්සේ නමක් අධිෂ්ඨාන කරල දූන ගෙනමයි මවු ගැබට ඇතුල් වෙන්නෙ. ඒ වගේ විශේෂ අවස්ථාවල හැර අනෙක් අය කර්ම ශක්තියේ ප්‍රවාහයට අහු වෙලා උන්ඩිවෙලා තමයි ගැබට ඇදිල යන්නෙ. එහෙම ගිහින් යුක්තානුවට සම්බන්ධ වුනාම, අවශ්‍ය නම් නවීන විද්‍යාවේ බල මහිමයෙන් ඒකෙ සෛලයක් අරගෙන පරීක්ෂා කළොත්, තරුණ වයසට ආවම මෙන්න මෙහෙම කෙනෙක් උපදින්නෙ කියල ඒ උපදින කෙනාගෙ බාහිර හැඩරුව කියන්නත් පුළුවන්.

ඒ වගේම මෙතනදි ගන්ධබ්බයට කර්ම ශක්තියෙන්ම භෞතික ආහාර නිර්මාණය වෙනවා. එහෙම නැත්නම් උතුජ ආහාර සම්බන්ධ වෙලා ඒක භුක්ති විඳිනවා. එතකොට ඒක තමයි සූක්ෂම කබලිංකාර ආහාරය වෙන්නෙ. ඒකෙන් තමයි චතුජ සූක්ෂම කය හැදෙන්නෙ. ඒ වගේම ගඳ සුවඳ කියන්නෙත් සූක්ෂම කබලිංකාර ආහාරයක්. කර්ම ශක්තියෙන් ඒ කබලිංකාර ආහාර ළං කරල සම්බන්ධ කරල දෙනවා. එහෙම නැත්නම් පේන්න සලස්වනවා. එතකොට ඇදල ගන්නවා. මේ ක්‍රමවලින් මොන විදියට හරි ගන්ධබ්බයට ආහාර ලැබෙනවා. එතකොට උතුජ ආහාරයෙන් හෙවත් සූක්ෂම කබලිංකාර ආහාරවලින් ශරීරය හැදෙනවා.

ඒ වගේම මේ ලෝකෙට ඉස්සෙල්ලම බ්‍රහ්ම කල්පික මනුස්සයො එන කොටත් මේ සූක්ෂම චතුජ කයෙන් තමයි එන්නෙ. එහෙම ඇවිත් තමයි කිරි යොදයක් වගේ තියෙන රස පොළව කියන භූමි පටලය ස්පර්ශ කරල රස බලන්නෙ. ඊට පස්සෙ ඒක රහ වැටිල දිගටම ආහාර විදියට ගන්න කොට අර සූක්ෂම කය

ක්‍රමයෙන් ඝනීභවනය වෙනවා. ඒ තමයි චතුජ කයේ ඝනීභවන අවස්ථාව. ඒ විදියට තමයි මුලින්ම ආපු සූක්ෂම කය ක්‍රමයෙන් ඝනීභවන වෙලා ස්ත්‍රී පුරුෂ විදියට එකතු වෙලා දරුවො වශයෙන් මස් ලේ කයකින් (කරජ කයකින්) බිහි වෙන්න පටන් ගත්තෙ.

එතකොට දැන් මේ තියෙන මස් ලේ කයත්, ආහාරජ කයත් චතුජයි. චතුජ කය ආහාරයෙන් ඝනීභවන මට්ටමට පත් වුණාම කරජ කාය වෙනවා. එතකොට තමයි ඒක මස් ලේ කයක් බවට පත් වෙන්නෙ. එහෙම නැත්නම් චතුජ කයේ සූක්ෂම අවස්ථාවට එන කොට දෙවියන්ට තියෙන්නෙත් ආහාරජ කයක්. ඒ කියන්නෙ ආහාරයෙන් ජීවත් වන දෙවියන්ට තියෙන්නෙත් චතුජ කයක්. හැබැයි ඒ ආහාරය ගඳ සුවඳ මට්ටමේ සියුම් අවස්ථාවක්. නමුත් බ්‍රහ්මයින්ගෙ කයට එහෙම ආහාරයක් නෑ. චිත්තජ කය නිසා ඒක ත්‍රිජ කයක්. ඒක දේව කයටත් වඩා සූක්ෂම නිසා දෙවියන්ටවත් බ්‍රහ්මයො පේන්නෙ නෑ. ඒ තරම් සූක්ෂමයි. අධිෂ්ඨාන කරල චිත්තජ කය ඝනීභවන කළොත් තමයි පේන්නෙ. නමුත් ස්වභාවික තත්වයෙදි බ්‍රහ්ම කය දෙවියන්ටවත් පේන්නෙ නෑ.

ඒ වගේම ඇස්ට්‍රල් බොඩි හෙවත් මනෝ කාය කියල අද හඳුන්වන අවස්ථාවත් සූක්ෂම ආහාරයෙන් යැපෙන කයක්. ඒ කියන්නෙ ගඳ සුවඳ වගේ දෙයක් ආහාර වශයෙන් උරාගෙන ඒකෙන් තමයි ඒ කය පවත්වන්නෙ. ඒකත් චතුජ කයේම සූක්ෂම අවස්ථාවක්. නමුත් ඇස්ට්‍රල් බොඩි කියල නියම විදියට හඳුන්වන්නෙ කලින් සඳහන් කරපු ඒකජ කයේ මාත්‍රයයි, ද්විජ කයේ මාත්‍රයයි කියන අති සූක්ෂම අවස්ථාවක්. ඒක බුදු ඇසට විතරයි පේන්නෙ. එහෙම ගිහින් ත්‍රිජ කායෙනුත් පස්සෙ චතුජ අවස්ථාවට ඝනීභවනය වුනාම තමයි මිනිස් මස් ලේ ඇසට පේන කරජ කයක් හට ගන්නෙ. එහෙනම් චතුජ කය කියන්නෙ කර්මජ කය, චිත්තජ කය, උතුජ කය සහ ආහාරජ කය කියන මේ හතරෙම එකතුවක්. ඒ කියන්නෙ මේ චතුජ කය ඇතුලෙ ඒකජ, ද්විජ, ත්‍රිජ කියන අවස්ථා 3 ම තියෙනවා. මෙතනදි ආහාර කිව්වම ගඳ සුවඳ කියන්නෙත් ආහාරයක්. ඒ නිසා තමයි දෙවියන්ටයි, අමනුස්සයින්ටයි චතුජ සූක්ෂම කයක් තියෙනවයි කිව්වෙ. අමනුස්සයින්ගෙ මේ සූක්ෂම ආහාරය නිසා තමයි බැදුම්, පුළුටු වර්ග ආදියේ ගන්ධය උන්ට ආහාරයක් වෙලා ඒව ඇදල ගන්න පස්සෙන් එන්නෙ. එතකොට අමනුස්සයින්ගෙ බැල්ම වැටෙනවා. මනුස්සයින්ට සහ තිරිසනුන්ට තියෙන්නෙ ඝන ආහාරවලින් පෝෂණය වෙන චතුජ ඝනීභවන කයක්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

## නිවනට වදන්

**මට පහර දුන්නත්, බැණ වැදුනත්, නින්දා අපහාස කළත්, මගේ අගුණ කීවත්, මම ඒ අයට හිත රිදෙන දෙයක් නොකියමි, නොකරමි, අනුකම්පාවෙන් ඒ සැමගේ ද යහපත පතා කටයුතු කරමි යන මේ උතුම් අදහස ආර්ය උතුමන්ගේ චිත්ත ස්වභාවයයි. ආර්ය උතුමන් වීමට සියල්ලෝ උත්සාහ කරත්වා!**

**- වහරක අභයරතනාලංකාර හිමි -**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 30 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය -** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ චන්දිම පෙරේරා මහතා - පිටකෝට්ටේ ♦ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය -** ♦උපුල් දිසානායක මහතා ඇතුලු පවුලේ සැම - යෝක්, එංගලන්තය - රු. 15,197/- ♦සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම- කුරුණෑගල - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරුපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව -ගල්කිස්ස - රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු.5,000/- ♦ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම - නෙළුව- රු. 5,000/- ♦ සුහාෂ් රණසිංහ මහතා - වේයන්ගොඩ - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු.5,000/- ♦ සුහාෂ් රණසිංහ මහතා - මගලෙගොඩ - රු. 5,000/- ♦ පුෂ්පික ගයාන් ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා සහ ඉරෝෂානි ලොකුමාන්න මහත්මිය - ගල්කිස්ස - රු.5,000/- ♦ අමිල සල්ගාදු මහතා සහ කාන්ති ඒකනායක මහත්මිය - බෝමිරිය - රු. 4,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ නන්ද සුදුසිංහ මහතා ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ♦ සුජීවනී ජයවර්ධන මෙනවිය - පාදුක්ක - රු. 2500/- ♦ ස්වර්ණා සෝමරත්න මහත්මිය - දඹුටුව - රු. 2,000/- ♦ ඩබ්. උපුල් පරාක්‍රම ද සිල්වා මහතා - මාරවිල - රු. 2,000/- ♦ කේ.ඒ. රාජිකා සජීවනී කුමාරපේලි මහත්මිය - වැබඩ - රු. 2,000/- ♦ ජේ.ඒ. ලූෂාන්ත චම්පික ජයවර්ධන මහතා - මීරිගම - රු. 2,000/- ♦ දැඩිමුණි නිසල් කුමාර මහතා සහ නිවන්ති වීරතුංග මහත්මිය - මහරගම - රු.2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනවිය - ගාල්ල - රු.2,000/- ♦ මධුභානි කළුවැව මහත්මිය - මාලබේ - රු. 1,500/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඉන්ද්‍රානි විසාකා ජයසිංහ මහත්මිය- බොරලැස්ගමුව - රු. 1,000/- ♦ එච්.පී. විජේරත්න මහතා සහ එච්.කේ. තිලකලතා මහත්මිය - කිරුළපන - රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ නදීශා හර්ෂනී ලියනගේ මෙනවිය - කළුබෝවිල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ අනුරුද්ධ ඉද්දවෙල මහතා - කඩවත - රු. 1,000/- ♦ ශමීන් බණ්ඩාර මහතා - උඩුබැද්දෑව- රු. 1,000/- ♦ උපුල් සූරිය ආරච්චි මහතා - පානදුර - රු.1,000/- ♦ සී. එම්. පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ පුබුදු කමල් දසනායක මහතා සහ කණිෂ්කා නුවන්ජිනී මහත්මිය - හොරණ - රු. 1,000/- ♦ ඩී.එම්.යූ. දහනායක මහත්මිය - රඹුක්කන - රු.1,000/- ☞

♦ ශාන්ති පෙරේරා මහත්මිය - නාවල - රු. 1,000/- ♦ ටී.ඩී. විමලා රත්නසීලි මහත්මිය - පාදුක්ක - රු.1,000/- ♦ එන්.එච්. එස්.එස්. කරුණාරත්න මහතා - වේවැල්දෙනිය- රු. 1,000/- ♦ සුජාන් කරස්නාගොඩ මහතා - ගම්පහ - රු. 1,000/- ♦ තිලකා තිරිමාන්න මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ අනුර ශාන්ත මහතා - මූණගම - රු. 1,000/- ♦ දයානි බමුණුසිංහ මහත්මිය - යාගොඩ - රු. 1,000/- ♦ වසන්ත කුමාර ජයසේකර මහතා ඇතුළු පවුලේ සැම - නාරාහේන්පිට - රු. 1,000/- ♦ ගීතාංජනී ප්‍රේමලතා මහත්මිය - දංකොටුව - රු. 1,000/- ♦ ෂෙහාන් බස්නායක මහතා - මත්තෙගොඩ - රු. 1,000/- ♦ කේ.පී.එම්. සමන්තිලක මහතා - පාදුක්ක - රු. 1,000/- ♦ නිලන්ති සමරවීර මහත්මිය - ගම්පොළ - රු. 1,000/- ♦ සුමනා ජයතුංග මහත්මිය - පාදුක්ක - රු. 1,000/- ♦ නිරෝෂ් සපරමාදු මහතා - කොච්චිකඩේ - රු. 1,000/- ♦ ජයනාත් සුහසිංහ මහතා - මාකුඹුර - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු. 1,000/- ♦ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ♦ කේ.ඒ. උපාලි ජිනදාස මහතා - ගැටහැත්ත - රු. 1,000/- ♦ ආර්.පී. ගුණපාල මහතා - මාතර - රු. 1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, සුභාෂිනී දිසානායක මෙනවිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, ඩී.එම්. එල්. පුෂ්පකුමාර මහතා - වාරියපොල, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, අසෝක රන්ගොඩ මහතා - පන්නිපිටිය, අස්විනි දසනායක දියණිය ඇතුළු පවුලේ සැම - පිළියන්දල, තිලකා වෙරළුපිටිය මහත්මිය - නියඳගල, හේමාලි පිටිගල මහත්මිය - මතුගම, තවත් පින්වතෙක් - රු.8,350/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 141,547/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦අනෙකුත් වියදම් - 11,800/- ♦ සම්පූර්ණ වියදම - රු. 244,300/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිර පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුත්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අං:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල.
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. සමනල පොත්හල - නෙළුව.
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
12. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කෑගල්ල.
13. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (077 7577592)
14. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල)

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***

# අත්බැව්...



තිස් එක් තලයකි ලෝ සත උපදින
ඇස් නැත පින් පව් තේරෙන හැම තැන
දොස් නොදුටුවහොත් ඉන් දුගතියෙ වන
පස් විසි බිය එයි හැම කල පවතින

බළලුන් බල්ලන් නෙක තිරිසන් සත
කළ කම් ගෙන පෙර ඉපදුන උන් සිත
වල ලෙස විඳවා නොනිමි දුකින් යුත
මළ පසු යළි ඉපදෙයි පෙළෙමින් ගත

ඔසුපත් නරකය ලෝ දිය පැසවන
විසුවත් කිසි විට සුවයක් නැත දෙන
දෙසුවත් මිදුමට නොඇසෙන බුදු බණ
ගැසුවත් නොමැරෙත කරුමෙට සැදි පණ

මිනිසුන් විලසට ඉපදී මනු ලොව
කරමින් හර නැති වැඩ පසුපස දුව
දරමින් දස අකුසල් හද හද භව
එතෙකින් වැනසෙයි හරයක් නොමැතිව

දෙව් බඹමුත් කප් ගණනින් ගිය කල
හව්හරණක් නැතිවම ආයුස බල
ගෙවුනම චුත වී අත්බැව විට මළ
සිවු බිය යළි එත දුගතියටම මුල

ගඳබුන් විලසට ඇති නෙක අත් බැව්
විඳවත් හැමතින් කය මැරිලත් පව්
ඉඳමුත් අල්ලන්නට කුසයක් මව්
මඳකුත් රිසි ලෙස කුස නොලැබෙත් සෙව්

කකා බිබී කල් ගෙවමින් සුගති
යකා නටන විට ලකුණින් අගති
මකා නොදැමුවොත් තිරිසන් එ ගති
මොකා වුණත් යයි මරණින් දුගති


දුක් ගැන නොතකා දුසිරිත නානා
රක්නට වස්තුව රැවටිලි පානා
එක් කරගෙන ලොව බුදිනට සේනා
ඔක්කොම මළ විට අතහැර දානා

භවයක් හැර තව භවයක් තැනෙනා
කවයක් විලසට ගමනක් යනෙනා
දිව යත් නැත තව වෙහෙසක් දැනෙනා
සුවයක් වෙද අස් වැසුමක් ගෙනෙනා

සිත් දහසින් මැරී මැරී උපදින සත
එත් අත නොහරී සැප විඳිනට සිත
සත් දහමේ හඬ වැකුනොත් සවනත
අත්බැව නිවනට මිස දුගතිය නැත

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# සිත... කය... වචනය






සිත කය වදන යන
මෙතුනින් කරන වැඩ ගැන
විමසුම් වුවොත් දැන
මගක් වෙයි මතු දා නිවන් දෙන


සිත හැමට මුල් වී
කය වචනය වහල් වී
ලොව බදන ලොල් වී
කරන පව් එල දෙවයි නිල් වී

අපමණ සසර දුර
මෙතෙක් පොදි බැඳ ආ බර
මුල් වී මෙ තුන් දොර
එයින්මයි දෙන්නේ නිවන් පුර

දන්නෝ බුදුන් ගැන
දම් කඳ දකී මැනවින
එයින් ලොව දැන ගෙන
මිදෙයි මේ තුන් පොළින් දුක් දෙන

හොඳ නරක දෙකටම
මේ තුන ගෙන කරන පෙම
මුල් වී මෙ සසරෙම
නිවෙයි නැත්නම් දැවෙයි එතැනම


තම වෙත අනුන් වෙත
අවැඩක් වෙනම් දත යුත
මේ තුන් පොළින් තිත
තබනු එවිටදී කෙරෙයි යහපත


මෙතුන් දොර පානා
තිස් එක් තලේ නානා
සතුන් ඇත පේනා
නිවන් යන්නත් මෙ තුන ඕනා



හැම කරුමයක මුල
සිතකට ඇත අරුම බල
වඩොත් සිත පව තුළ
විඳින්නට දුක ලැබෙත් කප් කෙළ

පිළි සමුපව මෙ තුන
සත උපදවයි තැන තැන
නිරෝධය කළ මන
යළිදු උපතක් නොදෙයි මතු දින



මෙ කරුණු සිතට ගෙන
දමනය කර මෙ තුන් තැන
සසරෙහි බියම දැන
නිවන ලැබ ගනු දුකින් මුදවන



පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන